ලේකම් / செயலாளர் / Secretary
දුරකථනය / தொலைபேசி / Telephone 2449959
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2445447
E-Mail: secretary@moj.gov.lk
ප්‍රධාන කාර්යාලය / பொது அலுவலகம் / General Office
දුරකථනය / தொலைபேசி / Telephone 2323022
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2320785
Web Site: www.moj.gov.lk

# අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
# நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு
# Ministry of Justice, Prison Affairs and Constitutional Reforms

තැ.පෙ. / தபால்பெட்டி / P.O. Box. 555
ඉලෙක්ට්‍රොනික තැපැල / மின்அஞ்சல் / E-mail info@moj.gov.
නො 19, ශ්‍රී සංඝරාජ මාවත කොළඹ 10
இல 19, ஸ்ரீ சங்கராஜ மாவத்த கொழும்பு 10
No 19, Sri Sangaraja Mw Colombo 10

මගේ අංකය / எனது இல. / My No. MOJ/E14/RTI/15/2022
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2023.03.20

සමාජීය සහ සාමයික කේන්ද්‍රය
අංක 281.ඩින්ස් පාර
කොළඹ 10

<u>අභියාචනා විභාගය RTIC/Appeal/1132/2022</u>

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට අනුව ඔබ විසින් සිදු කරන ලද 2022.06.24 දිනැති ඉල්ලීම හා බැඳේ.

02. මගේ සමාංක හා 2023.02.23 දිනැති ලිපියේ දන්වා ඇති පරිදි,ඔබේ තොරතුරු ඉල්ලීමෙහි අංක 1 යටතේ විමසා ඇති ඒක පුද්ගල කමිටු වාර්තාවේ පිටපතක් ලබා දීම සම්බන්ධයෙන් ගරු නීතිපතිතුමාගේ උපදෙස් ලැබී ඇති අතර ඒ අනුව එම ඒක පුද්ගල කමිටු වාර්තාවේ පිටපතක් මේ සමඟ කාරුණිකව ඔබ වෙත යොමු කරමි.

තොරතුරු නිලධාරී
එම්.එම් අලිෆ්
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන)
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

දුරකථනය : 0112 331535
ෆැක්ස් : 0112 320785
විද්‍යුත් ලිපිනය : sasadmin1@moj.gov.lk

පිටපත -
01. අධ්‍යක්ෂ ජනරාල්,තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව- ඔබේ අංක RTIC/Appeal/1132/2022 හා 2023.02.13 දිනැති ලිපිය අනුව කරු.දැ.ගැ.ස

# හිටපු බන්ධනාගාර කළමනාකරණ සහ සිරකරුවන් පුනරුත්ථාපනය කිරීමේ රාජ්‍ය අමාත්‍යවරයාගේ වැලිකඩ සහ අනුරාධපුර බන්ධනාගාරයන්හි සංචාරය කිරීමේ සිද්ධීන් සම්බන්ධව විමර්ශනය කිරීම සඳහා පිහිට වූ

## ඒක පුද්ගල විමර්ශන කමිටුවේ වාර්තාව

**2021.11.24**

පිළි ගැන්වීම

ගරු අධිකරණ අමාත්‍ය

ජනාධිපති නීතිඥ එම්.යූ.එම්.අලි සබ්රි මැතිතුමාට

ප්‍රවේශය


1) පසුබිම 01

2) සංයුතිය 03

3) ඒකපුද්ගල විමර්ශන කමිටුවේ වාර්තාව 04

4) රාජ්‍ය අමාත්‍යවරයාගේ වැලිකඩ බන්ධනාගාර සංචාරය සම්බන්ධව
   i) කමිටු නිරීක්ෂණ 24
   ii) නිර්දේශ 30

5) රාජ්‍ය අමාත්‍යවරයාගේ අනුරාධපුර බන්ධනාගාර සංචාරය සම්බන්ධව
   i) කමිටු නිරීක්ෂණ 31
   ii) නිර්දේශ 44

6) තොරතුරු රැස් කළ ක්‍රමවේදය 48

7) රාජ්‍ය අමාත්‍යවරයාගේ වැලිකඩ බන්ධනාගාර සංචාරයට අදාලව අනාවරණය වූ තොරතුරු 60
   a) පැමිණි සහ පිට වූ වේලාව 61
   b) සංචාරය සඳහා සහභාගී වූ පිරිස 75
   c) ශ්‍රී ලංකා ජනරජය නියෝජනය කළ අන්දම 80
   d) බන්ධනාගාරය තුළ සිදු කර තිබූ ක්‍රියාකාරකම් 85

8) රාජ්‍ය අමාත්‍යවරයාගේ අනුරාධපුර බන්ධනාගාර සංචාරයට අදාලව අනාවරණය වූ තොරතුරු 91
   a) පැමිණි සහ පිට වූ වේලාව 92
   b) ශ්‍රී ලංකා ජනරජය නියෝජනය කළ අන්දම 96
   c) බන්ධනාගාරය තුළ සිදු කර තිබූ ක්‍රියාකාරකම් 97
   d) පීඩාවකට ලක් වුවා යැයි පවසන රැඳවියන් විසින් සිද්ධියට අදාළව පැමිණිල්ලක් ඉදිරිපත් කර නොතිබීම 137
   e) රැඳවියන්ගේ චෝදනාවන්ට අදාලව හිටපු රාජ්‍ය අමාත්‍යවරයා දැක්වූ කරුණු 140

## 1. පසුබිම

2021 සැප්තැම්බර් මස 06 වන දිනයේදීත්, 2021 සැප්තැම්බර් මස 12 වන දිනයේදීත් එවකට හිටපු බන්ධනාගාර කළමනාකරණ සහ සිරකරුවන් පුනරුත්ථාපනය කිරීමේ රාජ්‍ය අමාත්‍ය ලොහාන් එඩ්වින් රත්වත්ත මහතා විසින් පිළිවෙළින් වැලිකඩ බන්ධනාගාරයත්, අනුරාධපුර බන්ධනාගාරයත් නිරීක්ෂණය කිරීම සඳහා සංචාරය කොට තිබුණි.

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූලව ප්‍රකාශයට පත් කළ 2020 අගෝස්තු 09 දිනැති අංක: 2187/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 5.1 ඡේදයෙහි, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ සහ පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යවරයාගේ කාර්යයන් සහ කර්තව්‍යයන් ලෙසට, අධිකරණ අමාත්‍යවරයාගේ උපදෙස් සහ මග පෙන්වීම මත කටයුතු කරමින්, නීතියේ ආධිපත්‍ය ආරක්ෂා කිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීමත්, ජාතික අයවැය සම්පාදනය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩ පිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත් සහ වෙනත් කරුණු අතර බන්ධනාගාරය තුළ අපරාධකරුවන් අධීක්ෂණය සඳහා නූතන තාක්ෂණික ක්‍රමවේදයන් ස්ථාපිත කිරීමටත්, සිරකරුවන්ගේ තදබදය අඩු කිරීම සඳහා පොදු සමාව දීමේ ප්‍රතිපත්තිමය ක්‍රියාවලියට අමතරව සමාලෝචන ක්‍රමවේදයක් හරහා විශේෂ සමාව ප්‍රදානය කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීමත්, සිරකරුවන් පුනරුත්ථාපනය සඳහා පුළුල් ක්‍රමවේදයක් සකස් කිරීමත්, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සේවක පරිපාලන ගැටළු කඩිනමින් විසඳීමත් සඳහන් වී ඇත.

එහෙයින්, 2020 දෙසැම්බර් මස 02 වන දින, ලොහාන් රත්වත්ත මහතාව බන්ධනාගාර කළමණාකරණ සහ පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යවරයා ලෙසට කටයුතු කිරීම සඳහා ගරු ජනාධිපති තුමා විසින් පත් කොට තිබූ හෙයින්, බන්ධනාගාරයන් අධීක්ෂණයට කිරීමටත්, සිරකරුවන්ට පොදු සමාව දීමේ ප්‍රතිපත්තිමය ක්‍රියාවලියට අමතරව සමාලෝචන ක්‍රමවේදයක් හරහා විශේෂ සමාව ප්‍රදානය කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීමටත්, සිරකරුවන් පුනරුත්ථාපනය කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීමටත්, බන්ධනාගාර නිලධාරීන් මුහුණ ගැසී ඔවුන්ගේ ගැටළු සොයා බැලීමටත් සම්පූර්ණ වගකීම සහ බලතල ඉහත කී කාල වකවානුවේදී ලැබී තිබුණි.

කෙසේ වුව ද, මෙකී හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් 2021 සැප්තැම්බර් මස 06 වන දින වැලිකඩ බන්ධනාගාරයටත්, සැප්තැම්බර් මස 12 වන දින අනුරාධපුර බන්ධනාගාරයටත් සිදු කර තිබූ සංචාරයන්, දැඩි දෝෂ දර්ශනයන්ට සහ විවේචනයන්ට ලක් කිරීමක් ඇතැම් පුද්ගලයන් විසින් පසු අවස්ථාවකදි සිදු කර තිබුණි. ඒ අනුව සත්‍ය වශයෙන් ම සිදු වී තිබුනේ කුමක්දැයි යන්න සොයා බලා නිරීක්ෂණ සහ නිර්දේශ අඩංගු සවිස්තරාත්මක වාර්තාවක් දින 60ක් තුළ ශ්‍රී ලංකා ජනරජයට ඉදිරිපත් කිරීම සඳහා කැබිනට් මණ්ඩල අමාත්‍යවරුන්ගේ අභිමතය පරිදි ඒක පුද්ගල කමිටුවක් පත් කිරීමට තීරණය කරන්නට යෙදුනි. ඒ අනුව, එකී ඒක පුද්ගල කමිටුවට ගරු අධිකරණ අමාත්‍ය, ජනාධිපති නීතිඥ එම්.යූ.එම්.අලි සබ්රි මැතිතුමා විසින් 2021 සැප්තැම්බර් 23 වන දිනැති ලිපිය මගින් මා පත් කරන ලදි.

## 2. සංයුතිය

විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු සරෝජිනී කුසලා වීරවර්ධන මැතිනිය නියෝජනය කරනු ලබන ඒක පුද්ගල විමර්ශන කමිටුවකි.

එහි ලසුලේඛිකාව ලෙසට විශ්‍රාමලත් අධිකරණ ලසුලේඛිකා (අධි ශ්‍රේණිය) අයිරාංගනී විජේරත්න මෙනෙවියත්, සිංහල දෙමළ භාෂණ පරිවර්තක ලෙස හිටපු අධිකරණ භාෂණ පරිවර්ථක සුප්පයියා කමල් මහතාත් ක්‍රියා කරන ලද අතර, අධිකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (නීති) චන්දිමා වැලිකල මහත්මිය සම්බන්ධීකරණ නිලධාරිනිය ලෙසට කටයුතු කරන ලදී.

## 3. ඒකපුද්ගල පරීක්ෂණ කමිටුවේ වාර්තාව

2020 දෙසැම්බර් මස 02 වන දින, ලොහාන් රත්වත්ත මහතාව බන්ධනාගාර කළමණාකරණ සහ පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යවරයා ලෙසට කටයුතු කිරීම සඳහා ගරු ජනාධිපති තුමා විසින් පත් කොට තිබුනි. එහෙයින්, බන්ධනාගාරයන් අධීක්ෂණයට කිරීමටත්, සිරකරුවන්ට පොදු සමාව දීමේ ප්‍රතිපත්තිමය ක්‍රියාවලියට අමතරව සමාලෝචන ක්‍රමවේදයක් හරහා විශේෂ සමාව ප්‍රදානය කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීමටත්, සිරකරුවන් පුනරුත්ථාපනය කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීමටත්, බන්ධනාගාර නිලධාරීන් මුණ ගැසී ඔවුන්ගේ ගැටළු සොයා බැලීමටත් එතුමාට එම ධූරයෙහි රාජකාරී කළ කාල වකවානුව තුළ සම්පූර්ණ වගකීම සහ බලතල ලැබී තිබුණි.

කෙසේ වුව ද, මෙකී හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් 2021 සැප්තැම්බර් මස 06 වන දින වැලිකඩ බන්ධනාගාරයටත්, සැප්තැම්බර් මස 12 වන දින අනුරාධපුර බන්ධනාගාරයටත් සිදු කර තිබූ සංචාරයන්, දැඩි දෝෂ දර්ශනයන්ට සහ විවේචනයන්ට ලක් කිරීමක් ඇතැම් පුද්ගලයන් විසින් පසු අවස්ථාවකදී සිදු කර තිබුණි.

ඒ අනුව, කැබිනට් මණ්ඩල අමාත්‍යවරුන්ගේ අභිමතය පරිදි ඒක පුද්ගල කමිටුවක් පත් කිරීමට ගත් තීරණයකට අනුව, සත්‍ය වශයෙන් ම සිදු වී තිබුණේ කුමක්දැයි යන්න සොයා බලා නිරීක්ෂණ සහ නිර්දේශ අඩංගු විස්තරාත්මක වාර්තාවක් දින 60ක් තුළ ශ්‍රී ලංකා ජනරජයට ඉදිරිපත් කිරීම සඳහා, ගරු අධිකරණ අමාත්‍ය, ජනාධිපති නීතිඥ එම්.යූ.එම්.අලි සබ්රි මැතිතුමා විසින් 2021 සැප්තැම්බර් 23 වන දිනැති ලිපිය මගින්, එකී ඒක පුද්ගල කමිටුවට මා පත් කරන ලදී.

ගරු අධිකරණ අමාත්‍යවරයාගේ ඉහත කී ලිපිය මගින්, ස්වාධීන නිරීක්ෂකවරයෙක් ලෙසට කටයුතු කරමින් බන්ධනාගාර පරිශ්‍රයන් පරීක්ෂා කිරීමටත්, අදාළ පුද්ගලයන්ගෙන් කරුණු විමසා අවශ්‍ය සාක්ෂි සටහන් කර ගැනීමටත්, චෝදනා කරනු ලබන සිද්ධිය සම්බන්ධව පවතින තොරතුරු ලබා ගැනීමටත් මෙකී ඒක පුද්ගල කමිටුවට බලය ලබා දී තිබුනද, අදාළ තොරතුරු රැස් කර කමිටු වාර්තාව ලබා දීම සඳහා මෙම කමිටුවට ලබා දී තිබුනේ මාස 2ක් වැනි කෙටි කාලයකි. එහෙයින්, සිද්ධිය නිරීක්ෂණය කර තිබූ සියළු ම නිලධාරීන්ගෙන් සහ රැඳවියන්ගෙන් සාක්ෂි ලබා ගැනීම සඳහා කාලය ප්‍රමාණවත් නොවිය.

තවද, වැලිකඩ සහ අනුරාධපුර බන්ධනාගාරයන් තුළ සී.සී.ටී.වී කැමරා සවි කර නොතිබුනි. එහෙයින්, ලිඛිත සහ වාචික සාක්ෂි මත පමණක් පදනම්ව තොරතුරු රැස් කිරීමට සිදු විය.

කෙසේ වුවද, සැබැවින් ම සිදු වූයේ කුමක්දැයි සොයා බලා, නිවැරදි නිරීක්ෂණයන්ට එළඹීමට ප්‍රමාණවත් වන පරිදි ඒ ඒ ස්ථානවල රාජකාරි කළ බන්ධනාගාර නිලධාරීන් ගෙන් ද, බන්ධනාගාරවල එළිමහනේ ගැවසුණු මෙන් ම සිර මැදිරිවල ද රඳවා සිටි රැඳවියන් බොහෝ දෙනෙකුගේ ද වාචික සාක්ෂි ලබා ගනිමින් තොරතුරු රැස් කරන ලදි. මෙකී කෙටි කාලය තුළ ලබා ගත් සියළුම වාචික සාක්ෂි සංඛ්‍යාව 40 කි. මේ හැරෙන්නට, ලොහාන් එවීන්ද්‍ර රත්වත්ත මහතා ලබා දුන් සාක්ෂියද සටහන් කරන ලදී.

තවද, වැලිකඩ සහ අනුරාධපුර බන්ධනාගාරවල පවත්වා ගෙන යන පොත්පත්වල , ඒ ඒ අදාළ දිනයන්හි ලිඛිත සටහන් යොදා තිබූ ලේඛනයන් සියල්ල ම නිරීක්ෂණය කොට, එහි සත්‍ය පිටපත් ලබා ගන්නා ලදී. එසේම, එකී රාජ්‍ය අමාත්‍යවරයා සංචාරය කරන ලද ස්ථානයන් නිරීක්ෂණය කොට, එහි දළ සැලැස්මවල් ලිඛිත සාක්ෂි වශයෙන් ලබා ගත්තෙමි.

- **හිටපු රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්ත මහතාගේ වැලිකඩ සහ අනුරාධපුර බන්ධනාගාරයන්හි සංචාරය සිදු කළ වේලාවන් සහ රජය නියෝජනය කළ අන්දම සම්බන්ධව වූ කරුණු :-**

හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් වැලිකඩ බන්ධනාගාරයෙහි සිදු කළ සංචාරය සම්බන්ධව, මෙම කමිටුව විසින් රැස් කළ තොරතුරුවලට අනුව, 2021.09.06 වන දින සවස 5.30 ට පමණ බන්ධනාගාරයට ඇතුළු වී, ඔහු ප්‍රථමයෙන් ම වැපල් වාට්ටුවෙහි එල්ලුම් ගස තිබූ කාමරය නිරීක්ෂණය කිරීමට ගොස් තිබූ බවටත්, එම කාමරයට යන එන අතරතුර දී, දෙපස රඳවා සිටි සිරකරුවන් සමග කථා කර තිබූ බවටත්, අනතුරුව දුරකථන කුටි පිහිටි ස්ථානයට ගොස් එතන ද මඳ වේලාවක් රැඳී සිට බන්ධනාගාර අධිකාරිවරයාගේ කාර්යාලයට ද ගොස්, එහි ද සුළු වේලාවක් ගත කර, එදින සවස 6.15ට පමණ පිටව ගොස් තිබූ බවටත් තොරතුරු අනාවරණය විය.

අනුරාධපුර බන්ධනාගාරයෙහි සිදු කළ සංචාරය සම්බන්ධව රැස් කළ තොරතුරු වලට අනුව, 2021.09.12 වන දින සවස 5.45 ට පමණ අනුරාධපුර බන්ධනාගාරයට ඇතුළු වී, ප්‍රථමයෙන්ම, 'F' වාට්ටුවේ රඳවා සිටි විශේෂ ගණයේ රැඳවියන් 18 දෙනාගෙන්, ත්‍රස්තවාදී පණත යටතේ රඳවා සිටි රැඳවියන් 10 දෙනෙකුව 'F' වාට්ටුව අසළ වූ මිදුලට කැඳවා කථා බස් කිරීමෙන් අනතුරුව, 'F' වාට්ටුව ඇතුළට ද ගොස් එහි සිටි රැඳවියන් කිහිප දෙනෙකු සමග කථා කර, එළියට පැමිණ මඳ වේලාවක් රැඳී සිට, [illegible]කාර බන්ධනාගාර අධිකාරිවරයාගේ කාර්යාලයට ද ගොස් එහි ද සුළු වේලාවක් ගත කර ආපසු සවස 7.00ට පමණ පිටව ගොස් තිබූ බවට මෙම කමිටුවට තොරතුරු අනාවරණය විය.

[illegible] පනත්වලින් සංශෝධිත 1877 අංක: 16 දරන බන්ධනාගාර පනතේ [illegible] වගන්තියට අනුව, යම් බන්ධනාගාරයක් සහ රැඳවියන්ගේ සාමාන්‍ය

තත්ත්වය සොයා බැලීමට සංචාරය කිරීම සෙනෙට් සභිකයෙකුට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට, දිසා විනිසුරුවරයෙකුට හෝ මහෙස්ත්‍රාත්වරයෙකුට උදෑසන 5.30ත් සවස 5.30ත් අතරතුර කාලයේ දී සිදු කල හැක.

මේ අනුව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ සහ පුනරුත්ථාපන අමාත්‍යවරයා වශයෙන් ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් ද, 2021.09.06 වන දින බන්ධනාගාරයන් නිරීක්ෂණය කිරීමට සම්පූර්ණ බලතල, වගකීම සහ යුතුකම රැඳී පැවතුන ද, 2021.09.06 වන දින වැලිකඩ බන්ධනාගාරයටත් 2021.09.12 වන දින අනුරාධපුර බන්ධනාගාරයටත් සිදු කර තිබූ සංචාරයන්, සම්පූර්ණයෙන්ම නීතියෙන් ඔහු වෙත පැවරී තිබූ සියළු බලතල ඉක්මවමින් සහ ඉහත කී පනතේ 39(2) උප වගන්තිය උල්ලංඝනය කරමින් සිදු කර තිබූ බවට නිරීක්ෂණය කරමි.

මේ හැරෙන්නට, 2021.09.06 වන දින වැලිකඩ බන්ධනාගාරය තුළට හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් සිවිල් පුද්ගලයින් දෙදෙනෙක් හෝ තිදෙනෙක් රැගෙන විත් තිබූ බවට සාක්ෂි මගින් තොරතුරු අනාවරණය වූ මුත්, මෙකී පුද්ගලයින් දෙදෙනා බන්ධනාගාරය තුළට රැගෙන ආවේ කුමන පදනමක් මත ද යන්න පැහැදිලි කිරීමට හිටපු රාජ්‍ය අමාත්‍යවරයා අපොහොසත් වුනි.

ඉහත කී බන්ධනාගාර ආඥා පනතේ 35 වන වගන්තියේ සිට 39 වන වගන්තිය දක්වා වූ වගන්තීන්වලට අනුව බන්ධනාගාර නිරීක්ෂණය කළ හැක්කේ, අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද ගැසට් පත්‍රයක සඳහන් කර ඇති අයවළුන්ට පමණී. එසේම, ඉහත කී පනතේ 36(3) උප වගන්තියට අනුව බන්ධනාගාර කාර්ය මණ්ඩලයේ රාජකාරි ඉටු කිරීමේ දී විනය සහ මනා පරිපාලනය පවත්වා ගෙන යාම සඳහා බන්ධනාගාර ආඥා පනතේ විධිවිධානවලට අනුව කටයුතු කරමින් සහාය ලබා දීමට සෑම නිලධාරියෙක් ම බැඳී සිටී.

තව ද, පනතේ මෙකී 39(2) වන වගන්තිය අනුව අමුත්තන්ගේ පොතේ සෙනෙට් සභිකයන් මෙන් ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් තම නිරීක්ෂණ සහ නිර්දේශයන් ඇතුළත් කළ යුතුය.

ඉහත වගන්තීන් සළකා බලන කළ දී බන්ධනාගාරයට ඇතුළු වන අමුත්තන් වුව ද, බන්ධනාගාරය තුළ පවත්වා ගෙන යනු ලබන විනයට ගරු කරමින් එය ආරක්ෂා වන ලෙසට හැසිරීම ඉතා වැදගත් වන බවට පැහැදිලි වෙයි.

බන්ධනාගාරය භාරව සිටින රාජ්‍ය අමාත්‍යවරයා විසින් තම සිතැඟි පරිදි, පැවරී ඇති බලය අභිබවමින් කටයුතු කිරීම කිසිසේත් අනුමත කළ හැකි ක්‍රියාවක් නොවන බවට මෙන්ම, එය පහළ නිලධාරීන්ට ද වැදගත් ආදර්ශයක් නොවන බවටත්, රාජ්‍ය අමාත්‍යවරයා නියෝජනය කරන රජය සැහැල්ලුවට ලක්වීමක් වන බවටත් නිරීක්ෂණය කරමි.

මේ හැරෙන්නට, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා වැලිකඩ බන්ධනාගාරය නිරීක්ෂණය කිරීම සඳහා කොට කලිසමකින් සහ ටී ෂර්ට් එකකින් සැරසී, [illegible]යට සෙරෙප්පු දෙකක් දමා ගෙන පැමිණ තිබූ බවට තොරතුරු අනාවරණය විය.

[illegible]මණක්ද නොව, අනුරාධපුර බන්ධනාගාරයට පැමිණ තිබුනේ, ඩෙනිම් [illegible]සමකින් සහ අත් දිග ජර්සියක් වැනි කමිසයකින් ද, දෙපයට සෙරෙප්පු [illegible]ක්ද දමාගෙන පමණක් නොව, තම නියෝගය මත ‘F’ වාට්ටුවෙහි [illegible]ගෙන්වා ගෙන තිබූ ‘F’ වාට්ටුවෙහි රඳවා සිටි විශේෂ ගණයේ සිර සහ [illegible] දස දෙනාට, සිය ඉණේ බැඳ තිබූ පටියක රඳවා ගනිමින් [illegible] පිස්තෝලයක් වැනි ගිනි අවියක් ද දිස්වෙන ලෙසට තබාගෙන, [illegible]යකු ලෙසින් හැසිරෙමින් සිටි බවටද කරුණු අණාවරනය විය.

[illegible] බන්ධනාගාරය නිරීක්ෂණය කිරීමට ගොස් තිබුනේ [illegible] වශයෙන් නොව, ශ්‍රී ලංකා ජනරජය නියෝජනය [illegible] පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ කළමනාකරණ

රාජ්‍ය අමාත්‍යවරයා වශයෙන් බවට පැහැදිලි වෙයි. ඒ අනුව ශ්‍රී ලංකා ජනරජය හෑල්ලුවට ලක් නොවන ලෙසට ක්‍රියා කිරීමේ සම්පූර්ණ වගකීම හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට තිබූ බවට නිරික්ෂණය කරමි.

බන්ධනාගාරයක සැකකරුවන් සහ සිරකරුවන් රඳවා සිටියත්, ඔවුන්ව පහත් කොට සහ/හෝ සුළු කොට සළකමින් ඔවුන් ඉදිරියෙහි කෙබඳු ආකාරයකින් පෙනී සිටියත් කම් නැතැයි සිතීම ප්‍රභූවරයෙකුට/රජය නියෝජනය කරන උසස් නිලධාරියෙකුට කිසිසේත් සුදුසු නැත. තවද, 'බන්ධනාගාරය' නිසි විනයක් සහිතව පවත්වා ගෙන යනු ලබන ආයතනයකි. එහි සේවය කරන සියළු ම නිලධාරීන් නිල ඇඳුමකින් සැරසී සිටිය යුතු අතර, අසිහියෙන් බීමත්ව සිටින පුද්ගලයෙකු ලෙස කටයුතු නොකළ යුතුය.

තවද, බන්ධනාගාරයක් තුළදී ගිනි අවියක් පාවිච්චි කළ හැක්කේ විවිධ පනත්වලින් සංශෝධිත 1877 අංක: 16 දරන බන්ධනාගාර පනතේ 79(1) සිට 79(5) වන වගන්තීන් හි දැක්වෙන ප්‍රකාර ව පමණි. කිසිදු නීති විරෝධි ක්‍රියාවක් නොකරන රැඳවියෙකුට එරෙහිව ගිනි අවියක් පාවිච්චි කළ නොහැක.

මේ අනුව, බන්ධනාගාර ඉහළ නිලධාරීන්ගෙන් පවා ගරු බුහුමන් ලබන [illegible] අමාත්‍යවරයෙකු වශයෙන්, බන්ධනාගාරය තුලට යාමේදී, සුදුසු [illegible] සැරසී යාමටද, සිහියෙන් කටයුතු කිරීමටද, බන්ධනාගාරය තුළට [illegible] කිසිවක් රැගෙන යාමෙන් වැළකීමට ද, වගකීමක් හිටපු රාජ්‍ය [illegible] තිබිණ. එසේම, බන්ධනාගාරය තුළ දී හිටපු රාජ්‍ය [illegible] බන්ධනාගාර නිලධාරීන් මෙන් ම රැඳවියන් ද ගෞරවය [illegible] ලොහාන් රත්වත්ත' යන නමට නොව, ඔහුගේ තනතුරටය. මේ [illegible] අගෞරවයක් නොවන පරිදි හැසිරීමේ වගකීම ද හිටපු රාජ්‍ය [illegible]

ඉහත සියළු කරුණු සළකා බැලීමේ දී, ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා 2021.09.06 වන දින වැලිකඩ බන්ධනාගාරයටත්, 2021.09.12 වන දින අනුරාධපුර බන්ධනාගාරයටත්, ගොස් තිබුනේ 'රාජ්‍ය අමාත්‍ය' යන තනතුරටත් ශ්‍රී ලංකා ජනරජයෙහි අභිමානයටත්, කැළලක් වන අයුරින් සහ/හෝ හාස්‍යයට ලක් වන අයුරින් වන බවටත් පෙනී යන හෙයින්, එකී සංචාර වලදී, ' ශ්‍රී ලංකා ජනරජයේත්', 'රාජ්‍ය අමාත්‍ය තනතුරේත්' ගෞරවය පළුදු වී ඇති බවට නිරීක්ෂණය කරමි.

තවද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට අනුව 2021.09.06 වන දින වැලිකඩ බන්ධනාගාරය නිරීක්ෂණය කිරීම සඳහා ගොස් තිබුනේ,

(i) වැපල් අංශයෙහි පිහිටි පෝරකය නිරීක්ෂණය කිරීමටත්

(ii) සිව් අවුරුදු සමාලෝචනය සම්බන්ධව ඉල්ලීමක් සිදු කර තිබූ හෙයින් මරණ දඬුවම නියම වූ අයගේ ප්‍රශ්න දැන ගැනීමටත් වෙයි.

වැපල් අංශයෙහි A1, A2, A3, B1, B2, B3 සහ C1, C2, C3 වශයෙන් වූ ගොඩනැගිලි තුනෙහි සිරකරුවන් 800ක් පමණද, සී.3 අංශයෙහිම සිර මැදිරිවල රැඳවියන් 70-80ක් පමණ ද වූ පිරිසක් රඳවා සිටියත්, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා කථා බහ කර තිබුනේ වැපල් අංශයෙහි C3 විශේෂ අංශයෙහි පිහිටි එල්ලුම් ගස කරා යන එන අතරතුරදී හමුවූ, දෙපස කාමර තුල සිටි සිරකරුවන් 10ක්, 20ක් අතර ප්‍රමාණයක පමණි. ඔවුන් සමගද ගත කර තිබූ වේලාව ද විනාඩි 10ක් 15ක් පමණි. මෙම සිරකරුවන්ට අමතරව කථා කර ඇත්තේ තවත් එක් සිරකරුවෙකු සමගින් පමණි. ඒ දුරකථන කුටි අසළ සිටි සිරකරු සමගින්ය. මුළු සංචාරයෙන් ම මෙසේ සිරකරුවන් සමගින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සාකච්ඡා කොට එළඹ ඇති එකම නිගමනය වී තිබුනේ, කුරා කුඹින්ට පවා අවශ්‍ය වන 'නිදහස' සිරකරුවන්ට ද අවශ්‍ය වන බවට පමණි. එම නිගමනයට පැමිණීම සඳහා සංචාරයක් අවශ්‍ය නැත. එය සාමාන්‍ය දැනීමකි.

නමුදු, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් කිසිදු සිරකරුවෙකුගේ විස්තරයක් සහ/හෝ වාර්තාවක් මෙම සංචාරයේදී ඉල්ලා නැත. කථා කිරීම පමණක් සිදු කර ඇත. කිසියම් සිරකරුවන් පිරිසකට සිව් වස් සමාලෝචනය වෙනුවෙන් හෝ වෙනත් යම් අභිවෘද්ධියක් සැලසීමට ගොස් තිබුණා යැයි නිරීක්ෂණය නොවේ.

එසේම, පෝරකය නිරීක්ෂණය කිරීමට ගොස් තිබුනද, ඒ සඳහා කිසිදු විශේෂ හේතුවක් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට තිබී නැත. හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් මෙසේ වැඩි වේලාවක් ගත කර තිබුනේ, මීට මාස 5කටත් පෙර නිරීක්ෂණය කර තිබූ , කිසිදු ප්‍රශ්නයක් හෝ ගැටළුවක් විසඳීමට නොතිබූ එල්ලුම් ගස අසල බවට ද කරුණු අනාවරණය විය.

සියළු කරුණු සළකා බැලීමේදී, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා වැලිකඩ බන්ධනාගාරයට 2021.09.06 වන දින ගොස් තිබුනේ, රැගෙන ගියේ මන්දැයි යන්නද පැහැදිලි කිරීමක් කළ නොහැකි වූ, සිවිල් ඇඳුමෙන් සැරසුණු ආගන්තුක පුද්ගලයින් දෙදෙනාට එල්ලුම් ගස පෙන්වීම සඳහා යැයි සාධාරණව නිරීක්ෂණය කළ හැක.

I. ඉහත සියළු කරුණු මත, හිටපු බන්ධනාගාර, පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්ත මහතා 'ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්', 'බන්ධනාගාර ප්‍රතිසංස්කරණ සහ පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍ය ධූරයටත්' පවතින ගෞරවය සහ අභිමානය පළුදු වන පරිදි ක්‍රියා කර ඇති හෙයින් ද,

II. අවේලාවේ බන්ධනාගාරයට ඇතුළු වූ හිටපු රාජ්‍ය අමාත්‍යවරයා, 1977 අංක: 16 දරන බන්ධනාගාර ආඥා පනතේ 35 සිට 39 දක්වා වූ

වගන්තින් යටතට නොගැනෙන සිවිල් ඇඳුමෙන් සැරසුණු පුද්ගලයින් දෙදෙනෙක් හෝ තිදෙනෙක් ද කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව අනවසරයෙන් බන්ධනාගාරය තුලට රැගෙන ගොස් තිබූ බවට අනාවරණය වන මුත්, එකී වගන්තීන් උල්ලංඝනය කරන යම් තැනැත්තෙකුට ලබා දිය හැකි දඬුවමක් පනතේ නොදැක්වෙන හෙයින් ද,

❖ හිටපු බන්ධනාගාර, පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්ත මහතාට, එම අමාත්‍ය ධූරය පිරිනමා තිබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති තුමා විසින් 'වරදෙහි ස්වභාවය' සළකා බලා කිනම් පියවරක් ගත යුතු ද යන්න තීරණය කිරීම වඩාත් උචිත බවට නිර්දේශ කරමි.

- **හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ නියමය මත අනුරාධපුර බන්ධනාගාර 'F' වාට්ටුව අසළ වූ මිදුලට කැඳවා තිබූ රැඳවියන් දස දෙනා සමඟ වූ හමුවීම :-**

බන්ධනාගාරයට ඇතුළු වන ප්‍රධාන ලෑලි දොරටුව අසළ දී ප්‍රධාන ජේලර්වරයා විසින් සැමට ම ඇසෙන සේ "ගිනි අවි සහ දුරකථන ඇත්නම් ඒවා එළියේ තබා පැමිණෙන ලෙසට" දුන් දැනුම් දීමක් මත හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සමග පැමිණි ආරක්ෂක නිලධාරීන් ගිනි අවි සහ දුරකථන වාහනයේ දමා පැමිණ තිබුණ ද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා එසේ කර නොතිබුනි. හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට තිබූ ගෞරවය මත හිටපු රාජ්‍ය අමාත්‍යවරයාව බන්ධනාගාර නිලධාරීන් විසින් පරීක්ෂා කිරීමක්ද සිදු කර නොතිබුනි. එසේම, ගිනි අවි, පුපුරන ද්‍රව්‍ය, මත් ද්‍රව්‍ය වැනි භාණ්ඩ බන්ධනාගාරය තුළට රැගෙන යන්නේ ද යන්න සොයා බැලීම සඳහා

පුද්ගලයින් ඇවිද යන ස්කෑන් යන්ත්‍රයක් (Walk Through Scanner) නොතිබූ හෙයින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට පහසුවෙන් සිය ගිනි අවිය රැගෙන යාමට හැකියාව ලැබී තිබුනි.

හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ ඉල්ලීම පිට, 'F' වාට්ටුව අසළ වූ මිදුලට රැඳවියන් 10 දෙනෙකුව ඉදිරිපත් කර තිබුණේ, ඔවුනට පවතින නඩු සම්බන්ධව ගැටළු ඇත්නම් ඒවා හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට ඉදිරිපත් කිරීමටත්, ගරු ජනාධිපතිවරයාට ඒ සම්බන්ධව පවසා නඩු කටයුතු ඉක්මණින් අවසන් කර දීමට කටයුතු කිරීමටත්ය. ඒ බවට ප්‍රථමයෙන් ම රැඳවියන්ව දැනුවත් කිරීමක් ද සිදු කර තිබුනි.

එසේ වුව ද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් එක් එක් රැඳවියන්ගෙන් ඔවුන්ගේ නඩු ගැන පමණක් නොව, ඔවුන් විසින් සිදු කර තිබූ වරද කුමක්දැයි යන්න මෙන් ම සිංහල මිනිස්සු මරා ඇද්දැයි විමසමින් " ඇත්ත කියන්න, ඇත්ත කියන්න" යයි දන්වා වරද කියා පෑමට බල කිරීමක් සිදු කර තිබූ බවට අණාවරණය වුනි.

තවද, ඉහත කී රැඳවියන්ව මුණ ගැසුණු අවස්ථාවේ දී හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ ඉණේ රඳවා තිබූ ගිනි අවිය දිස්වීමට ද සලස්වා තිබූ බවට අණාවරණය වුනි.

එසේම, අඩ කවයක ආකාරයෙන් සිට ගෙන සිටි රැඳවියන් අතරින් පළමුවෙන් ම සිට ගෙන සිටි සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිදු කරන ලදැයි දක්වා සිටින වරදක් සඳහා වවුනියාව මහෙස්ත්‍රාත් අධිකරණ අංක: B.13/19 දරන නඩුව යටතේ රඳවා ඇති පූබාලසිංහම් සූරියබාලන් නැමැත්තාගෙන්, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් "අපේ කට්ටිය කී දෙනෙකුට වෙඩි තිබ්බා දැයි" විමසමින්, එබන්දක් සිදු නොකළ බවටත්, සැක පිට අත් අඩංගුවට ගෙන ඇති බවටත් පැවසූ අවස්ථාවේ දී, ඔහු විසින්

"බොරු කියනවා" යැයි දැනුම් දී, බොරළු, වැලි, පොඩි ගල් කැට මිශ්‍රිත රළු පොළව මත දණ ගැසීමට නියම කර ඇත.

ඉන් අනතුරුව අඩ කවයෙහි නව වෙනියට සිටි 'මදිඅරසන් සුලක්ෂන්' නැමැති රැඳවියා වෙත ද ගොස්, එල්.ටී.ටී.ඊ එකේ සිටියාදැයි යන්න මෙන් ම, "ඇත්ත කිව්වොත් සමාව දෙනවා" යැයි කියමින් ඊට, "එල්.ටී.ටී.ඊ.එකේ සිටියා, වවුනියා මහාධිකරණයේ නඩු පවරා තිබෙනවා" යැයි පැවසූ විට දී, "සිංහල මිනිස්සු මැරුවා ද", යන්න ද අසා ඊට " නැහැ" යැයි කී අවස්ථාවේ දී "බොරු කියන්නේ" යැයි දන්වමින් ඉහත කී සූරියබාලන් නැමැත්තා දණ ගසා සිටි ස්ථානය අසළින් දණ ගැසීමට නියම කරමින්, සුලක්ෂන් නැමැත්තා ව ද බිම දණ ගස්වා ඇත.

මෙසේ , F" වාට්ටුවේ සිට එළියට රැගෙන ගිය රැඳවියන් 'F' වාට්ටුවේ අසළ මිදුලෙහි පැය ½කට වැඩි කාලයක් රැඳී සිටි බවට සහ 'සූරියබාලන්' සහ 'සුලක්ෂන්' යන දෙදෙනා ද එම කාලයට ආසන්න කාලයක් ඉහත කී රළු පොළවේ හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සිදු කළ ක්‍රියාවන් මගින් බියට පත් වී, අකැමැත්තෙන් එම ස්ථානයේ ම රැඳෙමින් දණ ගසා ගෙන සිටි බවට තොරතුරු අනාවරණය වෙයි.

තවද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා 'F' වාට්ටුවට ගොස් ආපසු එළියට පැමිණි පසුව, මිදුලේ සිටි රැඳවියන් නැවතත් මුණ ගැසී ඔවුන් සියළු දෙනාට ම දණ ගැසීමට දැන්වීමෙන් පසුව, නැවත වරක් 'සුලක්ෂන්' සහ 'සූරියබාලන්' දණ ගසා සිටි ස්ථානය අසළට ගොස් සූරියබාලන් යන අයට "ඇත්ත කියන්න" යැයි පවසමින් ඊට සූරියබාලන් විසින් "ඇත්ත තමයි කියන්නේ, කසාද බැඳලා දරුවෙකුත් ඉන්නවා, යාළුවෙකුට උදව් කළා" යැයි පැවසූ විට දී, "බොරු කියන්නේ" යැයි හිටපු රාජ්‍ය අමාත්‍යවරයා දන්වමින්, ඔහුගේ ඉණෙහි තිබූ පිස්තෝලය අතට ගෙන එය රැඳවියන්ට පෙනෙන සේ ලෝඩ් කර, අනතුරුව එම ගිනි අවියේ බටය මෙකී රැඳවියන් දෙදෙනාගේ හිස

දෙසට එල්ල වන කරමින්, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ එක් ඇඟිල්ලක් ඉහත කී ගිනි අවියේ කොකාට තබා, වෙඩි තැබීමට තැත් දරා තිබුනි.

මෙම අවස්ථාවේ දී අනුරාධපුර බන්ධනාගාර සහකාර අධිකාරිවරයා විසින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ පිස්තෝලය තිබූ අත නොව, අනෙක් අත අල්ලා ඉහත ක්‍රියාව නතර කර ඇත.

ඉන් නොනැවතුන හිටපු රාජ්‍ය අමාත්‍යවරයා, 'සූරියබාලන්' සිටි ස්ථානයෙන් නැගිට්ටුවා, ඒ ආසන්නයේ ම වෙනත් ස්ථානයකට රැගෙන යාමට සලස්වා, එම ස්ථානයටද ගොස් සූරියබාලන්ව දණ ගස්වා, සහ මුහුණු ආවරණය ද ගැලවීමට දන්වා, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ මුහුණු ආවරණය ද ගලවා, සූරියබාලන්ට අඩි 2ක් පමණ දුරින් සිට ගෙන, නැවත වරක් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ සන්තකයේ තිබූ ගිනි අවිය රැගෙන සූරියබාලන්ගේ හිසට එල්ල කරමින් "ඇත්ත කියන්න" යැයි කියා බය කර ඇත. ඉන් බියට පත් වූ සූරියබාලන් නැමැත්තා හඬමින් අත් දෙකින් වැඳ ගෙන ඔහුට විවාහ වී දරු පවුලක් සිටින බවට පැවසුව පසුව එතැනින් ඉවත් වී ගොස් ඇත.

මෙම සංචාරයේදී, නඩු කටයුතු කඩිනම් කිරීමට ගත යුතු පියවර සහ/හෝ වෙනත් කිසිදු සුභසාධන කටයුත්තක හිටපු රාජ්‍ය අමාත්‍යවරයා නියැලී නොතිබුනි.

හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට මුණ ගැස්වීම සඳහා 'F' වාට්ටුවේ සිට එළියට රැගෙන ගිය රැඳවියන්, හිංසනයන්ට සහ පීඩාවන්ට ලක්ව තිබූ බවට රැඳවියන් විසින් අනුරාධපුර සහකාර බන්ධනාගාර අධිකාරිවරයාටත්, ප්‍රධාන ජේලර්වරයාටත් පැමිණිල්ලක් ඉදිරිපත් නොකලද, එම නිලධාරින් ඒ ආසන්නයේ ගැවසී ඇත. තවද, රැඳවියන් නැවතත් 'F' වාට්ටුව තුළට ගිය අවස්ථාවේ දී ම, ඔවුන් සිදු කර තිබූ කථාබහ මගින් 'F' වාට්ටුව භාරව, රාත්‍රී රාජකාරියේ යෙදී සිටි බන්ධනාගාර නියාමක හේමපාලගේ ප්‍රියන්ත

කුමාර දිසානායකට ද රැඳවියන් මුහුණ දුන් සිද්ධිය කියනු ඇසී ඇත. දැන ගැනීමට ද ලැබී ඇත. එනමුත්, ඔහු ද ඊට අදාළව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුනි.

ඉහත කී රැඳවියන් සමගින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සිටි කාලය තුළ දී අනුරාධපුර සහකාර බන්ධනාගාර අධිකාරිවරයාත්, ප්‍රධාන ජේලර්වරයාත්, තවත් ජේලර්වරුන් තිදෙනෙකුත් ඒ ආසන්නයේ ගැවසී තිබුනද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සතුව ගිනි අවියක් තිබූ බවට සහ/හෝ ඊට අදාළව කිසිදු සාක්ෂියක් ලබා දී නැත.

එනමුත්, කිසිදු බන්ධනාගාර නිලධාරියෙකු හෝ රැඳවියෙකු විසින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සතුව ගිනි අවියක් නොතිබූ බවට සහ/හෝ, 'සුලක්ෂන්' සහ 'සූරියබාලන්' දණ ගසා සිටි ස්ථානය අසළට ගොස්, 'වරද කියා පැමක්' සිදු කිරීමට බල කරමින්, ඔවුන්ගේ හිසට ගිනි අවියක් එල්ල කරමින් , වෙඩි තැබීමට තැත් කිරීමක් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා කෙසේවත් සිදු නොකල බවට සහ/හෝ එය,සිදු විය නොහැක්කක් බවට හෝ පවසා නැත. ඒ අනුව , එම සිද්ධීන් ප්‍රබන්ධයක් ලෙසට සලකා බැලිය නොහැක.

මේ අනුව, ඉහත කී රැඳවියන් සමගින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සිටි කාලය තුළ දී ඒ ආසන්නයේ ගැවසී තිබූ අනුරාධපුර සහකාර බන්ධනාගාර අධිකාරිවරයාත්, ප්‍රධාන ජේලර්වරයාත්, ඇතුළුව අනිකුත් නිලධාරීන් බියට පත් වීම සහ/හෝ බලපෑම්වලට ලක් වීම සහ/හෝ ඔවුන් පවසන පරිදි ඔවුන්ට දර්ශනය කිරීමට නොහැකි වූ පරිදි රැඳී සිටීම නිසා , හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සතුව ගිනි අවියක් තිබූ බවට සහ/හෝ ඊට අදාළව කිසිදු සාක්ෂියක් ලබා දී නොමැති බවට නිරීක්ෂණය කරමි.

'F' වාට්ටුවේ සිටි රැඳවියන් 10 දෙනෙකුව හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ ඉල්ලීම පිට හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට ඉදිරිපත් කර තිබූ අවස්ථාවේ දී හිටපු රාජ්‍ය අමාත්‍යවරයා,

ගරු ජනාධිපති තුමාට පවසා නඩු කටයුතු අවසන් කිරීමට ක්‍රියා කරන බවට දැනුවත් කර තිබූ බවත්,

ii. හිටපු රාජ්‍ය අමාත්‍යවරයා බීමත්ව සිටි පුද්ගලයෙකු මෙන් රැඳවියන් ඉදිරියෙහි හැසිරුණු බවටත්,

iii. ඔහු සන්තකයේ තිබූ ගිනි අවිය රැඳවියන්ට පෙනෙන ලෙසට ඉණෙහි රඳවා ගෙන තිබුණු බවටත්,

iv. රැඳවියන්ට වරද කියා පෑමක් සිදු කිරීමට බල කරමින් ඔවුන් ඉදිරියෙහි එම ගිනි අවිය රඳවා ගෙන තිබූ බවත්,

v. රළු පොළවෙහි පැය ½කට වැඩි කාලයක් සූරියබාලන් සහ සුලක්ෂන් යන දෙදෙනාගේ අකැමැත්තෙන් දණ ගසා සිටීමට සැලැස්වූ බවටත්,

vi. අනතුරුව දණ ගසා සිටි රැඳවියන් දෙදෙනාගේ හිසට වෙඩි තැබීමට තැත් කළ බවත්,

vii. රැඳවියන් බියට, ශාරීරික සහ/හෝ මානසික පීඩනයන්ට ලක්ව තිබූ බවටත්,

මෙම කමිටුව ඉදිරියේ පවතින තොරතුරු, "ඒකාකාරී භාවයෙහි පරීක්ෂණයෙන් ද, "විය හැකි භාවයේ පරීක්ෂණයෙන්" ද, "අප්‍රමාදී භාවයේ පරීක්ෂණයෙන්" ද සමත් වෙයි. එහෙයින් එකී සියළු ම කරුණු, විශ්වාස කළ හැකි සත්‍යයක් බවත්, ඒවා රැඳවියන් විසින් ගෙතූ ප්‍රබන්ධයක් නොවන බවටත් තීරණය කල හැකි බවට නිරීක්ෂණය කරමි.

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ සහ පුනරුත්ථාපන හිටපු රාජ්‍ය අමාත්‍යවරයාත්, අනුරාධපුර බන්ධනාගාරයෙහි 'F' වාට්ටුවේ රැඳී සිටි මෙකී රාජ්‍ය අමාත්‍යවරයාට ඉදිරිපත් කර තිබූ රැඳවියන් 10 දෙනාත් අතර, 2021.09.12 වන දින සිදුව තිබූ හමු වීමේ දී සිදු වූ සිද්ධීන් වලට අදාළව, මෙම කමිටුව වෙත ඉදිරිපත් වූ වාචික සහ ලිඛිත සාක්ෂි මගින් ලද තොරතුරු විශ්ලේෂණය කිරීමේ දී, එකී හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට

එරෙහිව පහත දැක්වෙන චෝදනා නැගිය හැකි බවට නිරීක්ෂණය කළ හැකි විය.

1. ශ්‍රී ලංකා ජනරජයේ රාජ්‍ය අමාත්‍යවරයෙකු ලෙසට රජය නියෝජනය කරමින් පැමිණ ශ්‍රී ලංකා ජනරජයේ ගරු ජනාධිපති තුමාට දන්වා රැඳවියන්ගේ නඩු කටයුතු අවසන් කරන බවට දැනුම් දෙමින් සහ/හෝ දැන ගැනීමට සලස්වමින් ගරු ජනාධිපති තුමාට අවමන් වන ලෙසට සහ/හෝ රාජකීය මහිමය කෙළෙසෙන ලෙසට හැසිරෙමින්

   (i). රැඳවියන්ව නිදහස් කිරීමට හෝ ඝාතනය කිරීමට හැකි බවට දන්වමින්,

   (ii). රැඳවියන් දෙදෙනෙකුව බිම දණ ගස්වා ගිනි අවියක් හිසට එල්ල කරමින් වෙඩි තබා ඝාතනය කිරීමට තැත් කිරීම මත විවිධ පනත් සහ 1996 අංක: 22 දරන පනත මගින් සංශෝධිත 1916 අංක: 33 (182 අධිකාරය) තුවක්කු ආඥා පනතේ 44 (අ) උප වගන්තිය සමග කියැවෙන දණ්ඩ නීති සංග්‍රහයේ 118 වන වගන්තිය යටතේ දඬුවම් කල හැකි වරදක් සිදු කර ඇති බවට චෝදනා නැගිය හැකි බව.

2. තව ද, ඉහත (i) සිට (vii) දක්වා වූ නිරීක්ෂණයන්හි දක්වා ඇති අන්දමට හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ක්‍රියා කර තිබුණේ රජය නියෝජනය කරමින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වරදක් සිදු කරන ලදැයි දක්වමින් අධිකරණ නියෝගයක් මත රඳවා සිටි ද්‍රවිඩ ජාතිකයින් පිරිසකට වූ හෙයින් ද, මෙම ක්‍රියාව මගින් එකී රැඳවියන් දැඩි හිංසනයකටත්, බියකටත්, පීඩාවකටත් ලක්ව තිබූ හෙයින් ද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ ක්‍රියාව ශ්‍රී ලංකාණ්ඩුවට ද්‍රවිඩ ජාතිකයින් විරුද්ධත්වය දැක්වීමේ හැඟීම් ඇවිස්සීමට හෝ ඇවිස්සීමට තැත් කිරීමට ගරු ජනාධිපති තුමාගේ වැසියන් පංති අතර

වෛරී හෝ සතුරු හැඟීම්, අසමගි හැඟීම් වැඩි දියුණු කිරීමට තැත් කිරීම යටතේ, විවිධ පනත් සහ 1996 අංක: 22 දරන පනත මගින් සංශෝධිත 1916 අංක: 33 (182 අධිකාරය) තුවක්කු ආඥා පනතේ 44 (අ) උප වගන්තිය සමග කියැවෙන දණ්ඩ නීති සංග්‍රහයේ 120 වන වගන්තිය යටතේ දඬුවම් කල හැකි වරදක් සිදු කර ඇති බවට චෝදනා නැගිය හැකි බව.

3. හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් ඔහු සතුව තිබූ ගිනි අවිය ලෝඩ් කර, ඔහුගේ එක් ඇඟිල්ලක් එකී ගිනි අවියෙහි කොකා වෙත තබමින්, "ඇත්ත කියන්න" යැයි තර්ජනය කරමින්, අනුරාධපුර බන්ධනාගාර සැක අංක: 140 - මදිඅරසන් සුලක්ෂන් සහ සැක අංක: 363 - පූබාලසිංහම් සූරියබාලන් යන දෙදෙනාගේ හිසට ගිනි අවිය එල්ල කර තිබූ බවත්, එම ක්‍රියාව නතර කර ඇත්තේ අනුරාධපුර සහකාර බන්ධනාගාර අධිකාරිවරයා විසින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ අත ඇල්ලීම නිසා බවටත් තොරතුරු අනාවරණය වන හෙයින්, විවිධ පනත් සහ 1996 අංක: 22 දරන පනත මගින් සංශෝධිත 1916 අංක: 33 (182 අධිකාරය) තුවක්කු ආඥා පනතේ 44 (අ) උප වගන්තිය සමග කියැවෙන දණ්ඩ නීති සංග්‍රහයේ 300 වන වගන්තිය යටතේ 'මිනිමැරීමට තැත් කිරීමේ' වරදට දඬුවම් කල හැකි වරදක් සිදු කර ඇති බවට චෝදනා නැගිය හැකි බව.

4. සුලක්ෂන් නැමැත්තාව පැය ½කට ආසන්න කාලයක් බොරළු, වැලි, කුඩා ගල් මිශ්‍රිත පොළවක් මත දණ ගැස්වීමට සලස්වා ස්වේච්ඡාවෙන් සුළු තුවාල සිදු කිරීම මත දණ්ඩ නීති සංග්‍රහයේ 314 වන වගන්තිය යටතේ දඬුවම් කල හැකි වරදක් සිදු කර ඇති බවට චෝදනා නැගිය බවටත්,

5. සූරියබාලන් නැමැත්තාව පැය ½කට ආසන්න කාලයක් බොරළු, වැලි සහ ගල් සහිත රළු පොළව මත දණ ගසා සිටීමට සලස්වා

ස්වේච්ඡාවෙන් තුවාල සිදුකිරීමේ වරදට දණ්ඩ නීති සංග්‍රහයේ 315 වන වගන්තිය යටතේ දඬුවම් කල හැකි වරදක් සිදු කර ඇති බවට චෝදනා නැගිය හැකි බවටත්

6. තැති ගැන්වීමක් ඇති කරවන අදහසින් හෝ නීත්‍යානුකූලව බැඳී නැති ක්‍රියාවක් වූ වරද කියා පෑමක් සිදු කිරීමට බල කිරීමෙන් ඉහත කී සුලක්ෂන් සහ සූරියබාලන් යන දෙදෙනාගේ හිස්වලට ගිනි අවියක් එල්ල කර මරණ බවට තර්ජනය කිරීම මත ඉහත කී 1996 අංක: 22 දරන පනත මගින් සංශෝධිත 1916 අංක: 33 (182 අධිකාරය) තුවක්කු ආඥා පනතේ 44 (ආ) උප වගන්තිය සමග කියැවෙන දණ්ඩ නීති සංග්‍රහයේ 486 වන වගන්තිය යටතේ සාපරාධි භය ගැන්විමේ වරදට දඬුවම් කල හැකි වරදක් සිදු කර ඇති බවටත් චෝදනා නැගිය හැකි බවටත්

වෙයි.

තවද, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා ජනරජයේ නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද, නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුතුය. එසේ ම 11 වන ව්‍යවස්ථාවට අනුව කිසිම තැනැත්තෙකු වධහිංසාවලට කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතුය.

තව ද, 13 (2) ව්‍යවස්ථාවට අනුව නීතියෙන් නියම කරනු ලබන කාර්ය පටිපාටිවලට අනුකූලව රඳවා තිබෙන හෝ පෞද්ගලික නිදහස අහිමි නොකළ යුතු අතර, 13(5) ව්‍යවස්ථාවට අනුව 'වරදකරු' යැයි ඔප්පු කරනු ලබන තෙක් සෑම පුද්ගලයෙකු ම නිර්දෝශි පුද්ගලයෙකු යැයි පූර්ව අනුමාන කළ යුතුය.

I. මේ අනුව බන්ධනාගාර පුනරුත්ථාපන, ප්‍රතිසංස්කරණ හිටපු රාජ්‍ය

අමාත්‍යවරයාට එරෙහිව අපරාධමය චෝදනාවන් එල්ල කිරීමට ප්‍රමාණවත් වූ තොරතුරු නිරීක්ෂණය වන හෙයින් ද,

II. නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද, නීතියේ රැකවරණයද සෑම පුද්ගලයෙකුටම සර්ව සාධාරණ විය යුතුව ඇති හෙයින් ද,

III. හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට මුණගැස්වීම සඳහා 'F' වාට්ටුව අසලවූ මිදුලට ඉදිරිපත් කර තිබූ රැඳවියන් අතරින් එක් රැඳවියෙකු හැරෙන්නට, අනෙකුත් සියළුම රැඳවියන්, ත්‍රස්ථවාදී පණත යටතේ වූ චෝදනාවක් සඳහා වරදකරු බවට තීන්දු ප්‍රකාශයක් නිසි බලය ඇති අධිකරණයකින් ඒ දක්වා ප්‍රකාශ කොට නොතිබූ අයවළුන් වූ හෙයින්, ඔවුන් එම පණත යටතේ වූ චෝදනාවන්ට 'නිර්දෝෂී' පුද්ගලයන් ලෙසට සැළකිය යුතුව ඇති බැවින් ද,

IV. හිටපු රාජ්‍ය අමාත්‍යවරයා රාජකාරිමය කටයුත්තක් ඉටු කිරීමේ අයුරින් අනුරාධපුර බන්ධනාගාරයට ගොස් තිබූ බැවින් ඔහු වෙත 'F' වාට්ටුවේ සිටි රැඳවියන් ඉදිරිපත් කර තිබුණ ද, එකී රැඳවියන් සාපරාධී බියට පත්කිරීමට සහ/හෝ, වරද කියාපාන ලෙසට බලහත්කාරකම් පෑමට සහ/හෝ, වධ හිංසා පීඩාවන්ට ලක් කරමින් නීත්‍යානුකූල නොවන අන්දමට රඳවා තැබීමට සහ /හෝ, මිනීමැරීමට තැත් කිරීමට හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට කිසිදු නීත්‍යානුකූල බලයක් නොතිබූ හෙයින් ද,

- අනුරාධපුර බන්ධනාගාරයෙහි, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ සහ පුනරුත්ථාපන හිටපු රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්ත මහතා සිදු කළ සංචාරය සම්බන්ධව ශ්‍රී ලංකා පොලිසිය මගින් මෙතෙක් සිදු කර ඇති පරීක්ෂණයන් පදනම් කර ගෙන, සටහන් කර ඇති සියළු ම ප්‍රකාශවල දැක්වෙන

වැදගත් කරුණු අඩංගු කරමින් සකසන ලද 'B' වාර්තාවක්, මෙතෙක් අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර නොමැති නම්, නොපමාවම ඉදිරිපත් කිරීමට පියවර ගැනීමටත්

❖ හිටපු රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්ත මහතා අනුරාධපුර බන්ධනාගාරයෙහි සිදු කළ සංචාරය සම්බන්ධව ශ්‍රී ලංකා පොලිසිය මගින් මෙතෙක් සිද්ධ කර ඇති පරීක්ෂණයන්හි ඉදිරි විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කර ඉදිරි පියවර ගත යුතු බවටත්,

❖ හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සිදු කරන ලදැයි දක්වා සිටින සියළුම වරදවල් සම්බන්ධව ඉතාමත් කෙටි කාලයකින් ශ්‍රී ලංකා පොලිසිය මගින් නිසි බලය ඇති අධිකරණයක චෝදනාවක් හෝ අධි චෝදනාවන් ඉදිරිපත් කිරීමට නොපමාව පියවර ගත යුතු බවටත්,

❖ 2021.09.12 වන දින සවස 5.45ත්, රාත්‍රී 7.00ත් අතර කාලය තුළ දී අනුරාධපුර බන්ධනාගාරයෙහි රාජකාරියේ යෙදී සිටි නිලධාරීන් පැමිණිල්ලේ වැදගත් ඇසූ දුටු සාක්ෂිකරුවන් වන බැවින් ද, මෙම සිද්ධියේ දී ඔවුන් විසින් නිරීක්ෂණය කළ සැබෑ තොරතුරු වසන් නොකර ලබා ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සැලසිය යුතු බවටත්,

❖ සියළු ම බන්ධනාගාරවල කඩිනමින් සී.සී.ටී.වී.කැමරා (C.C.T.V) පද්ධතියක් ස්ථාපනය කිරීමට පියවර ගත යුතු බවටත්,

- ❖ බන්ධනාගාරයට ඇතුල් වන සෑම පුද්ගලයෙකු ම රැගෙන යන දේපළ පරීක්ෂාවට ලක් කළ හැකි විශේෂ ස්කෑන් යන්ත්‍රයක් ප්‍රධාන ලෑලි දොරටුව අසළ සවි කර, බන්ධනාගාරයට ඇතුල් වන සෑම පුද්ගලයෙකු ම එම යන්ත්‍රය හරහා ගමන් කරවීමට සැලැස්විය යුතු බවටත්,

- ❖ බරපතල ගණයේ වරදක් සිදු කර ඇති බවට බරපතල චෝදනාවක් එල්ල කිරීමට හැකියාවක් ඇති බන්ධනාගාර ප්‍රතිසංස්කරණ සහ පුනරුත්ථාපනය හිටපු රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්ත මහතා සම්බන්ධයෙන් ගරු ජනාධිපති තුමාට සුදුසු යැයි හැඟෙන වෙනත් යම් ක්‍රියා මාර්ගයක් ඇත්නම් එය නොපමාව ම ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත්,

❖ මෙම කමිටුව විසින් නිරීක්ෂණය කොට නිර්දේශ කර, වාර්තා කරමි.

SK Kul

(සරෝජිනී කුසලා වීරවර්ධන)
විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු,
ඒකපුද්ගල විමර්ශන කමිටුව,
2021.11.24

## රාජ්‍ය අමාත්‍යවරයාගේ වැලිකඩ බන්ධනාගාර සංචාරය සම්බන්ධව

### කමිටු නිරීක්ෂණයන්

### පැමිණි සහ පිට වූ වේලාව

ඉදිරිපත් වූ සියළු සාක්ෂි අනුව හිටපු බන්ධනාගාර කළමනාකරණ හා ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්ත මහතා වැලිකඩ බන්ධනාගාරයට සංචාරය කිරීමට ගොස් තිබුනේ 2021.09.06 වන දින සවස 5.30ට පමණ ය. පිටව ගොස් තිබුනේ එදින සවස 6.15ට පමණය.

විවිධ පනත්වලින් සංශෝධිත 1877 අංක: 16 දරන බන්ධනාගාර පනතේ 39(2) වගන්තියට අනුව යම් බන්ධනාගාරයක් සහ රැඳවියන්ගේ සාමාන්‍ය තත්ත්වය සොයා බැලීමට සංචාරය කිරීම සෙනෙට් සභිකයෙකුට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට, දිසා විනිසුරුවරයෙකුට හෝ මහෙස්ත්‍රාත්වරයෙකුට උදෑසන 5.30ත් සවස 5.30ත් අතරතුර කාලයේ දී සිදු කල හැක. එසේ ම බන්ධනාගාරය පරීක්ෂා කිරීමේ දී සිදු කළ නිරීක්ෂණයන් සහ සුදුසු යැයි හැඟෙන නිර්දේශයන් අමුත්තන්ගේ ලේඛනයෙහි සඳහන් කිරීම ද කළ හැක.

මේ අනුව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ සහ පුනරුත්ථාපන අමාත්‍යවරයා වශයෙන් ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් ද, 2021.09.06 වන දින වැලිකඩ බන්ධනාගාරය නිරීක්ෂණය කිරීමට සම්පූර්ණ බලතල, වගකීම සහ යුතුකම රැඳී පැවතුන ද, 2021.09.06 වන දින වැලිකඩ බන්ධනාගාරයට සිදු කර තිබූ සංචාරය, සම්පූර්ණයෙන් ම නීතියෙන් ඔහු වෙත පැවරී තිබූ සියළු බලතල ඉක්මවමින් සහ ඉහත කී බන්ධනාගාර පනතේ 39(2) උප වගන්තිය උල්ලංඝනය කරමින් බවට නිරීක්ෂණය කරමි.

**සංචාරය සඳහා සහභාගි වූ පිරිස**

2021.09.06 වන දින වැලිකඩ බන්ධනාගාරය තුළට හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් සිවිල් පුද්ගලයින් දෙදෙනෙක් හෝ තිදෙනෙක් රැගෙන විත් තිබූ බවට සාක්ෂි මගින් තොරතුරු අනාවරණය වන මුත්, මෙකී පුද්ගලයින් දෙදෙනා බන්ධනාගාරය තුළට රැගෙන ආවේ කුමන පදනමක් මත ද යන්න පැහැදිලි කිරීමට හිටපු රාජ්‍ය අමාත්‍යවරයා අපොහොසත් වී ඇත.

ඉහත කී බන්ධනාගාර ආඥා පනතේ 35 වන වගන්තියේ සිට 39 වන වගන්තිය දක්වා වූ වගන්තින් වලට අනුව බන්ධනාගාර නිරීක්ෂණය කළ හැක්කේ, අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද ගැසට් පත්‍රයක සඳහන් කර ඇති,

(i) බන්ධනාගාර නිරීක්ෂක මණ්ඩලයේ සාමාජිකයින්ටත්,

(ii) දේශීය නිරීක්ෂක කොමිටියේ සාමාජිකයින්ටත්.

(iii) බන්ධනාගාරවලට පැමිණ බැලීම සඳහා පත් කර සිටින අතිරේක බන්ධනාගාර නිරීක්ෂකයින්ටත්,

(iv) ශ්‍රේෂ්ඨාධිකරණ, දිසා අධිකරණ, මහෙස්ත්‍රාත් අධිකරණ විනිසුරුවන්ටත්,

(v) සෙනෙට් සභිකයන්ට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් පමණි.

එසේ ම ඉහත කී පනතේ 36(3) උප වගන්තියට අනුව බන්ධනාගාර කාර්ය මණ්ඩලයේ රාජකාරි ඉටු කිරීමේ දී විනය සහ මනා පරිපාලනය පවත්වා ගෙන යාම සඳහා බන්ධනාගාර ආඥා පනතේ විධිවිධානවලට අනුව කටයුතු කරමින් සහාය ලබා දීමට සෑම අමුත්තෙක් ම බැඳී සිටී.

එම ද පනතේ මෙකී 39(2) වන වගන්තිය අනුව අමුත්තන්ගේ පොතේ සටහනට සහිකයන් මෙන් ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් තම නිරීක්ෂණ සහ නිර්දේශයන් ඇතුළත් කළ යුතුය.

ඉහත වගන්තීන් සළකා බලන කළ දී බන්ධනාගාරයට ඇතුළු වන අමුත්තන් වුව ද, බන්ධනාගාරය තුළ පවත්වා ගෙන යනු ලබන විනයට ගරු කරමින් එය ආරක්ෂා වන ලෙසට හැසිරීම ඉතා වැදගත් වන බවට පැහැදිලි වෙයි.

බන්ධනාගාරය භාරව සිටින රාජ්‍ය අමාත්‍යවරයා විසින් තම සිතැඟි පරිදි, පැවරී ඇති බලය අභිබවමින් කටයුතු කිරීම කිසිසේත් අනුමත කළ හැකි ක්‍රියාවක් නොවන බවටත්, එය පහළ නිලධාරීන්ට වැදගත් ආදර්ශයක් නොවන බවටත්, රාජ්‍ය අමාත්‍යවරයා නියෝජනය කරන රජය සැහැල්ලුවට ලක්වීමක් වන බවටත් නිරීක්ෂණය කරමි.

ශ්‍රී ලංකා ජනරජය නියෝජනය කළ අන්දම

හිටපු රාජ්‍ය අමාත්‍යවරයා වැලිකඩ බන්ධනාගාරය නිරීක්ෂණය සඳහා කොට කලිසමකින් සහ ටී ෂර්ට් එකකින් ද සැරසී, දෙපයට සෙරෙප්පු දෙකක් ද දමා පැමිණ තිබූ බවට අනාවරණය වෙයි.

එසේ වුව ද, වැලිකඩ බන්ධනාගාරයට 2021.09.06 වන දින ගියේ රාජකාරි කටයුත්තක් සඳහා වන බවටත්, එහි දී එල්ලුම් ගස බලන්න අවශ්‍යතාවය තිබුණ ද, සිව් වස් සමාලෝචනය ලබා දීමට සිරකරුවන්ගේ ඉල්ලීමක් තිබූ බවටත්, මරණ දඩුවම නියම කළ අයගේ ප්‍රශ්න දැන ගැනීමට අවශ්‍ය වූ බවටත් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් ලබා දුන් සාක්ෂි මගින් ම හෙළිදරවු වෙයි.

ඒ අනුව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා බන්ධනාගාරය නිරීක්ෂණය කිරීමට ගොස් තිබුණේ සාමාන්‍ය පුද්ගලයෙකු වශයෙන් නොව, ශ්‍රී ලංකා ජනරජය

නියෝජනය කරමින්, බන්ධනාගාර පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ කළමනාකරණ රාජ්‍ය අමාත්‍යවරයා වශයෙන් බවට පැහැදිලි වෙයි. ඒ අනුව ශ්‍රී ලංකා ජනරජය හෑල්ලුවට ලක් නොවන ලෙසට ක්‍රියා කිරීමේ සම්පූර්ණ වගකීම හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට තිබුණි.

බන්ධනාගාරයක සැකකරුවන් සහ සිරකරුවන් රඳවා සිටියත්, ඔවුන්ව පහත් කොට සහ/හෝ සුළු කොට සළකමින්, ඔවුන් ඉදිරියෙහි කෙබඳු ආකාරයකින් පෙනී සිටියත් කම් නැතැයි සිතීම ප්‍රභුවරයෙකුට/රජය නියෝජනය කරන උසස් නිලධාරියෙකුට කිසිසේත් සුදුසු නැත. තවද, 'බන්ධනාගාරය' නිසි විනයක් සහිතව පවත්වා ගෙන යනු ලබන ආයතනයකි. එහි සේවය කරන සියළු ම නිලධාරීන් නිල ඇඳුමකින් සැරසී සිටිය යුතුය. මේ අනුව, බන්ධනාගාර ඉහළ නිලධාරීන්ගෙන් පවා ගරු බුහුමන් ලබන රාජ්‍ය අමාත්‍යවරයෙකු වශයෙන් ඔවුන් ඉදිරියට සුදුසු ඇඳුමකින් සැරසී යාමේ වගකීම හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට තිබිණ. එසේම, බන්ධනාගාරය තුළ දී හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට, බන්ධනාගාර නිලධාරීන් මෙන් ම රැඳවියන් ද ගෞරවය දක්වන්නේ 'ලොහාන් රත්වත්ත' යන නමට නොව, ඔහුගේ තනතුරටය. මේ අනුව තනතුරට අගෞරවයක් නොවන පරිදි හැසිරීමේ වගකීම ද හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට තිබුණි.

ඉහත සියළු කරුණු සළකා බැලීමේ දී ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා 2021.09.06 වන දින බන්ධනාගාරයට ගොස් තිබුන ද, එසේ ගොස් තිබුනේ 'රාජ්‍ය අමාත්‍ය' යන තනතුරටත්, ශ්‍රී ලංකා ජනරජයෙහි අභිමානයටත් කැළලක් වන අයුරින් සහ/හෝ හාස්‍යයට ලක් වන අයුරින් වන බවටත් පෙනී යන හෙයින්, වැලිකඩ බන්ධනාගාරය තුළ හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් සිදු කර තිබූ සංචාරයේදී, 'ශ්‍රී ලංකා ජනරජයේත්', 'රාජ්‍ය අමාත්‍ය තනතුරේත්' ගෞරවය පළුදු වී ඇති බවට නිරීක්ෂණය කරමි.

## වැලිකඩ බන්ධනාගාරය තුළ සිදු කර තිබූ ක්‍රියාකාරකම්

හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට අනුව 2021.09.06 වන දින වැලිකඩ බන්ධනාගාරය නිරීක්ෂණය කිරීම සඳහා ගොස් තිබුනේ,

(iii) වැපල් අංශයෙහි පිහිටි පෝරකය නිරීක්ෂණය කිරීමට

(iv) සිව් අවුරුදු සමාලෝචනය සම්බන්ධව ඉල්ලීමක් සිදු කර තිබූ හෙයින් මරණ දඬුවම නියම වූ අයගේ ප්‍රශ්න දැන ගැනීමට වෙයි.

වැපල් අංශයෙහි A1, A2, A3, B1, B2, B3 සහ C1, C2, C3 වශයෙන් වූ ගොඩනැගිලි තුනෙහි සිරකරුවන් 800ක් පමණද, සී.3 අංශයෙහිම සිර මැදිරිවල රැඳවියන් 70-80ක් පමණ ද වූ පිරිසක් රඳවා සිටියත්, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා කථා බහ කර තිබුනේ වැපල් අංශයෙහි සී.3 විශේෂ අංශයෙහි පිහිටි එල්ලුම් ගස කරා යන අතරතුරදී හමුවන, දෙපස කාමර තුල සිටි සිරකරුවන් 10ක්, 20ක් අතර ප්‍රමාණයක පමණි. ඔවුන් සමග ද ගත කර තිබූ වේලාව ද විනාඩි 10ක් 15ක් පමණි. ඔවුන් හා සාකච්ඡා කර ඇත්තේ ද ඔවුන් සිර මැදිරිවල රඳවා සිටිය දී ය.

එම සිරකරුවන්ට අමතරව කථා කර ඇත්තේ තවත් එක් සිරකරුවෙකු සමගින් පමණි. ඒ දුරකථන කුටි අසළ සිටි සිරකරු සමගින්ය. මුළු සංචාරයෙන් ම මෙසේ සිරකරුවන් සමගින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සාකච්ඡා කොට එළඹ ඇති එකම නිගමනය වී ඇත්තේ කුරා කුඹින්ට පවා අවශ්‍ය වන 'නිදහස' සිරකරුවන්ට ද අවශ්‍ය වන බවට පමණි. එම නිගමනයට පැමිණීම සඳහා සංචාරයක් අවශ්‍ය නැත. එය සාමාන්‍ය දැනීමකි.

හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් වැඩි වේලාවක් ම ගත කර ඇත්තේ මීට මාස 5කටත් පෙර රාජ්‍ය අමාත්‍යවරයා නිරීක්ෂණය කර තිබූ කිසිදු ප්‍රශ්නයක් හෝ ගැටළුවක් විසඳීමට නොතිබූ එල්ලුම් ගස පමණි.

හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් කිසිදු සිරකරුවෙකුගේ විස්තරයක් සහ/හෝ වාර්තාවක් ඉල්ලා නැත. කථා කිරීම පමණක් කර ඇත. (වැලිකඩ බන්ධනාගාර අධිකාරි වලිසුන්දරගේ සාක්ෂි - පෙ.ව.8.30 - 7 පිටුව) එහෙයින්, කිසියම් සිරකරුවන් පිරිසකට සිව් වස් සමාලෝචනය වෙනුවෙන් හෝ වෙනත් යම් අභිවෘද්ධියක් සැලසීමට ගොස් තිබුණා යැයි නිරීක්ෂණය නොවේ.

පෝරකය නිරීක්ෂණය කිරීමට පැමිණිය ද, ඒ සඳහා කිසිදු විශේෂ හේතුවක් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට තිබී නැත.

(i) සංචාරයේ වැඩි වේලාවක් පෝරකය අසළ ගත කර තිබූ බවට නිරීක්ෂණය වන හෙයින් ද,

(ii) වෙනත් කිසිදු සුභ සාධන කටයුත්තක යෙදුනු බවට අනාවරණය නොවන හෙයින් ද,

(iii) සැරසී සිටි ඇඳුම්වලින් ද,

බන්ධනාගාර අධිකාරිවරයාගේත්, සහකාර බන්ධනාගාර අධිකාරිවරයාගේත් නිරීක්ෂණයන් පරිදි හිටපු රාජ්‍ය අමාත්‍යවරයා **2021.09.06** වන දින වැලිකඩ බන්ධනාගාරයට පැමිණ ඇත්තේ එල්ලුම් ගස බැලීමට බවට වූ මතයෙහි කිසිදු දෝෂයක් නැත. එය ඉදිරිපත් වූ සාක්ෂිත් රාජ්‍ය අමාත්‍යවරයාගේ සාක්ෂිත්, හැසිරීමටත් අනුව එළඹිය හැකි එකම නිරීක්ෂණයයි.

ඉහත සියළු කරුණු සළකා බැලීමේදී, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට පැහැදිලි කිරීමක් කළ නොහැකි වූ සිවිල් ඇඳුමෙන් සැරසුණු තවත් පුද්ගලයින් දෙදෙනෙකු මෙම සංචාරය සඳහා සහභාගි කර ගෙන තිබූනේ, ඔවුනට එල්ලුම් ගස පෙන්වීම සඳහා යැයි ද සාධාරණව නිරීක්ෂණය කළ හැක.

## (ii) වැලිකඩ බන්ධනාගාර සංචාරය සම්බන්ධව කම්වූ නිර්දේශ

හිටපු බන්ධනාගාර, පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්ත මහතා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ සහ පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍ය ධූරයටත් පවතින ගෞරවය පළුදු වන පරිදි ක්‍රියා කර ඇති හෙයින් ද,

b) අවේලාවේ බන්ධනාගාරයට ඇතුළු වූ හිටපු රාජ්‍ය අමාත්‍යවරයා, 1977 අංක: 16 දරන බන්ධනාගාර ආඥා පනතේ 35 සිට 39 දක්වා වූ වගන්ති යටතට නොගැනෙන සිවිල් ඇඳුමෙන් සැරසුණු පුද්ගලයින් දෙදෙනෙක් හෝ තිදෙනෙක් ද කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව, අනවසරයෙන් බන්ධනාගාරය තුලට රැගෙන ගොස් තිබූ බවට අනාවරණය වන මුත්, එකී වගන්තීන් උල්ලංඝනය කරන යම් තැනැත්තෙකුට ලබා දිය හැකි දඬුවම පනතේ නොදැක්වෙන හෙයින් ද,

❖ හිටපු බන්ධනාගාර, පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්ත මහතාට එම අමාත්‍ය ධූරය පිරිනමා තිබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති තුමා විසින් 'වරදෙහි ස්වභාවය' සළකා බලා, කිනම් පියවරක් ගත යුතු ද යන්න තීරණය කිරීම උචිත බවට නිර්දේශ කරමි.

## 5. හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ අනුරාධපුර බන්ධනාගාර සංචාරය සම්බන්ධව

### (i) කම්ටු නිරීක්ෂණයන්

**a. පැමිණි සහ පිට වූ වේලාව සම්බන්ධව**

ඉදිරිපත් වූ සියළු සාක්ෂි අනුව, හිටපු බන්ධනාගාර කළමනාකරණ හා ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්ත මහතා අනුරාධපුර බන්ධනාගාරයට සංචාරය කිරීමට 2021.09.12 වන දින සවස 5.45 ට පමණ පැමිණ, සවස 7.00ට පමණ පිටව ගොස් තිබූ බවට නිරීක්ෂණය කරමි.

විවිධ පනත්වලින් සංශෝධිත 1877 අංක: 16 දරන බන්ධනාගාර පනතේ 39(2) වගන්තියට අනුව යම් බන්ධනාගාරයක් සහ රැඳවියන්ගේ සාමාන්‍ය තත්ත්වය සොයා බැලීමට සංචාරය කිරීම සඳහා සෙනෙට් සභිකයෙකුට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට, දිසා විනිසුරුවරයෙකුට හෝ මහෙස්ත්‍රාත්වරයෙකුට උදෑසන 5.30ත් සවස 5.30ත් අතරතුර කාලයේ දී සිදු කල හැක. එසේ ම බන්ධනාගාරය පරීක්ෂා කිරීමේ දී සිදු කළ නිරීක්ෂණයන් සහ සුදුසු යැයි හැඟෙන නිර්දේශයන් අමුත්තන්ගේ ලේඛනයෙහි සඳහන් කිරීම ද කළ හැක.

හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට බන්ධනාගාර ප්‍රතිසංස්කරණ සහ පුනරුත්ථාපන අමාත්‍යවරයා වශයෙන් ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් ද, 2021.09.12 වන දින අනුරාධපුර බන්ධනාගාරයන් නිරීක්ෂණය කිරීමට සම්පූර්ණ බලතල, වගකීම සහ යුතුකම රැඳී පැවතුන ද, 2021.09.12 වන දින අනුරාධපුර බන්ධනාගාරයටත් සිදු කර තිබූ සංචාරය, සම්පූර්ණයෙන් ම නීතියෙන් ඔහු වෙත පැවරී තිබූ සියළු බලතල ඉක්මවමින් සහ ඉහත කී

බන්ධනාගාර පනතේ 39(2) උප වගන්තිය උල්ලංඝනය කරමින් සිදු කර තිබූ බවට නිරීක්ෂණය කරමි.

### b. ශ්‍රී ලංකා ජනරජය නියෝජනය කර තිබූ අන්දම

හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ඩෙනිම් කලිසමකින් සහ අත් දිග ජර්සියක් වැනි කමිසයකින් ද, දෙපයට සෙරෙප්පු දෙකක්ද දමාගෙන , ආරක්ෂක නිලධාරීන් දෙදෙනෙකු සහ හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකායේ නිලධාරීන් තිදෙනෙකු ද සමගින් සවස ප.ව.5.45ට පමණ අනුරාධපුර බන්ධනාගාරයට පැමිණ, 'F' වාට්ටුවෙහි රඳවා සිටි විශේෂ ගණයේ සිර සහ සැකකරුවන් මිදුලට ගෙන්වා ගෙන, සිය ඉණේ බැඳ තිබූ පටියක රඳවා ගෙන රැගෙන ආ පිස්තෝලයක් වැනි ගිනි අවිය එම රැඳවියන්ට දිස්වෙන ලෙසට තබාගෙන, බීමත් පුද්ගලයෙකු ලෙසින් හැසිරී තිබූ බවට නිරීක්ෂණය වෙයි.

හිටපු රාජ්‍ය අමාත්‍යවරයා බන්ධනාගාරය නිරීක්ෂණය කිරීමට ගොස් තිබුනේ සාමාන්‍ය පුද්ගලයෙකු වශයෙන් නොව, ශ්‍රී ලංකා ජනරජය නියෝජනය කරමින්, බන්ධනාගාර පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ කළමනාකරණ රාජ්‍ය අමාත්‍යවරයා වශයෙන් බවට පැහැදිලි වෙයි. ඒ අනුව ශ්‍රී ලංකා ජනරජය හැල්ලුවට ලක් නොවන ලෙසට ක්‍රියා කිරීමේ සම්පූර්ණ වගකීම හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට තිබූ බවට නිරීක්ෂණය කරමි.

බන්ධනාගාරයක සැකකරුවන් සහ සිරකරුවන් රඳවා සිටියත්, ඔවුන්ව පහත් කොට සහ/හෝ සුළු කොට සළකමින් ඔවුන් ඉදිරියෙහි කෙබඳු ආකාරයකින් පෙනී සිටියත් කම් නැතැයි සිතීම ප්‍රභූවරයෙකුට/රජය නියෝජනය කරන උසස් නිලධාරියෙකුට කිසිසේත් සුදුසු නැත. තවද, 'බන්ධනාගාරය' නිසි විනයක් සහිතව පවත්වා ගෙන යනු ලබන ආයතනයකි. එහි සේවය කරන සියළු ම නිලධාරීන් නිල ඇඳුමකින් සැරසී සිටිය යුතු අතර අසිහියෙන් බීමත්ව සිටින පුද්ගලයෙකු ලෙස කටයුතු

නොකල යුතුය. තවද, බන්ධනාගාරයක් තුලදී ගිනි අවියක් පාවිච්චි කල හැක්කේ විවිධ පනත්වලින් සංශෝධිත 1877 අංක: 16 දරන බන්ධනාගාර පනතේ 79(1) සිට 79(5) වන වගන්තින් හි දැක්වෙන ප්‍රකාර ව පමණි. කිසිදු නීති විරෝධි ක්‍රියාවක් නොකරන රැඳවියෙකුට එරෙහිව ගිනි අවියක් පාවිච්චි කල නොහැක.

මේ අනුව, බන්ධනාගාර ඉහල නිලධාරීන්ගෙන් පවා ගරු බුහුමන් ලබන රාජ්‍ය අමාත්‍යවරයෙකු වශයෙන් ඔවුන් ඉදිරියට සුදුසු ඇඳුමකින් සැරසී යාමටද, සිහියෙන් කටයුතු කිරීමටද, බන්ධනාගාරය තුළට ගිනි අවි කිසිවක් රැගෙන යාමෙන් වැළකීමට ද, වගකීමක් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට තිබිණ. එසේම, බන්ධනාගාරය තුළ දී හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට, බන්ධනාගාර නිලධාරීන් මෙන් ම රැඳවියන් ද ගෞරවය දක්වන්නේ 'ලොහාන් රත්වත්ත' යන නමට නොව, ඔහුගේ තනතුරටය. මේ අනුව තනතුරට අගෞරවයක් නොවන පරිදි හැසිරීමේ වගකීම ද හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට තිබුණි.

ඉහත සියළු කරුණු සළකා බැලීමේ දී ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා 2021.09.12 වන දින බන්ධනාගාරයට ගොස් තිබුන ද, එසේ ගොස් තිබුනේ 'රාජ්‍ය අමාත්‍ය' යන තනතුරටත් ශ්‍රී ලංකා ජනරජයෙහි අභිමානයටත් කැළලක් වන අයුරින් සහ/හෝ හාස්‍යයට ලක් වන අයුරින් වන බවටත් පෙනී යන හෙයින්, අනුරාධපුර බන්ධනාගාරය තුළ හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් සිදු කර තිබූ සංචාරයේදී, 'ශ්‍රී ලංකා ජනරජයේත්', 'රාජ්‍ය අමාත්‍ය තනතුරේත්' ගෞරවය පළුදු වී ඇති බවට නිරීක්ෂණය කරමි.

c) බන්ධනාගාරය තුළ සිදු කර තිබූ ක්‍රියාකාරකම්

I. බන්ධනාගාරයට ඇතුළු වන ප්‍රධාන ලෑලි දොරටුව අසළ දී ප්‍රධාන ජේලර්වරයා විසින් සැමට ම ඇසෙන සේ "ගිනි අවි සහ දුරකථන ඇත්නම් ඒවා එළියේ තබා පැමිණෙන ලෙසට" දුන් දැනුම් දීමක් මත හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සමග පැමිණි ආරක්ෂක නිලධාරීන් ගිනි අවි සහ දුරකථන වාහනයේ දමා පැමිණ තිබුණ ද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා එසේ නොකර තිබූ බවට සහ හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට තිබූ ගෞරවය මත හිටපු රාජ්‍ය අමාත්‍යවරයාව බන්ධනාගාර නිලධාරීන් විසින් පරීක්ෂා කර නොතිබූ බව.

II. ගිනි අවි, පුපුරන ද්‍රව්‍ය, මත් ද්‍රව්‍ය වැනි භාණ්ඩ බන්ධනාගාරය තුළට රැගෙන යන්නේ ද යන්න සොයා බැලීම සඳහා පුද්ගලයින් ඇවිද යන ස්කෑන් යන්ත්‍රයක් (Walk Through Scanner) නොතිබූ හෙයින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට පහසුවෙන් සිය ගිනි අවිය රැගෙන යාමට හැකියාව ලද බව.

III. අනුරාධපුර බන්ධනාගාරය තුළ සී.සී.ටී.වී කැමරා සවි කර නොතිබීම මත සැබෑවට සිදු වූ සිදුවීම් කුමක්දැයි නිරීක්ෂණය කිරීම සඳහා තාක්ෂණික යන්ත්‍රයක් නොතිබූ හෙයින්, ලිඛිත සහ වාචික සාක්ෂි මත පමණක් පදනම්ව තොරතුරු රැස් කිරීමට සිදු වූ බව.

IV. 'F' වාට්ටුව අසළ වූ මිදුලට කැඳවා තිබූ රැඳවියන් 10 දෙනෙකුව හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ ඉල්ලීම පිට කැඳවා තිබුණේ ඔවුනට පවතින නඩු සම්බන්ධව ගැටළු ඇත්නම් ඒවා ඉදිරිපත් කිරීමටත්, ගරු ජනාධිපතිවරයාට ඒ සම්බන්ධව පවසා නඩු කටයුතු ඉක්මණින් අවසන් කර දීමට කටයුතු කිරීමටත් බවට ප්‍රථමයෙන් ම රැඳවියන්ව දැනුවත් කිරීමක් සිදු කර තිබූ බව.

V. එසේ වුව ද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා එක් එක් රැඳවියන්ගෙන් ඔවුන්ගේ නඩු ගැන පමණක් නොව ඔවුන් විසින් සිදු කර තිබූ වරද කුමක්දැයි යන්න

මෙන් ම සිංහල මිනිස්සු මරා ඇද්දැයි විමසමින් " ඇත්ත කියන්න, ඇත්ත කියන්න" යයි දන්වා වරද කියා පෑමට බල කිරීමක් සිදු කර තිබූ බව.

VI. ඉහත කී රැඳවියන්ව මුණ ගැසුණු අවස්ථාවේ දී හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ ඉණේ රඳවා තිබූ ගිනි අවිය දිස් වූ බව.

VII. අඩ කවයක ආකාරයෙන් සිට ගෙන සිටි රැඳවියන් අතරින් පළමුවෙන් ම සිට ගෙන සිටි සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිදු කරන ලදැයි දක්වා සිටින වරදක් සඳහා වවුනියාව මහෙස්ත්‍රාත් අධිකරණ අංක: B.13/19 දරන නඩුව යටතේ රඳවා ඇති පූබාලසිංහම් සූරියබාලන් නැමැත්තාගෙන් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් "අපේ කට්ටිය කී දෙනෙකුට වෙඩි තිබ්බා දැයි" විමසූ විට දී, එබන්දක් සිදු නොකළ බවටත්, සැක පිට අත් අඩංගුවට ගෙන ඇති බවටත් පැවසූ අවස්ථාවේ දී, ඔහු විසින් "බොරු කියනවා" යැයි දැනුම් දී බිම දණ ගැසීමට දන්වා තිබූ බව.

VIII. හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ නියමය මත ඉහත කී පූබාලසිංහම් සූරියබාලන් නැමැත්තා දණ ගැසූ ස්ථානයෙහි තිබූ පොළව බොරළු, වැලි, පොඩි ගල් කැට මිශ්‍රිත රළු පොළවක් බව.

IX. ඉන් අනතුරුව, සිට ගෙන සිටි රැඳවියන්ගෙන් ද වෙන් වෙන්ව කී දෙනෙකුට වෙඩි තිබ්බා දැයි විමසමින් "බොරු කියන්න එපා, ඇත්ත කියන්න" යැයි සඳහන් කරමින් බලෙන් ප්‍රකාශයක් ගැනීමට තැත් කර තිබූ බව.

X. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වවුනියාව මහාධිකරණ නඩු අංක: 2491/13 දරන නඩුවට රඳවා සිටින රාසතුරෙයි සිදුර්සන් නැමැත්තාගේ ඉදිරියට පැමිණ ඔහුගේ මුහුණට පහළින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ අත් දෙක මිටි කොට එකට ළං කර පහර දීමට මෙන් තැත් කරමින්, එල්.ටී.ටී. ද විමසා ඊට "නැහැ ඔවුන්ට උදව් කළා" යනුවෙන් පිළිතුරු දුන් පිළිතුරු දුන්

ඊට "හමුදාවට වෙඩි තිබ්බා ද" යනුවෙන් ද විමසමින් ඔහුව ද බියට පත් කර තිබූ බව.

ඉන් අනතුරුව අඩ කවයෙහි නව වෙනියට සිටි ඉහත කී වවුනියා මහාධිකරණ නඩු අංක: 2491/13 දරන නඩුවටම රිමාන්ඩ්ගත කර සිටින 'මදිඅරසන් සුලක්ෂන්' නැමැත්තා වෙත ද ගොස්, එල්.ටී.ටී.ඊ් එකේ සිටියාදැයි යන්න මෙන් ම, "ඇත්ත කිව්වොත් සමාව දෙනවා" යැයි කියමින් ඊට, "එල්.ටී.ටී.ඊ්.එකේ සිටියා, වවුනියා මහාධිකරණයේ නඩු පවරා තිබෙනවා" යැයි පැවසූ විට දී, "සිංහල මිනිස්සු මැරුවා ද", යන්න ද අසා ඊට "නැහැ" යැයි කී අවස්ථාවේ දී "බොරු කියන්නේ" යැයි දන්වමින් ඉහත කී සූරියබාලන් නැමැත්තා දණ ගසා සිටි ස්ථානය අසළින් දණ ගැසීමට නියම කර තිබූ බව සහ ඒ අනුව සුලක්ෂන් නැමැත්තා ද බිම දණ ගසා තිබූ බව.

II. විනාඩි 15කට ආසන්න කාලයක් එළියට රැස් කර තිබූ 10 දෙනාගෙන් ම ප්‍රශ්න කර අවසානයේදී, 'F' වාට්ටුව තුළ රඳවා සිටි රැඳවියන් ද මුණ ගැසීමට ද ගොස් එහි ද හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විනාඩි 10ක්, 15ක් අතර කාලයක් රැඳී තිබූ බව.

III. 'F' වාට්ටුව තුළ හිටපු රාජ්‍ය අමාත්‍යවරයා රැඳී සිටි කාලය තුළ දී ඉහත කී සුලක්ෂන් සහ සූරියබාලන් යන දෙදෙනා තවදුරටත් බොරළු වැලි සහ කුඩා ගල් මිශ්‍ර රළු පොළොවේ දණ ගසා සිටි බවට සහ අනෙකුත් රැඳවියන් අට දෙනා එහි ම සිට ගෙන රැඳී සිටි බව.

IV. 'F' වාට්ටුවෙන් පිටතට පැමිණි හිටපු රාජ්‍ය අමාත්‍යවරයා නැවතත් මිදුලේ සිටි රැඳවියන් මුණ ගැසී ඔවුන් සියළු දෙනාට ම දණ ගැසීමට දන්වා තිබූ බව.

අනතුරුව, 'සුලක්ෂන්' සහ 'සූරියබාලන්' දණ ගසා සිටි ස්ථානය අසළට ගොස් නැවත වරක් සූරියබාලන් යන අයට "ඇත්ත කියන්න" යැයි අසමින් ඊට සූරියබාලන් විසින් "ඇත්ත තමයි කියන්නේ, කසාද බැඳලා ...වෙකුත් ඉන්නවා, යාළුවෙකුට උදව් කළා" යැයි පැවසූ විට දී "බොරු කියන්නේ" යැයි හිටපු රාජ්‍ය අමාත්‍යවරයා දන්වමින්, ඔහුගේ ඉණෙහි තිබූ පිස්තෝලය අතට ගෙන එය රැඳවියන්ට පෙනෙන සේ ලෝඩ් කර, අනතුරුව එම ගිනි අවියේ බටය මෙකී රැඳවියන් දෙදෙනාගේ හිස දෙසට එල්ල වන කරමින්, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ එක් ඇඟිල්ලක් ඉහත කී ගිනි අවියේ කොකාට තබා, වෙඩි තැබීමට තැත් දරා තිබූ බව.

මෙම අවස්ථාවේ දී අනුරාධපුර බන්ධනාගාර සහකාර අධිකාරිවරයා විසින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ පිස්තෝලය තිබූ අත නොව, අනෙක් අත අල්ලා ගෙන නතර කිරීමක් සිදු කර තිබූ බව.

II. එම අවස්ථාවේ දී හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ නියමය පරිදි පරිදි සූරියබාලන් සිටි ස්ථානයෙන් නැගිට්ටුවා, ඒ ආසන්නයේ ම වෙනත් ස්ථානයකට රැගෙන ගොස් 'තිබූ බව සහ අනෙකුත් රැඳවියන්ට වාට්ටුවට යාමට ප්‍රධාන ජේලර්වරයා දන්වා තිබූ බව.

III. අනතුරුව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා 'සූරියබාලන්' අසලට ගොස් සූරියබාලන්ව දණ ගස්වා, සහ මුහුණු ආවරණය ද ගැලවීමට දන්වා, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ මුහුණු ආවරණය ද ගලවා අඩි 2ක් පමණ සූරියබාලන්ට දුරින් සිට ගෙන, නැවත වරක් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ සන්තකයේ තිබූ ගිනි අවිය රැගෙන සූරියබාලන්ගේ හිසට එල්ල කරමින් "ඇත්ත කියන්න" යැයි කියා තිබූ බවටත්, ඉන් බියට පත් වූ සූරියබාලන් නැමැත්තා හඬමින් අත් දෙකින් වැඳ ගෙන ඔහුට විවාහ වී දරු පවුලක් සිටින බවටත් දන්වා තිබූ බව.

XIX. ඒ දෙස බලා හිටපු රාජ්‍ය අමාත්‍යවරයා පිටව ගොස් තිබූ බවට සහ එම ස්ථානය අසළට පැමිණි බන්ධනාගාර නිලධාරිවරයෙකුත්, සූරියබාලන්ට වාට්ටුවට යාමට දන්වා තිබූ බව.

XX. 'F" වාට්ටුවේ සිට එළියට රැගෙන ගිය රැඳවියන් 'F' වාට්ටුවේ අසළ මිදුලෙහි පැය ½කට වැඩි කාලයක් රැඳී සිටි බවට සහ ' සූරියබාලන්' සහ 'සුලක්ෂන්' යන දෙදෙනා ද එම කාලයට ආසන්න කාලයක් ඉහත කී රළු පොළවේ හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සිදු කළ ක්‍රියාවන් මගින් බියට පත් වී, අකැමැත්තෙන් එම ස්ථානයේ ම රැඳෙමින් දණ ගසා ගෙන සිටි බව.

XXI. රැඳවියන්ගේ නඩු කටයුතු කඩිනම් කිරීමට ගත යුතු පියවර සහ/හෝ වෙනත් කිසිදු සුභසාධන කටයුත්තක හිටපු රාජ්‍ය අමාත්‍යවරයා නියැලී නොතිබූ බව.

XXII. හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට මුණ ගැස්වීම සඳහා 'F' වාට්ටුවේ සිට එළියට රැගෙන ගිය රැඳවියන්, හිංසනයන්ට සහ පීඩාවන්ට ලක්ව තිබූ බවට රැඳවියන් විසින් අනුරාධපුර සහකාර බන්ධනාගාර අධිකාරිවරයාටත්, ප්‍රධාන ජේලර්වරයාටත් පැමිනිල්ලක් ඉදිරිපත් නොකලද, එම නිලධාරින් ඒ ආසන්නයේ ගැවසී ඇත. තවද, රැඳවියන් නැවතත් 'F' වාට්ටුව තුළට ගිය අවස්ථාවේ දී ම, ඔවුන් සිදු කර තිබූ කථාබහ මගින් 'F' වාට්ටුව භාරව, රාත්‍රී රාජකාරියේ යෙදී සිටි බන්ධනාගාර නියාමක හේමපාලගේ ප්‍රියන්ත කුමාර දිසානායකට ද රැඳවියන් මුහුණ දුන් සිද්ධිය කියනු ඇසී ඇත. දැන ගැනීමට ද ලැබී ඇත. එනමුත්, ඔහු ද ඊට අදාළව කිසිදු ක්‍රියාමාර්ගයක් රැගෙන නොතිබූ බව.

XXIII. ඉහත කී රැඳවියන් සමගින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සිටි කාලය තුළ දී අනුරාධපුර සහකාර බන්ධනාගාර අධිකාරිවරයාත්, ප්‍රධාන ජේලර්වරයාත්, තවත් ජේලර්වරුන් තිදෙනෙකුත් ඒ ආසන්නයේ ගැවසී ඇතත්, මෙකී

නිලධාරීන් බියට පත් වීම සහ/හෝ බලපෑම්වලට ලක් වීම සහ/හෝ ඔවුන් පවසා ඇති ඔවුන්ට දර්ශනය කිරීමට නොහැකි වූ පරිදි රැඳී සිටීම නිසා , හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සතුව ගිනි අවියක් තිබූ බවට සහ/හෝ ඊට අදාළව කිසිදු සාක්ෂියක් ලබා නුදුන් බව.

V. එනමුත්, කිසිදු බන්ධනාගාර නිලධාරියෙකු හෝ රැඳවියෙකු විසින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සතුව ගිනි අවියක් තිබූ බවට සහ/හෝ, 'සුලක්ෂන්' සහ 'සූරියබාලන්' දණ ගසා සිටි ස්ථානය අසළට ගොස්, වරද කියා පෑමක් සිදු කිරීමට බල කරමින් ඔවුන්ගේ හිසට වෙඩි තැබීමට තැත් කිරීමක් කෙසේවත් සිදු නොවූ බවට සහ/හෝ සිදු විය නොහැකි බවට පවසා නොමැති බව.

XV. 'F' වාට්ටුවේ සිටි රැඳවියන් 10 දෙනෙකුව හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ ඉල්ලීම පිට හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට ඉදිරිපත් කර තිබූ අවස්ථාවේ දී හිටපු රාජ්‍ය අමාත්‍යවරයා,

i. ගරු ජනාධිපති තුමාට පවසා නඩු කටයුතු අවසන් කිරීමට ක්‍රියා කරන බවට දැනුවත් කර තිබූ බවත්,

ii. හිටපු රාජ්‍ය අමාත්‍යවරයා බීමත්ව සිටි පුද්ගලයෙකු මෙන් රැඳවියන් ඉදිරියෙහි හැසිරුණු බවටත්,

iii. ඔහු සන්තකයේ තිබූ ගිනි අවිය රැඳවියන්ට පෙනෙන ලෙසට ඉණෙහි රඳවා ගෙන තිබුණු බවටත්,

iv. රැඳවියන්ට වරද කියා පෑමක් සිදු කිරීමට බල කරමින් ඔවුන් ඉදිරියෙහි එම ගිනි අවිය රඳවා ගෙන තිබූ බවත්,

v. රළු පොළවෙහි පැය ½කට වැඩි කාලයක් සූරියබාලන් සහ සුලක්ෂන් යන දෙදෙනාගේ අකැමැත්තෙන් දණ ගසා සිටීමට සැලැස්වූ බවටත්,

අනතුරුව දණ ගසා සිටි රැඳවියන් දෙදෙනාගේ හිසට වෙඩි තැබීමට තැත් කළ බවත්,

රැඳවියන් බියට, ශාරීරික සහ/හෝ මානසික පීඩනයන්ට ලක්ව තිබූ බවටත්,

මෙම කමිටුව ඉදිරියේ පවතින තොරතුරු "ඒකාකාරී භාවයෙහි පරීක්ෂණයෙන් ද, "විය හැකි භාවයේ පරීක්ෂණයෙන්" ද, "අප්‍රමාදී භාවයේ පරීක්ෂණයෙන්" ද සමත් වන හෙයින් ඉහත කී XXV (i) සිට (vii) දක්වා වූ සියළු ම කරුණු විශ්වාස කළ හැකි සත්‍යයක් බවත්, ඒවා රැඳවියන් විසින් ගෙතූ ප්‍රබන්ධයක් නොවන බවටත් තීරණයකට පැමිණිය හැකි බව.

XXVI. බන්ධනාගාර ප්‍රතිසංස්කරණ සහ පුනරුත්ථාපන හිටපු රාජ්‍ය අමාත්‍යවරයාත්, අනුරාධපුර බන්ධනාගාරයෙහි 'F' වාට්ටුවේ රැඳී සිටි මෙකී හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට ඉදිරිපත් කර තිබූ රැඳවියන් 10 දෙනාත් අතර, 2021.09.12 වන දින සිදුව තිබූ හමු වීමේ දී සිදු වූ සිද්ධීන් වලට අදාලව, මෙම කමිටුව වෙත ඉදිරිපත් වූ වාචික සහ ලිඛිත සාක්ෂි මගින් ලද තොරතුරු විශ්ලේෂණය කිරීමේ දී, එකී හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට එරෙහිව පහත දැක්වෙන චෝදනා නැගිය හැකි බවට නිරීක්ෂණය කළ හැකි බව.

1. ශ්‍රී ලංකා ජනරජයේ රාජ්‍ය අමාත්‍යවරයෙකු ලෙසට රජය නියෝජනය කරමින් පැමිණ ශ්‍රී ලංකා ජනරජයේ ගරු ජනාධිපති තුමාට දන්වා රැඳවියන්ගේ නඩු කටයුතු අවසන් කරන බවට දැනුම් දෙමින් සහ/හෝ දැන ගැනීමට සලස්වමින් ගරු ජනාධිපති තුමාට අවමන් වන ලෙසට සහ/හෝ රාජකීය මහිමය කෙලෙසෙන ලෙසට හැසිරෙමින්,

(i). රැඳවියන්ව නිදහස් කිරීමට හෝ ඝාතනය කිරීමට හැකි බවට දන්වමින්,

(ii). රැඳවියන් දෙදෙනෙකුව බිම දණ ගස්වා ගිනි අවියක් හිසට එල්ල කරමින් වෙඩි තබා ඝාතනය කිරීමට තැත් කිරීම මත

විවිධ පනත් සහ 1996 අංක: 22 දරන පනත මගින් සංශෝධිත 1916 අංක: 33 (182 අධිකාරය) තුවක්කු ආඥා පනතේ 44 (අ) උප වගන්තිය සමග කියැවෙන දණ්ඩ නීති සංග්‍රහයේ 118 වන වගන්තිය යටතේ දඩුවම් කල හැකි වරදක් සිදු කර ඇති බවට චෝදනා නැගිය හැකි බව.

2. තව ද, ඉහත XXV නිරීක්ෂණයේ දක්වා ඇති අන්දමට හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ක්‍රියා කර තිබුණේ රජය නියෝජනය කරමින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වරදක් සිදු කරන ලදැයි දක්වමින් අධිකරණ නියෝගයක් මත රඳවා සිටි ද්‍රවිඩ ජාතිකයින් පිරිසකට වූ හෙයින් ද, මෙම ක්‍රියාව මගින් එකී රැඳවියන් දැඩි හිංසනයකටත්, බියකටත්, පීඩනයකටත් ලක්ව තිබූ හෙයින් ද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ ක්‍රියාව ශ්‍රී ලංකාණ්ඩුවට ද්‍රවිඩ ජාතිකයින් විරුද්ධත්වය දැක්වීමේ හැඟීම් ඇවිස්සීමට හෝ ඇවිස්සීමට තැත් කිරීමට ගරු ජනාධිපති තුමාගේ වැසියන් පංති අතර වෛරී හෝ සතුරු හැඟීම්, අසමගි හැඟීම් වැඩි දියුණු කිරීමට තැත් කිරීමත් යටතේ විවිධ පනත් සහ 1996 අංක: 22 දරන පනත මගින් සංශෝධිත 1916 අංක: 33 (182 අධිකාරය) තුවක්කු ආඥා පනතේ 44 (අ) උප වගන්තිය සමග කියැවෙන දණ්ඩ නීති සංග්‍රහයේ 120 වන වගන්තිය යටතේ දඩුවම් කල හැකි වරදක් සිදු කර ඇති බවට චෝදනා නැගිය හැකි බව.

හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් ඔහු සතුව තිබූ ගිනි අවිය ලෝඩ් කර, ඔහුගේ එක් ඇඟිල්ලක් එකී ගිනි අවියෙහි කොකා වෙත තබමින්, "ඇත්ත කියන්න" යැයි තර්ජනය කරමින්, අනුරාධපුර බන්ධනාගාර සැක අංක: 140 - මදිඅරසන් සුලක්ෂන් සහ සැක අංක: 363 - පූබාලසිංහම් සූරියබාලන් යන දෙදෙනාගේ හිසට ගිනි අවිය එල්ල කර තිබූ බවත්, එම ක්‍රියාව නතර කර ඇත්තේ අනුරාධපුර සහකාර බන්ධනාගාර අධිකාරිවරයා විසින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ අත ඇල්ලීම නිසා බවටත් තොරතුරු අනාවරණය වන හෙයින්, විවිධ පනත් සහ 1996 අංක: 22 දරන පනත මගින් සංශෝධිත 1916 අංක: 33 (182 අධිකාරය) තුවක්කු ආඥා පනතේ 44 (අ) උප වගන්තිය සමග කියැවෙන දණ්ඩ නීති සංග්‍රහයේ 300 වන වගන්තිය යටතේ 'මිනීමැරීමට තැත් කිරීමේ' වරදට දඬුවම් කල හැකි වරදක් සිදු කර ඇති බවට චෝදනා නැගිය හැකි බව.

4. සුලක්ෂන් නැමැත්තාව පැය ½කට ආසන්න කාලයක් බොරළු, වැලි, කුඩා ගල් මිශ්‍රිත පොළවක් මත දණ ගැස්වීමට සලස්වා ස්වේච්ඡාවෙන් සුළු තුවාල සිදු කිරීම මත දණ්ඩ නීති සංග්‍රහයේ 314 වන වගන්තිය යටතේ දඬුවම් කල හැකි වරදක් සිදු කර ඇති බවට චෝදනා නැගිය වරදක් සිදු කර ඇති බවටත්

5. සූරියබාලන් නැමැත්තාව පැය ½කට ආසන්න කාලයක් බොරළු, වැලි සහ ගල් සහිත රළු පොළව මත දණ ගසා සිටීමට සලස්වා ස්වේච්ඡාවෙන් තුවාල සිදුකිරීම මත දණ්ඩ නීති සංග්‍රහයේ 315 වන වගන්තිය යටතේ දඬුවම් කල හැකි වරදක් සිදු කර ඇති බවට චෝදනා නැගිය හැකි බවටත්

6. තැති ගැන්වීමක් ඇති කරවන අදහසින් හෝ නීත්‍යානුකූලව බැඳී නැති ක්‍රියාවක් වූ වරද කියා පෑමක් සිදු කිරීමට බල කිරීමෙන් ඉහත කී සුලක්ෂන් සහ සූරියබාලන් යන දෙදෙනාගේ හිස්වලට ගිනි

අවියක් එල්ල කර මරණ බවට තර්ජනය කිරීම මත ඉහත කී 1996 අංක: 22 දරන පනත මගින් සංශෝධිත 1916 අංක: 33 (182 අධිකාරය) තුවක්කු ආඥා පනතේ 44 (ආ) උප වගන්තිය සමග කියැවෙන දණ්ඩ නීති සංග්‍රහයේ 486 වන වගන්තිය යටතේ සාපරාධි භය ගැන්වීමේ වරදට දඬුවම් කල හැකි වරදක් සිදු කර ඇති බවට චෝදනා නැගිය හැකි බව.

**අනුරාධපුර බන්ධනාගාරයෙහි සිදු කළ සංචාරය සම්බන්ධව**

**(ii) කමිටු නිර්දේශ**

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා ජනරජයේ නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද, නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුතුය. එසේ ම 11 වන ව්‍යවස්ථාවට අනුව කිසිම තැනැත්තෙකු වධහිංසාවලට කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතුය.

තව ද, 13 (2) ව්‍යවස්ථාවට අනුව නීතියෙන් නියම කරනු ලබන කාර්ය පටිපාටිවලට අනුකූලව රඳවා තිබෙන හෝ පෞද්ගලික නිදහස අහිමි නොකළ යුතු අතර, 13(5) ව්‍යවස්ථාවට අනුව 'වරදකරු' යැයි ඔප්පු කරනු ලබන තෙක් සෑම පුද්ගලයෙකු ම නිර්දෝශ පුද්ගලයෙකු යැයි පූර්ව අනුමාන කළ යුතුය.

i) මේ අනුව බන්ධනාගාර පුනරුත්ථාපන, ප්‍රතිසංස්කරණ හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට එරෙහිව අපරාධමය චෝදනාවන් එල්ල කිරීමට ප්‍රමාණවත් වූ තොරතුරු මෙකී වාර්තාවේ 'XXV1'වන ඡේදයෙහි දක්වා ඇති පරිදි නිරීක්ෂණය වන හෙයින් ද,

ii) නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද, නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුතුව ඇති හෙයින් ද,

iii) හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට මුණගැස්වීම සඳහා 'F' වාට්ටුව අසලවූ මිදුලට ඉදිරිපත් කර තිබූ රැඳවියන් අතරින් එක් රැඳවියෙකු හැරෙන්නට, අනෙකුත් සියළුම රැඳවියන්, ත්‍රස්ථවාදී පණත යටතේ වූ චෝදනාවක් සඳහා වරදකරු බවට තීන්දු ප්‍රකාශයක් නිසි බලය ඇති අධිකරණයකින් ප්‍රකාශ කොට නොතිබූ අයවළුන් වූ හෙයින්, ඔවුන්

එම පණත යටතේ වූ චෝදනාවන්ට 'නිර්දෝෂී' පුද්ගලයන් ලෙසට සැළකිය යුතුව ඇති බැවින් ද,

හිටපු රාජ්‍ය අමාත්‍යවරයා රාජකාරිමය කටයුත්තක් ඉටු කිරීමේ අයුරින් අනුරාධපුර බන්ධනාගාරයට ගොස් තිබූ බැවින් ඔහු වෙත 'F' වාට්ටුවේ සිටි රැඳවියන් ඉදිරිපත් කර තිබුණ ද, එකී රැඳවියන් සාපරාධී බියට පත්කිරීමට සහ/හෝ, වරද කියාපාන ලෙසට බලහත්කාරකම් පෑමට සහ/හෝ, වධ හිංසා පීඩාවන්ට ලක් කරමින් නීත්‍යානුකූල නොවන අන්දමට රඳවා තැබීමට සහ/හෝ, මිනීමැරීමට තැත් කිරීමට හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට කිසිදු නීත්‍යානුකූල බලයක් නොතිබූ හෙයින් ද,

- ❖ අනුරාධපුර බන්ධනාගාරයෙහි, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ සහ පුනරුත්ථාපන හිටපු රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්ත මහතා සිදු කළ සංචාරය සම්බන්ධව ශ්‍රී ලංකා පොලිසිය මගින් මෙතෙක් සිද්ධ කර ඇති පරීක්ෂණයන් පදනම් කර ගෙන, සටහන් කර ඇති සියළු ම ප්‍රකාශවල දැක්වෙන වැදගත් කරුණු අඩංගු කරමින් සකසන ලද 'B' වාර්තාවක්, මෙතෙක් අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර නොමැති නම්, නොපමාව එය ඉදිරිපත් කිරීමට පියවර ගැනීමටත්,

- ❖ හිටපු රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්ත මහතා අනුරාධපුර බන්ධනාගාරයෙහි සිදු කළ සංචාරය සම්බන්ධව ශ්‍රී ලංකා පොලිසිය මගින් මෙතෙක් සිද්ධ කර ඇති පරීක්ෂණයන්හි

ඉදිරි විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කර ඉදිරි පියවර ගත යුතු බවටත්,

- හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සිදු කරන ලදැයි දක්වා සිටින සියළුම වරදවල් සම්බන්ධව ඉතාමත් කෙටි කාලයකින් ශ්‍රී ලංකා පොලිසිය මගින් නිසි බලය ඇති අධිකරණයක චෝදනාවක් හෝ අධි චෝදනාවන් ඉදිරිපත් කිරීමට නොපමාව පියවර ගත යුතු බවටත්,

- 2021.09.12 වන දින සවස 5.45ත්, රාත්‍රී 7.00ත් අතර කාලය තුළ දී අනුරාධපුර බන්ධනාගාරයෙහි රාජකාරියේ යෙදී සිටි නිලධාරීන් පැමිණිල්ලේ වැදගත් ඇසූ දුටු සාක්ෂිකරුවන් වන බැවින් ද, මෙම සිද්ධියේ දී ඔවුන් විසින් නිරීක්ෂණය කළ සැබෑ තොරතුරු වසන් නොකර ලබා ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සැලසිය යුතු බවටත්,

- සියළු ම බන්ධනාගාරවල කඩිනමින් සී.සී.ටී.වී.කැමරා (C.C.T.V) පද්ධතියක් ස්ථාපනය කිරීමට පියවර ගත යුතු බවටත්, ( මෙම කරුණ මා සභාපතිත්වය දරන ලද , 2020.11.29 වන දින මහර බන්ධනාගාරය තුළ සිදු වූ සිද්ධිය සම්බන්ධව සොයා බැලීම සඳහා පත් කල පංච පුද්ගල කමිටුව විසින් 2020.12.30 වන දින ඉදිරිපත් කළ වාර්තාවේ (ix) වන නිර්දේශය යටතේ ද ඉදිරිපත් කර ඇත.)

- බන්ධනාගාරයට ඇතුල් වන සෑම පුද්ගලයෙකු ම රැගෙන යන දේපළ පරීක්ෂාවට ලක් කළ හැකි විශේෂ ස්කෑන් යන්ත්‍රයක් ප්‍රධාන ලෑලි දොරටුව අසළ සවි කර,

බන්ධනාගාරයට ඇතුල් වන සෑම පුද්ගලයෙකු ම එම යන්ත්‍රය හරහා ගමන් කරවීමට සැලැස්වීම කල යුතු බවටත්,

- ❖ බීමත්ව සිටින බවට නිරීක්ෂණය කළ හැකි කිසිම තැනැත්තෙකු බන්ධනාගාරය තුළට නොගැනීම සඳහා වන වගකීම බන්ධනාගාර නිලධාරීන්ට පැවරීමටත්,

- ❖ බරපතල ගණයේ වරදක් සිදු කර ඇති බවට බරපතල චෝදනාවක් එල්ල කිරීමට හැකියාවක් ඇති බන්ධනාගාර ප්‍රතිසංස්කරණ සහ පුනරුත්ථාපනය සම්බන්ධව හිටපු රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්ත මහතා සම්බන්ධයෙන් ගරු ජනාධිපති තුමාට සුදුසු යැයි හැඟෙන වෙනත් යම් ක්‍රියා මාර්ගයක් ඇත්නම් එය නොපමාව ම ක්‍රියාත්මක කිරීමත්,

සිදු කල යුතු බවට **නිර්දේශ කරමි.**

## 6. තොරතුරු රැස් කල ක්‍රමවේදය

ගරු අධිකරණ අමාත්‍යවරයාගේ 2021 සැප්තැම්බර් මස 23 වන දිනැති ඉගත කී ලිපිය මගින්, ස්වාධීන නිරීක්ෂකවරයෙක් ලෙසට කටයුතු කරමින් බන්ධනාගාර පරිශ්‍රයන් පරීක්ෂා කිරීමටත්, අදාළ පුද්ගලයන්ගෙන් කරුණු විමසා අවශ්‍ය සාක්ෂි සටහන් කර ගැනීමටත්, චෝදනා කරනු ලබන සිද්ධිය සම්බන්ධව පවතින තොරතුරු ලබා ගැනීමටත් මෙකී ඒක පුද්ගල කමිටුවට බලය ලබා දෙන ලදී.

කෙසේ වුවද, වැලිකඩ සහ අනුරාධපුර බන්ධනාගාරයන් සංචාරයන් සම්බන්ධව තොරතුරු රැස් කර කමිටු වාර්තාව ලබා දීම සඳහා මෙම කමිටුවට ලබා දී තිබුනේ මාස 2ක් වැනි කෙටි කාලයකි. එහෙයින්, සිද්ධිය නිරීක්ෂණය කර තිබූ සියළු ම නිලධාරීන්ගෙන් සහ රැඳවියන්ගෙන් සාක්ෂි ලබා ගැනීම සඳහා කාලය ප්‍රමාණවත් නොවිය.

තවද, වැලිකඩ සහ අනුරාධපුර බන්ධනාගාරයන් තුළ සී.සී.ටී.වී කැමරා සවි කර නොතිබුනි. එහෙයින්, ලිඛිත සහ වාචික සාක්ෂි මත පමණක් පදනම්ව තොරතුරු රැස් කිරීමට සිදු විය.

කෙසේ වුවද, සැබැවින් ම සිදු වූයේ කුමක්දැයි සොයා බලා, නිවැරදි නිරීක්ෂණයන්ට එළඹීමට ප්‍රමාණවත් වන පරිදි ඒ ඒ ස්ථානවල රාජකාරි කළ බන්ධනාගාර නිලධාරින්ගෙන් ද, බන්ධනාගාරවල එළිමහනේ ගැවසුණු මෙන් ම සිර මැදිරිවල ද රඳවා සිටි රැඳවියන් බොහෝ දෙනෙකුගේ ද වාචික සාක්ෂි ලබා ගනිමින් තොරතුරු රැස් කිරීමට තීරණය කළෙමි.

මේ අනුව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සංචාරය කිරීම සඳහා යෙදුන බන්ධනාගාරවල ඇතුළු වීම, පිටවීම සිදු කළ ගේට්ටු භාරව සිටි නිලධාරිවරයන්ගෙන් මෙන් ම, ඒ ඒ වාට්ටු අංශ භාර ජේලර්වරුන්ගෙන් ද,

ප්‍රධාන ජේලර්වරුන්ගෙන් ද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තිබූ ඒ ඒ බන්ධනාගාරවල ජේලර්වරුන්, නියාමකයින් සහ රැඳවියන්ගෙන් ද, වැලිකඩ බන්ධනාගාර අධිකාරි සහ සහකාර බන්ධනාගාර අධිකාරිවරයාගෙන් ද, අනුරාධපුර බන්ධනාගාර ප්‍රධානී සහකාර බන්ධනාගාර අධිකාරිවරයාගෙන් ද, අනුරාධපුර බන්ධනාගාර රැඳවියෙකුව පරීක්ෂා කර තිබූ බන්ධනාගාර වෛද්‍යවරියගෙන් ද සාක්ෂි සටහන් ලබා ගෙන තොරතුරු රැස් කරන ලදී. ලබා ගත් සියළුම වාචික සාක්ෂි සංඛ්‍යාව 40 කි.

තවද, මෙම විමර්ශන සභාව ඉදිරියෙහි සාක්ෂි ලබා දුන් සාක්ෂිකරුවන්ට නිදහසේ ස්වාධීන සාක්ෂියක් ලබා දීම සඳහා සාක්ෂි සටහන් කර ගැනීම වැලිකඩ බන්ධනාගාරය තුළ පිහිටි පර්යේෂණ හා පුහුණු විශෝධන මධ්‍යස්ථානයත්, අනුරාධපුර බන්ධනාගාරයෙහි පිහිටි සහකාර බන්ධනාගාර අධිකාරිවරයාගේ කාර්යාලයත් යොදා ගන්නා ලදී. තව ද, සාක්ෂිකරුවන්ට බලපෑමකින් තොරව ස්වාධීනව සාක්ෂි ලබා දීම සඳහා සාක්ෂි සටහන් කිරීම සිදු කරන ලද්දේ ඇතුළත සිදු වන කිසිවක් පිටතට නොපෙනෙන ලෙසටත්, නොඇසෙන ලෙසටත් ය. සාක්ෂි සටහන් කර ගත් අවස්ථාවේදී කාමරය තුළ සිටියේ සාක්ෂිකරුත්, මාත්, ලඝුලේඛිකාවත්, භාෂණ පරිවර්තනයන් සිදු කළ අවස්ථාවල දී භාෂණ පරිවර්තකත් පමණි. එසේ ම සාක්ෂි යතුරුලියනය කර ගැනීම සඳහා විශ්‍රාමික අධිකරණ ලඝුලේඛිකාවක් වූ අයිරාංගනී විජේරත්න මෙනෙවියගේ සහාය ලබා ගන්නා ලද අතර, අනුරාධපුර බන්ධනාගාරයෙහි රාජ්‍ය අමාත්‍යවරයා විසින් සිදු කරන ලද සංචාරයේ දී පීඩාවට සහ හිංසනයට ලක් වූවා යැයි චෝදනා කරනු ලබන රැඳවියන් ද්‍රවිඩ ජාතිකයන් වූ හෙයින්, ඔවුන්ට පහසු සහ තේරෙන භාෂාවකින් නිදහසේ ස්වාධීනව සාක්ෂි ලබා දීම සඳහා අධිකරණයේ හිටපු භාෂණ පරිවර්තක සුප්පයියා කමල් මහතාගේ සහාය ලබා ගන්නා ලදී.

ප්‍රමාණයක් ද නොව, සාක්ෂිකරුවන් සාක්ෂි ලබා දුන් ඒ ඒ අවස්ථාවල දී ම යතුරුලියනය කොට, ඒවායෙහි මුද්‍රිත පිටපත් එම අවස්ථාවේදී ම ලබා ගෙන, සිංහල භාෂාව කියවීමට දන්නා අයවළුන්ට එම මුද්‍රිත පිටපත් කියවා බලා වැරදි ඇතොත් සංශෝධනය කළ පසුව නිවැරැදි බවටත්, සත්‍ය බවටත් පිළි ගෙන, එම අවස්ථාවෙහි දී ම සෑම පිටුවක ම ඔවුන්ගේ අත්සන් යෙදීමට දන්වා, අත්සන් ලබා ගන්නා ලදී. එසේ ම සිංහල කියවීමට නොදත් අයවළුන්ට සාක්ෂි සටහන් කිරීම අවසන් වූ වහාම එහි අඩංගු සියළු ම කරුණු කියවා තේරුම් කර දීමෙන් පසුව, ලබා දුන් සාක්ෂි නිවැරැදිවත්, සත්‍ය ලෙසත් අඩංගුව පවතින බවට පිළි ගෙන ඒ වේලාවේ දී ම ලබා ගත් මුද්‍රිත පිටපත්වල අත්සන් කිරීමට දන්වන ලදී.

බන්ධනාගාර නිලධාරීන්ගේ සහ රැදවියන්ගේ සාක්ෂි සටහන් කිරීම සිදු කළ අවසාන භාගයේ දී, යම් සාක්ෂියක් සහ/හෝ ලේඛනයක් ඇත්නම් ඒවා මා වෙත ඉදිරිපත් කිරීමට රාජ්‍ය අමාත්‍යවරයාට ලිඛිතව දන්වන ලදුව, 2021 ඔක්තෝබර් 18 වන දින වැලිකඩ පර්යේෂණ හා පුහුණු විශෝධන මධ්‍යස්ථානයට හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සාක්ෂි ලබා දීම සඳහා පැමිණි අවස්ථාවේ දී ස්වාධීනවත්, නිදහසේත් සාක්ෂියක් ලබා දීමට ඉඩ සලස්වා එම සාක්ෂිය සටහන් කර ගන්නා ලදී. ඔහු විසින් ඔහු වෙනුවෙන් සාක්ෂි ලබා දීම සඳහා කිසිවෙකු ඉදිරිපත් නොකළ අතරම කිසිදු ලේඛනයක් ද ඉදිරිපත් නොකරන ලදී.

මේ හැරෙන්නට, වැලිකඩ සහ අනුරාධපුර බන්ධනාගාරවල පවත්වා ගෙන යන පොත්පත්වල ඒ ඒ අදාළ දිනයන්හි යොදා ඇති සටහන් ද, බන්ධනාගාරයෙහි පිහිටීමට අදාළ දළ සැලැස්මවල් ද ලිඛිත සාක්ෂි වශයෙන් ලබා ගැනීමට තීරණය කලෙමි.

ඒ අනුව, හිටපු රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්ත මහතා (මින් අනතුරුව හිටපු රාජ්‍ය අමාත්‍යවරයා වශයෙන් හඳුන්වනු ලබයි.) විසින් සංචාරය කරන ලද වැලිකඩ බන්ධනාගාරයත්, අනුරාධපුර බන්ධනාගාරයටත් ගොස් එකී

අමාත්‍යවරයා සංචාරය කරන ලද ස්ථාන නිරීක්ෂණය කොට එහි දළ ගත් ලබා ගන්නා ලදී අනතුරුව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ පැමිණීම පිටවීම ද, සිදු කර තිබූ සංචාරය සම්බන්ධව ද ඒ ඒ බන්ධනාගාරයන්හි තිබූ ලිඛිත සටහන් යොදා තිබූ ලේඛනයන් සියල්ල ම නිරීක්ෂණය ට, ඊට අදාළ සාක්ෂි ද, එහි සත්‍ය පිටපත් ද ලබා ගන්නා ලදී.

**ගත් වාචික සාක්ෂි සහ ලිඛිත සාක්ෂි වල විස්තර පහත වෙයි.**

<u>වැලිකඩ බන්ධනාගාර සිද්ධිය සම්බන්ධව ලබා ගත් වාචික සාක්ෂි</u>

| | තනතුර | නම | සාක්ෂි දුන් දිනය |
|---|---|---|---|
| | බන්. අධිකාරි | යූ.බී.වලිසුන්දර | **2021.10.05** |
| | සහ.බන්.අධිකාරි | වී.රුවන් ප්‍රභාත් | 2021.10.05 සහ 2021.10.13 |
| | ප්‍රධාන ජේලර් | සී.එන්.ප්‍රනාන්දු | 2021.10.05 |
| 4. | දෙ. පෙළ ජේලර් | පී.ඒ.නන්දසිරි ජයසිංහ | 2021.10.04 |
| 5. | බන්. සැරයන් | ඩබ්.එම්.අනිල් වීරසිංහ | 2021.10.04 |
| 6. | බන්.නියාමක | ඩී.යූ.එම්. තිලකරත්න | 2021.10.04 |
| 7. | බන්. නියාමක | යූ.පී.එස්.එන්.කරුණාරත්න | 2021.10.04 සහ 2021.10.18 |
| 8. | බන්. නියාමක | ඒ.ඒ.ආර්.ජී.අතපත්තු | 2021.10.05 සහ 2021.10.18 |
| 9. | වි. කා.බ. උ.පො.ප. | යූ.ඒ.ඩී.ශානුක පෙරේරා | 2021.10.11 |

| | | |
|---|---|---|
| කා.බ. පො.කො. | කේ.ඩී.දිලක්ෂණ අමරසිරි | 2021.10.11 |
| කා.බ. කා.පො කො | එන්.කේ.ඒ.එම්.එස්. සිල්වා | 2021.10.13 |
| ද. පෙළ ජේලර් | කේ.ඒ.ජේ.එස්.කරුණාරත්න | 2021.10.14 |
| න්. නියාමක | ජේ.පී.නිරෝෂ් කුමාර්. | 2021.10.18 |

<u>වැලිකඩ බන්ධනාගාරයේ සිරකරුවන්</u>

| | <u>නම</u> | <u>සිර අංකය</u> | <u>සාක්ෂි දුන් දිනය</u> |
|---|---|---|---|
| 14. | සුනිල් හෙට්ටිආරච්චි | ඩබ්ලිව්. 38633 | 2021.10.05 |
| 15. | එල්.එස්.ප්‍රේමතිලක | එක්ස්.21110 | 2021.10.12 |
| 16. | බී.එල්.සුනිල් | එන්.13519 | 2021.10.12 |
| 17. | යූ.ඒ.උදේශ රුද්‍රිගු | වී.39128 | 2021.10.12 |
| 18. | ඩබ්.කේ.ගුණදාස | එල්.13329 | 2021.10.13 |
| 19. | එම්.ටී.එස්.ප්‍රනාන්දු | යූ.18972 | 2021.10.13 |
| 20. | එම්.ඩී.වික්‍රමසිංහ | ඩබ්ලිව්.40572 | 2021.10.14 |

## වැලිකඩ බන්ධනාගාරයේ ලිඛිත සාක්ෂි

| | ලේඛනය | යොදා ඇති සළකුණ |
|---|---|---|
| 1. | සහකාර බන්ධනාගාර අධිකාරීවරයා විසින් අමුත්තන්ගේ පැමිණීමේ ලේඛනයෙහි 2021.09.06 වන දිනයේ දී යෙදූ සටහනේ සත්‍ය පිටපතක් | "A" |
| 2. | 2021.09.06 වන දින වැලිකඩ බන්ධනාගාරයට හිටපු රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්ත මහතා ඇතුල් වීම සහ පිටවීම සම්බන්ධව වැලිකඩ බන්ධනාගාරයේ ප්‍රධාන දොරටු ලේඛනයේ යොදා ඇති සටහනේ සත්‍ය පිටපතක් | "B" |
| 3. | බන්ධනාගාරය තුළට එන වාහන සම්බන්ධව වැලිකඩ බන්ධනාගාරයෙහි ප්‍රධාන දොරටු ලේඛනයේ 2021.09.06 වන දින ජේලර් රත්නායක විසින් යොදා ඇති සටහනෙහි සත්‍ය පිටපතක් | "B1" |
| 4. | වැලිකඩ බන්ධනාගාරයේ ජේලර්ගේ දින පොතේ 2021.09.06 වන දින හිටපු රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්ත මහතා බන්ධනාගාරයට පැමිණි සහ පිට වූ වේලාව දක්වමින් යොදා ඇති සටහනේ සත්‍ය පිටපතක් | "C" |
| 5. | 2021.09.06 වන දින දිවා සහ රාත්‍රී මුර සේවය සම්බන්ධයෙන් වැපල් අංශයෙහි ප්‍රධාන දොරටු ලේඛනයේ යොදා ඇති සටහනේ සත්‍ය පිටපතක් | "D1" |
| 6. | වැපල් අංශයෙහි ප්‍රධාන දොරටු ලේඛනයේ 2021.09.06 වන දින දිවා සහ රාත්‍රී මුර සේවා රාජකාරි සම්බන්ධයෙන් යොදා ඇති සටහනේ සත්‍ය පිටපතක් | "D2" |

වැපල් අංශයෙහි ප්‍රධාන දොරටු ලේඛනයේ 2021.09.06 වන දින දිවා සහ රාත්‍රී මුර සේවා රාජකාරි සම්බන්ධයෙන් යොදා ඇති සටහනේ සත්‍ය පිටපතක් "D3"

වැපල් අංශයෙහි ප්‍රධාන දොරටු ලේඛනයේ 2021.09.06 වන දින දිවා සහ රාත්‍රී මුර සේවා රාජකාරි සම්බන්ධයෙන් යොදා ඇති සටහනේ සත්‍ය පිටපතක් "D4"

9. වැපල් අංශයෙහි ප්‍රධාන දොරටු ලේඛනයේ 2021.09.06 වන දින දිවා සහ රාත්‍රී මුර සේවා රාජකාරි සම්බන්ධයෙන් යොදා ඇති සටහනේ සත්‍ය පිටපතක් "D5"

10. රාජ්‍ය අමාත්‍යවරයාගේ පැමිණීමට අදාළව 2021.09.06 වන දින වැපල් අංශයෙහි ප්‍රධාන දොරටු ලේඛනයේ යොදන ලද සටහනේ සත්‍ය පිටපතක් "E1"

11. රාජ්‍ය අමාත්‍යවරයා ඇතුල් වීම සහ පිටවීම සම්බන්ධව 2021.09.06 වන දින වැපල් අංශයෙහි ප්‍රධාන දොරටු ලේඛනයේ යොදා ඇති සටහනේ සත්‍ය පිටපතක් "E2"

12. වැලිකඩ බන්ධනාගාරයේ දළ සටහනක් "F"

13. වැපල් අංශයේ දළ සටහනක් "G"

14. හිටපු රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්ත මහතා 2021.09.06 වන දින වැලිකඩ බන්ධනාගාරයට පැමිණීමට අදාළව උ.පො.ප පෙරේරාගේ නියමය පරිදි පො.කො 73859 රත්නායක විසින් යොදා ඇති සටහනේ සත්‍ය පිටපතක් "A"

15. 2020.12.05 වන දින හිටපු රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්ත මහතා වැලිකඩ බන්ධනාගාරයට පැමිණීම සම්බන්ධව යොදා ඇති සටහනේ සත්‍ය පිටපතක් — "X" සහ "X1"

16. 2020.04.20 වන දින හිටපු රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්ත මහතා වැලිකඩ බන්ධනාගාරයට පැමිණීම සම්බන්ධව යොදා ඇති සටහනේ සත්‍ය පිටපතක් — "Y", "Y1 සහ Y2"

17. හිටපු රාජ්‍ය අමාත්‍යවරයා වැලිකඩ බන්ධනාගාරයට ඇතුල් වීම සම්බන්ධව බේස්ලයින් පාරේ සිට වැලිකඩ බන්ධනාගාරයට ඇතුළු වන ගේට්ටුව අසළ තබා ඇති දොරටු ලේඛනයේ 2021.09.06 වන දින යොදා ඇති සටහනේ සත්‍ය පිටපතක් — "Z" සහ "Z1"

- <u>අනුරාධපුර බන්ධනාගාරයේ වාචික සාක්ෂි</u>

| තනතුර | නම | සාක්ෂි දුන් දිනය |
|---|---|---|
| 1. සහ. බන්. අධිකාරි | රොහාන් අජිත් | 2021.10.24 |
| 2. ප්‍රධාන ජේලර් | එල්.එස්.පී.ලියනගේ | 2021.10.25 |
| 3. වෛද්‍ය (බන්.රෝහල) | එස්.එස්.බෝගහවත්ත | 2021.09.30 |
| 4. බන්. සැරයන් | ඩී.එම්.වීරසිංහ | 2021.10.07 |
| 5. දෙ. පෙළ ජේලර් | එස්.එම්.පී.එස්.සිරිවර්ධන | 2021.10.08 |
| 6. දෙ. පෙළ ජේලර් | පී.ලාල් සෝමචන්ද්‍ර | 2021.10.08 |
| 7. දෙ. පෙළ ජේලර් | කේ.ජී.ජයතිලක | 2021.10.08 |
| 8. දෙ. පෙළ ජේලර් | ඩී.එම්.ඒ.ජී.ජේ.අයි.කේ.ධනසේකර | 2021.10.25 |

| | | |
|---|---|---|
| 9. බන්. නියාමක | එන්.එච්.ටී.අයි.නවරත්න | 2021.10.25 |
| 10. බන්. නියාමක | එච්.පී.කේ.දිසානායක | 2021.10.25 |

<u>අනුරාධපුර බන්ධනාගාරයේ රැඳවියන්:</u>

| | <u>නම</u> | <u>සිර අංකය</u> | <u>සාක්ෂි දුන් දිනය</u> |
|---|---|---|---|
| 11. | එම්.සුලක්ෂන් | සැක අංක: 140 | 2021.09.28 |
| 12 | පී.සූරියබාලන් | සැක අංක: 363 | 2021.09.29 |
| 13. | එම්. සුදාකරන් | සැක අංක: 314 | 2021.09.29 |
| 14. | වේලු යෝගරාජා | සිර අංක: ඩබ්.7647 | 2021.09.30 |
| 15. | ආර්.තිරුවරුල් | සැක අංක: 3780 | 2021.09.30 |
| 16. | පී.ආර්.එන්.සංජීව | සිර අංක: වයි 68 | 2021.10.06 |
| 17. | පී.කෝකිලන් | සිර අංක: ආර්.8856 | 2021.10.06 |
| 18. | එච්.ඒ.සුජිත් රෝහණ | සිර අංක: ටී.10519 | 2021.10.06 |
| 19. | ඩී.එම්.ජී.එස්.සමාධි | සිර අංක: වයි.ඉසෙඩ් 162 | 2021.10.07 |
| 20. | එස් .අෆ්රාස් | සිර අංක: ඉසෙඩ්.92 | 2021.10.07 |

<u>අනුරාධපුර බන්ධනාගාරයේ ලිඛිත සාක්ෂි</u>

අනුරාධපුර බන්ධනාගාරයෙහි ප්‍රධාන දොරටුව අසළ තබා ඇති දොරටු ලේඛනයේ 2021.09.12 වන දින යොදා ඇති සටහනේ සත්‍ය පිටපතක් "A"

අනුරාධපුර බන්ධනාගාරයෙහි ප්‍රධාන දොරටුව අසළ තබා ඇති ලේඛනයේ 2021.09.12 වන දින රාජ්‍ය අමාත්‍යවරයා සමග පැමිණි අයවලුන් සම්බන්ධව යොදා ඇති සටහනේ සත්‍ය පිටපතක් "B"

3. 2021.09.12 වන දින අනුරාධපුර බන්ධනාගාරයේ රාත්‍රී සේවා මුර රාජකාරියේ යෙදුනු නිලධාරීන් සම්බන්ධව විස්තර දැක්වෙන ලේඛනයේ සත්‍ය පිටපතක් "B1"

4. අනුරාධපුර බන්ධනාගාරයේ F විශේෂ අංශයෙහි රඳවා සිටි සිර/සැකකරුවන්ගේ විස්තර දැක්වෙන වාර්තාවේ සත්‍ය පිටපතක් "C"

5. අනුරාධපුර බන්ධනාගාරයේ අමුත්තන්ගේ පැමිණීමේ ලේඛනයෙහි හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් 2021.09.12 වන දින යොදා ඇති සටහනේ සත්‍ය පිටපතක් "D"

6. බන්ධනාගාර කොමසාරිස් කොඩිතුවක්කු මහතා අනුරාධපුර බන්ධනාගාරයට පැමිණීමට අදාළව දොරටු සටහන් ලේඛනයේ 2021.09.17 වන දින යොදා ඇති සටහනේ සත්‍ය පිටපතක් "E"

7. අනුරාධපුර බන්ධනාගාරයට මානව හිමිකම් කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් තිදෙනෙකුගේ පැමිණීම සම්බන්ධව 2021.09.15 දින දොරටු සටහන් ලේඛනයේ යොදා ඇති සටහනේ සත්‍ය පිටපතක් "F"

8. සැකකරුවන් වෙනත් බන්ධනාගාර වෙත මාරු කිරීම සම්බන්ධව අනුරාධපුර සහකාර බන්ධනාගාර අධිකාරී විසින් බන්ධනාගාර කොමසාරිස් (මෙහෙයුම්) වෙත 2021.04.12 වන දින යොමු කරන ලද ලිපියේ සත්‍ය පිටපතක්. "G"

9. අනුරාධපුර බන්ධනාගාරයේ 2021.09.12 වන දින එක් එක් වාට්ටුවල රඳවා සිටි රැඳවියන් සම්බන්ධව දැක්වෙන සටහනේ සත්‍ය පිටපතක් "H"

10. අනුරාධපුර බන්ධනාගාරයේ ජේලර්ගේ දින පොතේ 2021.09.12 වන දින හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ සංචාරය සම්බන්ධව යොදා ඇති සටහනේ සත්‍ය පිටපතක් "I"

11. අනුරාධපුර බන්ධනාගාරයෙහි දළ සැලැස්මේ සත්‍ය පිටපතක් "J"

12. අනුරාධපුර බන්ධනාගාරයට ප්‍රධාන පාරේ සිට ඇතුල් වන ගේට්ටුව අසල තබා ඇති ලේඛනයේ 2021.09.12 වන දින එම දොරටුව භාරව සිටි නියාමකවරයා විසින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා පැමිණි සහ පිට වූ වේලාව සම්බන්ධව යොදා ඇති සටහනේ සහතික පිටපතක්. "K"

13. 2021.09.13 වන දින ටී.සූරියබාලන් නමැත්තාට අනුරාධපුර බන්ධනාගාර රෝහලේ වෛද්‍ය බෝගහවත්ත මහත්මිය විසින් ලබා දුන් ප්‍රතිකාර සම්බන්ධව දැක්වෙන බෙහෙත් තුණ්ඩුව "M1"

14. අනුරාධපුර බන්ධනාගාර රෝහලේ වෛද්‍ය බෝගහවත්ත මහත්මිය 2021.09.29 වන දින පී.සූරියබාලන් නමැති රැඳවියාව පරීක්ෂා කොට මෙම කමිටුවට ලබා දෙන ලද වාර්තාව "M"

15. බ.ක.හා පුන. හිටපු රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්ත මහතාට මෙම කමිටුව ඉදිරියෙහි 2021.10.18 වන දින පෙනී සිට සාක්ෂි සහ /හෝ ලේඛන ඉදිරිපත් කරන ලෙස දන්වා 2021.10.14 වන දින යවන ලද නොතීසිය "L"

බන්ධනාගාර කළමණාකරණ සහ පුනරුත්ථාපන හිටපු රාජ්‍ය අමාත්‍ය ලොහාන් එවින්ද්‍ර රත්වත්ත මහතාගේ 2021.10.18 දින සාක්ෂි

## රාජ්‍ය අමාත්‍යවරයාගේ වැලිකඩ බන්ධනාගාර සංචාරය තුළින් අනාවරණය වූ තොරතුරු

හිටපු රාජ්‍ය අමාත්‍යවරයා, වැලිකඩ බන්ධනාගාරයෙහි සිදු කළ සංචාරය සම්බන්ධව තොරතුරු රැස් කිරීමේ දී ප්‍රථමයෙන් ම වැපල් වාට්ටුවෙහි එල්ලුම් ගස තිබූ කාමරය නිරීක්ෂණය කිරීමට ගොස් තිබූ බවටත්, එම කාමරයට යන එන අතරතුර දී දෙපස රඳවා සිටි සිරකරුවන් සමග කථා කර තිබූ බවටත්, අනතුරුව දුරකථන කුටි පිහිටි ස්ථානයට ගොස් එතන ද මඳ වේලාවක් රැඳී සිට බන්ධනාගාර අධිකාරිවරයාගේ කාර්යාලයට ද ගොස් එහි ද සුළු වේලාවක් ගත කර ආපසු පිටව ගොස් තිබූ බවටත් මෙම කමිටුවට තොරතුරු අනාවරණය විය.

එසේම, වැලිකඩ බන්ධනාගාරයේ සංචාරය කිරීම සඳහා රාජ්‍ය අමාත්‍යවරයා ගොස් තිබුනේ, 2021.09.06 වන දින සවස් භාගයේ දී බවට ලබා ගත් සියළු ම සාක්ෂි මගින් අනාවරණය විය. එම කරුණ හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ද කිසිදු හබ කිරීමකින් තොරව පිළි ගන්නා ලදී.

එසේ වුව ද, රාජ්‍ය අමාත්‍යවරයා වැලිකඩ බන්ධනාගාරයට ඇතුළු වූ වේලාව සම්බන්ධව ඉදිරිපත් වූයේ පරස්පර විරෝධී වූ සාක්ෂි ය.

a) පැමිණි සහ පිට වූ වේලාව

ප්‍රධාන පාරක් වූ බේස්ලයින් පාරේ සිට වැලිකඩ බන්ධනාගාරයට ඇතුළු වීම සඳහා පිහිටුවා ඇති බැරියර් එක අසළ වූ ගේට්ටුවේ රාජකාරි සිදු කරන ලද දෙවන පෙළ ජේලර්වරයෙකු වූ කෝට්ටේගංගොඩ අප්පල්ලගලගේ ජානක සංජීව කරුණාරත්න නම් නිලධාරියාත්, එකී ගේට්ටුව විවෘත කරන රාජකාරියෙහි යෙදී සිටි බන්ධනාගාර නියාමක අතපත්තු ආරච්චිලාගේ රවීන්ද්‍ර ගයාෂාන් අතපත්තුගේත් සාක්ෂිය වූයේ, රාජ්‍ය ඇමතිවරයා කළු පැහැති අඳුරු වීදුරු සහිත වාහනයකින් බේස්ලයින් පාරේ සිට බන්ධනාගාරයට 2021.09.06 වන දින සවස 4.30ට පමණ ඇතුළු වී, බන්ධනාගාරයට ඇතුළු වීමට ඇති කළු පැහැති ප්‍රධාන ලෑලි දොරටුව අසළ වාහනය නවතා තැබූ බවයි. (2021.10.14 වන දිනැති ජේලර් ජනක සංජීව කරුණාරත්නගේ සාක්ෂි - 2 පිටුව සහ නියාමක අතපත්තුගේ සාක්ෂි - 1 පිටුව)

මේ හැරෙන්නට එකී බැරියර් එක අසළ බන්ධනාගාරයට ඇතුළු වන, පිටවන වාහන තොරතුරු ලියා තබමින් පවත්වා ගෙන යනු ලබන ලේඛනය ද ඉදිරිපත් කරමින් 2021.09.06 වන දින යොදන ලද සටහන් අඩංගු පිටුවේ සත්‍ය පිටපතක් “Z” වශයෙන් සළකුණු කර ඉදිරිපත් කරන ලදී. එහි “බන්ධ ඇමති තුමා සමග වාහන 4ක් වැලිකඩ බන්ධයට වේලාව 4.30 පී.එම්” වශයෙන් දැක්වෙන අතර, එම සටහන “Z1” ලෙසට සළකුණු කරන ලදී.

කෙසේ නමුත්, එකී ලේඛනයෙහි සාමාන්‍යයෙන් එදිනෙදා යොදා ඇති සටහන් අවසානයෙහි, පසු දින සටහන් යෙදීම ආරම්භ කිරීමට පෙර, පේළියක් හිස්ව තැබීම සිදු කර තිබුනත්, 2021.09.06 වන දින අවසන් සටහන ලෙසට යොදා ඇති රාජ්‍ය අමාත්‍යවරයාගේ පැමිණීමේ සටහනට පසුව එකී හිස් පේළිය නොතබාම 2021.09.07 වන දින සටහන යොදා ඇති

බවට ඉහත කී දෙවන පෙළ ජේලර් සංජීව කරුණාරත්නට පෙන්වා දුන් අවස්ථාවේ දී, එම වෙනස ඔහුට ද දැකිය හැකි බවටත්, ඒ අනුව, ඇමතිවරයාගේ පැමිණීම සම්බන්ධව යොදන ලද සටහන එම අවස්ථාවේ දී ම නොව, පසු අවස්ථාවක යොදා ඇති බවට යමෙකුට මතයක් ගොඩ නැගීමට හැකියාව පවතින බවටත් පිළි ගන්නා ලදී. (2021.10.14 වන දින සාක්ෂි - 5 සහ 6 පිටුව)

එපමණක් ද නොව, ඉහත කී "පැමිණීම" සම්බන්ධව "Z1" සටහන යොදන ලද, ඉහත කී බන්ධනාගාර නියාමක අතපත්තු ආරච්චිලාගේ රවීන්ද්‍ර ගයාෂාන් අතපත්තුව මෙම කරුණ විමසා බැලීම සඳහා නැවතත් සාක්ෂියට කැඳවූ අවස්ථාවේ දී, එකී සටහන තමන් යෙදූවේ ඇමතිවරයාගේ පැමිණීම සිදුවූ අවස්ථාවේ දී නොවන බවටත්, පසු අවස්ථාවක දි බවටත් පිළි ගෙන, එසේ සිදු කළේ, රාජ්‍ය අමාත්‍යවරයා පැමිණි අවස්ථාවේ දී එම සටහන යෙදීමට නොහැකි වූ නිසා යැයි පවසමින්, 2021.09.07 වන දිනයේ දී සටහන් යෙදූවාටත් පසුව 2021.09.06 වන දින හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ පැමිණීමේ සටහන යොදන ලද බවටත් පිළි ගන්නා ලදී. (2021.10.14 වන දින සාක්ෂි - 1 සහ 2 පිටු)

මෙම අවස්ථාවේ දී එලෙස ප්‍රමාද වී සටහන් යෙදීමට තුඩු දුන් හේතුව කුමක්දැයි විමසූ විට දී "ඇමති තුමාගේ වාහනයත් එක්ක වාහන 4ක් ආවා. රාජ්‍ය ඇමති තුමාගේ වාහනය ආවාට පස්සෙ එතැන කට්ටිය පිරුණා. උසස් බන්ධනාගාර නිලධාරීන් ද ඒ වාහන එක්ක ආවා. ඒක නිසා එදා සටහන් යොදන්න අතපසු වුනා. පසු අවස්ථාවක තමයි ඒ සටහන් යොදන්න මතක් වුනේ" යනුවෙන් පමණක් නොව, පිටවීමේ සටහන් ද ලියන්න අතපසු වූ බවට සාක්ෂියක් දෙන ලදී. (2021.10.18 වන දින සාක්ෂි - 2 පිටුව)

"Z" ලේඛනයත් "Z1" සටහනත් නිරීක්ෂණය කිරීමේ දී පෙනී යන්නේ 2021.09.06 වන දිනට අවසාන සටහන වශයෙන් ඇත්තේ "Z1" සටහන පමණක් බවයි.

"අකපත්තු" නැමැති සාක්ෂිකරු පවසන අන්දමට හිටපු රාජ්‍ය අමාත්‍යවරයා පැමිණි අවස්ථාවේ දී උසස් නිලධාරීන්ගේ වාහන පැමිණි කරුණ සත්‍ය වශයෙන් ම 'විය හැක්කක්' වන බැවින්, එය සත්‍යයක් ලෙසට පිළි ගත හැකි වුවත්, එකී කිසිදු නිලධාරියෙකු පැමිණි වාහනයක තොරතුරක් සහ/හෝ "Z1" හි දැක්වෙන සටහනට අමතරව වෙනත් කිසියම් හෝ තොරතුරක් රාජ්‍ය අමාත්‍යවරයා පැමිණ තිබූ 2021.09.06 වන දිනයේදි යොදා නැත. මෙකී නියාමකවරයා ලබා දුන් සාක්ෂි අනුව ඔහුට මෙදින යෙදී තිබූ රාජකාරිය වූයේ ප්‍රධාන පාරේ සිට බන්ධනාගාරයට ඇතුළු වන, පිටවන වාහනවලට යාමට ඒමට ඉඩ දීම පමණි. එහෙයින්, මෙකී නියාමකවරයා කාර්ය බහුල වූ බවට යම් නිගමනයකට පැමිණිය නොහැක.

ඉහත සියළු කරුණු සළකා බැලීමේ දී 'පසුව යොදන ලද' මෙකී සටහනෙහි අඩංගු තොරතුරු අප්‍රමාදීභාවයෙහි පරික්ෂණයෙන් අසමත් වන, අවශ්‍යතාවයන් මත වෙනස් කළ හැකි සටහනක් වන හෙයින් ද, සත්‍ය වේලාව කුමක්දැයි නිවැරැදිව නිරීක්ෂණය කර යොදන ලද සටහනක් නොවන හෙයින් ද, එහි අඩංගු කරුණු නිවැරැදි සහ සත්‍ය තොරතුරක් වන බවට පිළි ගැනීමට අපහසුය.

එපමණක් ද නොව, ඉහත කී බැරියර් එකට අඩි 151කින් ('F' ලේඛනය අනුව) පසුව මුණ ගැසෙන අනෙක් දොරටුව වූ වැලිකඩ බන්ධනාගාරයට ඇතුළු වීම සඳහා පවතින, ලැලිවලින් සකසන ලද, කළු පැහැ ගැන් වූ බන්ධනාගාරයේ ප්‍රධාන දොරටුව භාර නිලධාරියා වූ බන්ධනාගාර සැරයන් 'වීරසිංහ මුදියන්සේලාගේ අනිල් වීරසිංහ' විසින් ලබා දුන් සාක්ෂිය වූයේ 2021.09.06 වන දින ප.ව.4.45ට පමණ පාර ළඟ තිබෙන බැරියර් එකෙන් තමාට කථා කොට හිටපු රාජ්‍ය අමාත්‍යවරයා පැමිණි බවට ලද දැන්වීම, ඔහු විසින් බන්ධනාගාර අධිකාරිවරයා වූ යූ.බී.වලිසුන්දරටත්, ප්‍රධාන ජේලර්වරයා වූ රංගන පෙරේරාටත්, සැරයන් ප්‍රියන්තටත් දැනුම් දුන් බවයි. (2021.10.04 වන දින අනිල් වීරසිංහගේ සාක්ෂි - 3 පිටුව)

ම හැරෙන්නට, ප්‍රධාන දොරටුව අසළ පවත්වා ගෙන යනු ලබන "ප්‍රධාන දොරටු පොතෙහි" 'පිටතින් පැමිණෙන නිලධාරීන් 2021-09-06 දින' යටතේ යොදා ඇති සහ "B" වශයෙන් සළකුණු කර ඇති සටහන ද මෙම සාක්ෂිකරු විසින් පරීක්ෂා කරමින්, එහි ලොහාන් රත්වත්ත මැතිතුමාගේ ඇතුල් වීම සවස 5.00 ලෙසටත්, බ.කො.ජනරාල් උපුල්දෙණිය මහතාගේ ඇතුල් වීම සවස 5.15 ලෙසටත්, මූලස්ථාන අධිකාරි ලාහිරු ගේ ඇතුල් වීම සවස 5.10 ලෙසටත්, බුද්ධි අධිකාරි ප්‍රභාත්ගේ ඇතුල් වීම සවස 5.10 ලෙසටත්, ප්‍රධාන ජේලර් වජිරගේ ඇතුල් වීම සවස 5.15 ලෙසටත්, බුද්ධි ප්‍රධාන ජේලර් නාමල්ගේ ඇතුල් වීම 5.15 ලෙසටත් සටහන්ව ඇති බවට පමණක් නොව, රත්වත්ත රාජ්‍ය ඇමතිවරයාගේ ඇතුල් වීමේ සටහනේ වේලාව දැක්වෙන 5.00 හි ඇති බිංදු දෙක වෙනසකට භාජනය කරමින් සටහන් කර ඇති බවටත්, එම බිංදු දෙක වැරදියට ලියවුණු බවටත් පිළි ගෙන ඇත. (2021.10.04 වන දින සාක්ෂි - 10 පිටුව)

එපමණක් ද නොව, ප්‍රධාන ලෑලි දොර පසු කර ගෙන අඩි 270 ක් ('F' ලේඛනය අනුව) යා යුතු වැපල් අංශයෙහි පවත්වා ගෙන යනු ලබන "E3" වශයෙන් සළකුණු කර ඇති ප්‍රධාන දොරටු ලේඛනයෙහි 28 වන පිටුවෙහි ඉහත කී ලොහාන් රත්වත්ත, උඩුවර, ලාහිරු, ප්‍රේමතිලක සහ ප්‍රභාත්, වජිර, නාමල් යන සියළු මහත්වරුන් ගේ වැපල් අංශයට ඇතුළු වීම දක්වා ඇත්තේ 4.55ට බවටත්, උපුල්දෙණිය මහතාගේ ඇතුළු වීම ඇත්තේ 5.10ට බවටත් මෙම සාක්ෂිකරු පිළි ගෙන ඇත. (2021.10.04 වන දින සාක්ෂි - 10 පිටුව)

එසේම, "B1" වශයෙන් සළකුණු කර ඇති ප්‍රධාන දොරටු ලේඛනයෙහි බන්ධනාගාරය තුළට එන වාහන සම්බන්ධව සටහන් යොදා ඇති ස්ථානයෙහි, "බන්ධනාගාර ඇමති තුමා ඇතුළු ආරක්ෂක නිලධාරීන්" යනුවෙන් දක්වමින් "ඇතුල් වීම" යටතේ 5.30 ලෙසට සඳහන් කර ඇති බවටත්, එහි ද "3" ඉලක්කම වෙනස් කර ඇති බවටත් පිළි ගනිමින්, ඊට

හේතුව ලෙසට "මම හිතලා ඒක දැම්මේ, නිකම් සටහනක් දැම්මේ" යනුවෙන් සාක්ෂි ලබා දී ඇත. (2021.10.04 වන දින සාක්ෂි - 12 පිටුව)

තව ද, "වාහනය ඇතුල් වුනේ 5.30ට කියලා ද හිතන්නේ" යනුවෙන් විමසූ විට "ඇතුල් වුනේ නැහැ, එදා ඇමති තුමා ආව වාහනය නිසා අංකය නිකම් ලියලා තිබ්බා. වාහනය ආපු වෙලාව මම හරියට ම දන්නේ නැහැ. ඒ නිසායි 5.30 ඒ විදියට දැම්මේ" යනාදී වශයෙන් සාක්ෂියක් ලබා දී ඇත. (2021.10.04 වන දින සාක්ෂි - 12 සහ 13 පිටු)

ඉහත කී 'වීරසිංහ' නැමැති සාක්ෂිකරුගේ සාක්ෂි සළකා බැලීමේ දී නිවැරදි තොරතුරු ඇතුළත් කරමින් වගකිව යුතු නිලධාරියෙකු ලෙස කටයුතු කර නොමැති බවට පැහැදිලි වෙයි.

එපමණක් ද නොව, ඉහත සාක්ෂි වලට අනුව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සිය මෝටර් රථයෙන් ප්‍රධාන පාරේ සිට බන්ධනාගාරයට සවස 4.30ට ඇතුළුවී, ප්‍රධාන ගේට්ටුවේ ලෑලි දොර අසළ වාහනය නවතා, බන්ධනාගාරය තුලට පයින් ගොස් ඇත. එවිට වේලාව සවස 5.00 ය. ඒ අනුව, බැරියර් එකේ සිට ප්‍රධාන ගේට්ටුවට යාමට පැය ½ක් ගතවී ඇත. එනමුදු, බැරියර් එක අසල සිට ගේට්ටුවටම ඇත්තේ අඩි 151ක් වැනි ඉතා කෙටි දුරකි. එහෙයින් එකී දුර ගමන් කිරීමට පැය ½ක් ගත වූවා යැයි පවතින සාක්ෂිය කෙසේවත් 'විය නොහැකි' බැවින් බන්ධනාගාර නිලධාරීන් අසත්‍ය සාක්ෂිය ලබා දෙමින් කරුණු වසන් කරන බවට තොරතුරු අනාවරණය වෙයි.

එමෙන් ම "B" ලේඛනයට අනුව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සිටි බන්ධනාගාර ප්‍රධාන ලෑලි දොර ආසන්නයට සියළු ම බන්ධනාගාර නිලධාරීන් එක් රැස් වෙන කොට වේලාව සවස 5.15 වී ඇත. අනතුරුව ඔවුන් සියළු දෙනා ම එකට වැපල් අංශයට ගොස් ඇත. එනමුදු වැපල් අංශයෙහි පවත්වා ගෙන යනු ලබන "E3" ලේඛනයට අනුව ඔවුන් වැපල් අංශයට ඇතුළු වී ඇත්තේ සවස 4.55ට ය. මෙයද , 'විය නොහැකි' බැවින්,

හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ඇතුළු පිරිස සවස 4.55ට වැපල් අංශයට ඇතුළු වූවා යැයි යොදා ඇති සටහන ද සම්පූර්ණයෙන් ම අසත්‍යය තොරතුරක් බවට පෙනී යයි .

තවද, වසර 23ක සේවා කාලයක් ඇති වැලිකඩ බන්ධනාගාරයෙහි ප්‍රධාන ජේලර්වරයා වූ චක්‍රවර්තිගේ නිශාන්ත ප්‍රනාන්දුගෙන් ද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා වැපල් අංශයට පැමිණි වේලාව ප්‍රශ්න කිරීමේ දී ලබා දුන් සාක්ෂිය වූයේ සවස 4.55ට බවය. (2021.10.05 වන දින සාක්ෂි - වේලාව 1.35යි. - 1 වන පිටුව)

මෙම නිලධාරිවරයා විසින්, ප්‍රධාන දොරටු පොතේ 2021.09.06 වන දින යොදා ඇති සටහන් දැක්වෙන, "B1" සහ "B2" ලේඛනයන් ද, භාර ගැනීමේ ජේලර්වරයා වූ 'ලක්මාල්' විසින් හිටපු රාජ්‍ය ඇමතිවරයා සහ ඔහු සමග සිටි පිරිසත්, බන්ධනාගාර උසස් නිලධාරීන් බන්ධනාගාරය තුළට පැමිණීම සහ පිටවීම දක්වන ලද 'ජේලර් දින පොතේ' සටහන් දැක්වෙන 'සී' ලේඛනය ද, 2021.09.06 වන දින වැපල් අංශයෙහි රාජකාරි යෙදවීම් සම්බන්ධව සටහන් අඩංගු 'D1', 'D2', 'D3', 'D4', 'D5' යන ලේඛනයන් ද, වැපල් අංශයෙහි 2021.09.06 වන දින රාජ්‍ය අමාත්‍යවරයා ඇතුළු පිරිස ද උසස් නිලධාරීන්ගේ ද පැමිණීම පිටවීම යොදන ලද සටහන් අඩංගු 'E1' සහ 'E2' ලේඛනයන් ද, ඔහු විසින් සකස් නොකළ මුත්, එකී සියළු ලේඛන ඔහු විසින් නිරීක්ෂණය කළ බවට පැහැදිලි සාක්ෂියක් ලබා දී ඇත. (2021.10.05 වන දින සාක්ෂි ප.ව.1.35 - 2 පිටුව)

මේ අනුව, පහළ නිලධාරීන් විසින් කුමන සටහනක් යෙදුවද, එම සටහන් නිරීක්ෂණය කර තිබූ ජ්‍යෙෂ්ඨ නිලධාරියා විසින්ද, 'හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ' පැමිණීමේ වේලාව සම්බන්ධව යොදන ලද සටහන් සත්‍ය නොවන බවට පෙනී පෙනීත්, ඒවා නිවැරැදි කිරීමට උත්සාහ දරා නොතිබූ බවට පැහැදිලි වෙයි.

මෙ හැරෙන්නට, 2021.09.06 වන දින වැපල් අංශයෙහි රාජකාරි කළ බන්ධනාගාර නියාමක දේවගේ උමේෂ් මධුශාන් තිලකරත්න යන නිලධාරියා විසින් වැපල් අංශයෙහි සිර මැදිරි වැසීමට සූදානම් කර තිබිය දී සවස 4.55ට පමණ හිටපු රාජ්‍ය අමාත්‍යවරයා පැමිණි බවට පවසද්දී, (2021.10.04 වන දින සාක්ෂි - 1 වන පිටුව) වැපල් අංශයෙහි සවස වැසීමේ ජේලර්වරයා ලෙසට 2021.09.06 වන දින රාජකාරි කර තිබූ පන්නල අප්පුහාමිල්ලාගේ නන්දසිරි ජයසිංහ විසින්, මෙදින, සී.3 අංශයෙහි දෙපැත්තෙහි සිටි රැඳවියන් සමග රාජ්‍ය අමාත්‍යවරයා කථා කළේ, ඔවුන් සිර මැදිරිවල රඳවා සිටිය දී බවටත්, මෙම රැඳවියන්ව සවස 5.00 ට විතර සිර මැදිරිවලට දමා තිබිය දී බවටත්, සිර මැදිරි යතුරු දැමූ පසුව නැවත නොඇරිය බවටත් පවසා ඇත. (2021.10.04 වන දින සාක්ෂි - 1 සිට 3 දක්වා පිටු)

එසේ ම, 2021.09.06 වන දින වැපල් අංශයෙහි කාර්ය භාර නිලධාරි වශයෙන් රාජකාරි කර තිබූ බන්ධනාගාර නියාමක උතුවන් පතිරන්නැහැලාගේ සමන්ත නාමල් කරුණාරත්න යන නිලධාරි විසින් ද සාක්ෂි දී ඇත්තේ, සාමාන්‍යයෙන් සිරකරුවන් සවස 5.00 පමණ වන තෙක් එළියේ සිටින බවටත්, සවස 5.00ත් - 5.05ත් අතර ඔවුන්ව ගණන් කර සිර මැදිරිවලට දමන බවටත්, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා වැපල් අංශයට පැමිණෙන විට කිසිදු සිරකරුවෙක් එළියේ නොසිටි බවටත් ය. (2021.10.04 වන දින සාක්ෂි 1, 2 සහ 3 පිටු)

මේ අනුව, උමේෂ් මධුශාන් නැමැති සාක්ෂිකරු විසින් රාජ්‍ය අමාත්‍යවරයා සවස 4.55ට පැමිණි බවට ඒත්තු ගැන්වීම සඳහා සිරකරුවන් සිටියේ සිර මැදිරිවලට දැමීමට සූදානම් කර යැයි සාක්ෂියක් ලබා දෙද්දී, නාමල් කරුණාරත්න නැමැති සාක්ෂිකරු විසින් රාජ්‍ය අමාත්‍යවරයා පැමිණෙද්දී සිරකරුවන් සිටියේ සිර මැදිරිවල බවටත්, ඒ වන විට ඔවුන්ව ගණන් කිරීම පවා අවසන් කර තිබූ බවටත් පවසමින් පරස්පර විරෝධී අන්දමට සාක්ෂි ලබා දී ඇති බවට තොරතුරු අනාවරණය වෙයි.

තවද, වැලිකඩ බන්ධනාගාරයෙහි ප්‍රධාන ලෑලි ගේට්ටුව අසළ රැඳවියන් පරීක්ෂා කිරීමේ රාජකාරිවල යෙදී සිටිය විශේෂ කාර්ය බලකායේ උප පොලිස් පරීක්ෂකවරයෙකු වූ 'උස් හෙට්ටිගේ අයේෂ් දූෂාන් ශානුක පෙරේරා' ගෙන් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා බන්ධනාගාරයට පැමිණියේ කීයට දැයි විමසීමේ දී පවසා සිටියේ, සවස 5.00ට ප්‍රධාන ගේට්ටුව අසළ සිටි නිලධාරීන්ගේ කලබලකාරී ස්වරූපය ගැන විමසීමේ දී හිටපු රාජ්‍ය අමාත්‍යවරයා පැමිණ ඇති බවට ප්‍රථමයෙන් දැන ගන්නට ලැබුණු බවටත්, අනතුරුව මඳ වේලාවකට පසුව රාජ්‍ය අමාත්‍යවරයා තවත් බන්ධනාගාර නිලධාරීන් කණ්ඩායමකුත් සමග පැමිණෙනු බව දුටු බවටත්ය. (2021.10.11 වන දින සාක්ෂි - 2 පිටුව)

මේ හැරෙන්නට, මෙම සාක්ෂිකරුගේ උපදෙස් පරිදි 2021.09.06 වන දින උ.පො.කො.73857 - රත්නායක විසින් ඊට අදාළව තොරතුරු පොතේ සටහනක් ද යෙදුව බවට මෙම සාක්ෂිකරු පවසමින් එම සටහනෙහි සත්‍ය පිටපතක් "A" වශයෙන් සළකුණු කර ඉදිරිපත් කර ඇත. (2021.10.11 වන දින සාක්ෂි - 2 සහ 4 පිටු)

මෙම සාක්ෂිය සනාථ කරමින් 'කළුපහනගේ දිලීප දිලක්ෂණ අමරසිරි' නැමැති විශේෂ කාර්ය බලකායේ පොලිස් කොස්තාපල්වරයා ද සාක්ෂි දෙමින් සවස 5.00ට පමණ රාජ්‍ය අමාත්‍යවරයා බන්ධනාගාරයට ඇතුළු වූවා යැයි පවසා ඇත. (2021.10.11 වන දින සාක්ෂි - ප.ව.2.30 - 2 පිටුව).

එසේ වුව ද, වැපල් අංශයෙහි පිහිටි සී.3 විශේෂ අංශයට ඇතුළු වූ විට, වම්පසින් පළමුවෙන් ම හමු වෙන කාමර අංක: 102 හි මරණ දඬුවමක් විඳින සහ ඒ අවට සැරිසැරීමට අවකාශය තිබූ කාමර පාටියේ සිරකරුවෙකු වූ 'ලියනගේ සුසිල් ප්‍රේමතිලක' ලබා දුන් සාක්ෂියට අනුව හිටපු රාජ්‍ය අමාත්‍යවරයා 2021.09.06 වන දින වැපල් අංශයට පැමිණ ඇත්තේ සවස 5.30ටත්, 6.00ටත් අතරය. (2021.10.12 වන දින සාක්ෂි - පෙ.ව.11.45 - 2 පිටුව)

එසේ ම එල්ලුම් ගහ තිබෙන කාමරයට යාබද කාමරයෙහි මරණ දඬුවමක් විඳින කාමර අංක: 81 හි රඳවා ඇති 'මාරසිංහගේ තුෂාර සම්පත් ප්‍රනාන්දු' විසින් ද හිටපු රාජ්‍ය අමාත්‍යවරයා 2021.09.06 වන දින ඔහුගේ කාමරය ළඟට ආවේ සවස 5.00ත්, 5.30ටත් අතර බවට පවසා ඇත. (2021.10.13 වන දින සාක්ෂි - ප.ව.12.30 - 1 පිටුව)

මේ හැරෙන්නට, එල්ලුම් ගහ පිහිටි කාමරය ආසන්නව පිහිටි සිර මැදිරියක් වූ කාමර අංක: 93 හි මරණ දඬුවමක් විඳින 'බරණිවල ලියනගේ සුනිල්' නැමැත්තා ලබා දුන් සාක්ෂියට අනුව හිටපු රාජ්‍ය අමාත්‍යවරයා එම කාමරය ආසන්නට පැමිණ ඇත්තේ සවස 5.15ට පමණ ය. (2021.10.12 වන දින සාක්ෂි - ප.ව.1.30 - 2 පිටුව)

එම කාමරයට කාමර 3ක් ඉදිරියෙන් පිහිටි කාමර අංක: 90 හි මංකොල්ල කෑමේ වරදකට සිර දඬුවම් විඳින 'උඩුගොඩගේ අනුර උදේශ රුද්‍රී'ගු ලබා දුන් සාක්ෂියට අනුව අනාවරණය වන්නේ හිටපු රාජ්‍ය අමාත්‍යවරයා පැමිණ ඇත්තේ සවස 5.00ත්, 5.15ත් අතරය. (2021.10.12 වන දින සාක්ෂි ප.ව.2.40 - 2 පිටුව)

ස්ත්‍රී දූෂණ නඩුවක් සඳහා වසර 16ක සිර දඬුවමක් විඳින හා බන්ධනාගාර භූමිය තුළ අවට සැරිසැරීමේ නිදහස පවතින, විශේෂ සිරකරුවෙකු වූ 'මුතුඇඳුරලාගේ දිනුක වික්‍රමසිංහ' නම් වූ සාක්ෂිකරු ලබා දුන් සාක්ෂියට අනුව හිටපු රාජ්‍ය අමාත්‍යවරයා පැමිණ ඇත්තේ 5.35ට පමණය. (2021.10.14 වන දින සාක්ෂි - ප.ව.12.05 - 1 වන පිටුව)

තවද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා පැමිණි වේලාව සම්බන්ධව බන්ධනාගාර නිලධාරීන් සහ මෙම සාක්ෂිකරු ලබා දුන් සාක්ෂි අතර විශාල පරස්පරතාවයක් පවතින හෙයින්, මා විසින් මෙම සාක්ෂිකරුගෙන් "ඔබට ඒ වෙලාව 5.35 කියලා හිතුනේ කොහොමද?" යැයි ප්‍රශ්න කළ අතර, ඊට "හිර ගෙදර වහන්න බෙල් එක ගහනවා 5.00ට. ඊට පස්සෙ නිලධාරීන්ගේ

පෙරෙඩ් එක ගන්නවා මහ ගේට්ටුවේ ජේලර් මහත්තයා. ඒ පෙරෙඩ් එකට විනාඩි 5ක්, 10ක් යන්න ඇති. ඊට පස්සෙ ජේලර් මහත්තුරු ලොන්ඩ්‍රි සයිඩ් පැත්තට ගියා. ඒ පැත්තෙ තියෙන හිර ගෙවල් වහන්න. ඒ පැත්ත වහන කොට 5.35 විතර වෙනවා. එහෙම හිතලයි වෙලාව කිව්වේ." යැයි පවසා ඇත. (2021.10.14 වන දින සාක්ෂි - ප.ව.12.15 - 2 පිටුව)

එපමණක් ද නොව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ප්‍රථමයෙන් චැපල් අංශයට ගොස් අනතුරුව දූරකථන කුටිය අසළට පැමිණ එහි ද ටික වේලාවක් ගත කර, අනතුරුව බන්ධනාගාර අධිකාරිවරයාගේ කාර්යාලයට ද ගොස්, බන්ධනාගාරයෙන් පිටවීම සඳහා සිය වාහනය බන්ධනාගාර භූමියට ගෙන් වූ බවට වැලිකඩ බන්ධනාගාර අධිකාරි සහ සහකාර බන්ධනාගාර අධිකාරිවරයාගේ සාක්ෂි මගින් හෙළිදරවු වීමක් සිදුව තිබූ හෙයින් (පිළිවෙලින් 2021.10.05 වන දින සාක්ෂි පෙ.ව.8.30 - 5 පිටුව සහ 2021.10.05 වන දින සාක්ෂි පෙ.ව.10.55 - 1 සිට 4 පිටු) මෙම සාක්ෂිකරු හිටපු රාජ්‍ය අමාත්‍යවරයාව දුටුවේ දූරකථන කුටි පිහිටි ස්ථානයට ද ගොස් අවසානයේ දී බන්ධනාගාරයෙන් පිටව යාමට ආසන්න අවස්ථාවේ දී දැයි යන්න සළකා බැලීම සඳහා ද "දූරකථන කුටි තිබෙන තැනට ඇමති තුමා යනවා තමන් දැක්කාද?" යනුවෙන් ප්‍රශ්න කළ අතර, ඊට පිළිතුරු වශයෙන් "ඒ පැත්තට යනවා දැක්කා" යැයි ද, "එවිට වේලාව 5.55ට විතර" යැයි ද, "සර්ලා යන කොට මම පස්සෙන් ගියා. පස්සෙන් ගිහිල්ලා මම එතන හිටියා. ඉන්න කොට ෆෝන් බූත් එකට සර් නැග්ගා. එතන ඉන්නවා පාටි කුමාර කියලා එක්කෙනෙක්" යනුවෙන් පමණක් නොව, "ඇමති තුමා බන්ධනාගාරයෙන් පිටව ගිය වේලාව ප.ව.6.20ට වගේ" යැයි ද සාක්ෂියක් ලබා දෙමින් පිටව ගිය වේලාව ද සඳහන් කර ඇත. (2021.10.14 වන දින සාක්ෂි - ප.ව.12.05 - 3 පිටුව)

මේ අනුව මෙම සාක්ෂිකරු හිටපු රාජ්‍ය අමාත්‍යවරයාව දුටුවේ බන්ධනාගාරයෙන් පිටව යාම සඳහා පැමිණි අවස්ථාවේ දී යැයි යම් මතයක් ගොඩ නැගිය නොහැක.

ඉහත කී සියළු සාක්ෂි සළකා බැලීමේ දී, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා වැලිකඩ බන්ධනාගාරයට පැමිණියේ 2021.09.06 වන දින ප.ව.4.30, ප.ව.4.55 සහ ප.ව.5.00 යැයි සඳහන් කරමින්, ප.ව.5.30ට පෙර පැමිණි බවට ඒත්තු ගැන්වීමට, වැලිකඩ බන්ධනාගාර නිලධාරීන් විසින් අසත්‍ය ලේඛන ද සකසමින් උත්සාහයක් ගෙන තිබූ බවට පෙනී ගියත්, වැලිකඩ බන්ධනාගාරයෙහි රැඳවියන්ගේ සාක්ෂිවලට අනුව හිටපු රාජ්‍ය අමාත්‍යවරයා බන්ධනාගාරයට පැමිණ ඇත්තේ සවස 5.00න් පසුව බවටත්, එම වේලාව සවස 5.30ට ආසන්න වේලාවක් වන බවටත් අනාවරණය වෙයි.

මේ හැරෙන්නට, මෙම ඒක පුද්ගල කමිටුව ඉදිරියෙහි කිසියම් සාක්ෂියක් ලබා දීමට සහ/හෝ ලේඛනයක් ඇත්නම් ඉදිරිපත් කිරීමට බන්ධනාගාර හිටපු රාජ්‍ය අමත්‍ය ලොහාන් රත්වත්ත මහතාට කළ දැන්වීම මත, 2021.10.18 වන දින සාක්ෂියක් ලබා දීමට ඉදිරිපත් වූ අවස්ථාවේ දී, 2021.09.06 වන දින වැලිකඩ බන්ධනාගාරයට පැමිණියේ කීයට පමණ දැයි විමසූ විට දී, පළමුවෙන් ම "මට මතකයේ හැටියට සවස 4.00ට පමණ" යැයි පවසා ඇත. මා විසින් නැවතත්, "එම වේලාව 4.30 විය හැකි ද?" යනුවෙන් විමසූ විට දී "විය හැකියි" යනුවෙන් පැවසුවත්, "එම වේලාව සවස 5.00 විය හැකිදැයි" ඇසූ විට "නැහැ" යනුවෙන් මෙන් ම "ඔබගේ මතකය අනුව එම වේලාව සවස 4.00ත්, 5.00ත් අතර කිව්වොත් නිවැරැදිද?" යනුවෙන් නැවතත් විමසූ විට දී "නිවැරැදියි" යනුවෙන් සාක්ෂි ලබා දී ඇත. (2021.10.18 වන දින සාක්ෂි - 1 පිටුව)

එසේ වුව ද, ඉදිරිපත් වූ සියළු වාචික සහ ලිඛිත සාක්ෂි විශ්ලේෂණය කිරීමේ දී හිටපු රාජ්‍ය අමාත්‍යවරයා වැලිකඩ බන්ධනාගාරයට පැමිණියේ සවස

5.00න් පසුව වන බවටත්, එම වේලාව සවස 5.30ට ආසන්න වන බවටත් අනාවරණය වන හෙයින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ද, පැමිණි වේලාව සම්බන්ධව දෙනු ලබන සාක්ෂිය නිවැරදි සාක්ෂියක් ලෙසට සළකා බැලීමට අපහසුය.

එපමණක් ද නොව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගෙන් බන්ධනාගාර 'ප්‍රධාන බැරියර් එකෙන් පිටව ගියේ කීයටදැයි' විමසූ ප්‍රශ්නයට ද, මතකයේ හැටියට පැය ½ක් පමණයි බන්ධනාගාරය තුළ රැඳී සිටියේ යැයි පැහැදිලි පිළිතුරක් ලබා දී ඇත.

තව ද, එසේ ගත කළ පැය ½ විස්තර කරමින් බන්ධනාගාර නිලධාරීන් ඔහුව පිළි ගත් බන්ධනාගාරයෙහි ප්‍රධාන ගේට්ටුව අසළ වූ යකඩ වැල් ගේට්ටුව අසළ දළ වශයෙන් විනාඩි 10ක් ද, වැපල් අංශයෙහි සිරකරුවන් සමග විනාඩි 15ක් ද, එල්ලුම් ගහ අසළ විනාඩි 5ක්, 10ක් ද, දුරකථන කුටිය අසළ විනාඩි 5ක්, 10ක් ද, බන්ධනාගාර අධිකාරි කාර්යාලයෙහි විනාඩි 5ක්, 10ක් ද වශයෙන් පැවසූ හෙයින් (2021.10.18 වන දින සාක්ෂි - 3 සිට 5 දක්වා පිටු) නැවත වරක් බන්ධනාගාරය තුළ ගත කළ සම්පූර්ණ කාලය කොපමණ දැයි මා විමසන ලදී. ඊට "විනාඩි 45ක් පමණ" යැයි පවසා ඇත. මෙකී සාක්ෂියත්, පැමිණි වේලාව සවස 5.00ට තරම් බවට ලබා දුන් සාක්ෂියත් සත්‍යයක් නම්, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා වැලිකඩ බන්ධනාගාරයෙන් පිටව යා යුත්තේ සවස 5.45ට ය.

එසේ වුව ද, "A" වශයෙන් සළකුණු කර ඇති වැලිකඩ බන්ධනාගාරයෙහි පවත්වා ගෙන යන අමුත්තන්ගේ පැමිණීමේ ලේඛනයෙහි සටහන්ව ඇත්තේ ප.ව.4.40ත් ප.ව.6.15.ත් අතර වූ කාලයේ දී හිටපු රාජ්‍ය අමාත්‍යවරයා බන්ධනාගාරයේ සංචාරය කළ බවයි. ප්‍රධාන දොරටු පොතේ 'පිටවීම' ලෙසට දක්වා ඇත්තේ ද සවස 6.15ය. බන්ධනාගාරය තුළට එන වාහන පිටවීම සඳහාත් 'B1' ලේඛනයෙහි ද වාහනය පිට වූ වේලාව ලෙසට ඇත්තේ

සවස 6.15ය. "C" වශයෙන් සළකුණු කර ඇති ජේලර් දින පොතෙහි ද පිට වූ වේලාව ලෙසට සඳහන්ව ඇත්තේ සවස 6.15ය. එපමණක් ද නොව, වැපල් අංශයෙහි පවත්වා ගෙන යනු ලබන 'E1' සහ 'E2' වශයෙන් සළකුණු කර ඇති ප්‍රධාන දොරටු ලේඛනවල ද හිටපු රාජ්‍ය අමාත්‍යවරයා වැපල් අංශයෙන් පිට වූ වේලාව සවස 5.45 යැයි සඳහන් කර ඇත.

මෙකී සාක්ෂි සියල්ල සළකා බැලීමේ දී හිටපු රාජ්‍ය අමාත්‍යවරයා වැලිකඩ බන්ධනාගාරයෙන් සවස 6.15 ට පිටව ගොස් තිබුනා නම් සහ හිටපු රාජ්‍ය අමාත්‍යවරයාම පිළි ගන්නා පරිදි වැලිකඩ බන්ධනාගාරය තුළ ඔහු පැය ½කුත් විනාඩි 45ත් අතර කාලයක්ද රැඳී සිටියා නම්, ඔහු බන්ධනාගාරයට ඇතුළු විය යුත්තේ සවස 5.30ට ආසන්නයෙහි හෝ ඉන් පසුව වන බවට කිසිදු සැකයක් නැත.

මේ අනුව වැලිකඩ බන්ධනාගාරය සංචාරය කිරීම සඳහා හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සමග පැමිණි පිරිස, පැමිණි නිවැරදි වේලාව කුමක්දැයි අනාවරණය කර ගත හැකි ඉතාමත් හොඳ සාක්ෂියක් ලෙසට සළකා බැලිය හැකි ලේඛනමය සාක්ෂි, පසු අවස්ථාවක දී බන්ධනාගාර නිලධාරීන් විසින් වෙනස් කිරීමට ලක් කරමින් පමණක් නොව, ගොතන ලද අසත්‍ය සාක්ෂි ද ලබා දී තිබූ හෙයින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා බන්ධනාගාරය තුළට පැමිණි වේලාව සම්බන්ධව බන්ධනාගාර නිලධාරීන් විසින් යොදා ඇති සටහන් සහ/හෝ දෙනු ලබන සාක්ෂි සත්‍ය සාක්ෂි ලෙසට පිළි ගැනීමට අපොහොසත් ය.

විවිධ පනත්වලින් සංශෝධිත 1877 අංක:16 දරන බන්ධනාගාර ආඥා පනතින් බන්ධනාගාරය සහ එහි සිටින රැඳවියන් පරීක්ෂා කිරීම සඳහා ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට, දිසා විනිසුරුවරයෙකුට සහ මහෙස්ත්‍රාත්වරයෙකුට පෙ.ව.5.30ත්, ප.ව.5.30ත් අතර වූ කාලයේ දී සංචාරය කළ හැකි අතර, තම නිරීක්ෂණය සහ නිර්දේශ අමුත්තන්ගේ පොතේ සටහන් කළ හැක.

ඉදිරිපත් වූ ඉහතින් දැක්වෙන සාක්ෂි වලට අනුව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා වැලිකඩ බන්ධනාගාරයට 2021.09.12 වන දින සවස 5.30 ට පමණ ඇතුළු වී සවස 6.15 ට පිටව ගොස් තිබූ බවට තොරතුරු හෙළිදරවු වන හෙයින්, 1877 අංක: 16 දරන බන්ධනාගාර ආඥා පනතේ 39(2) උප වගන්තියෙහි දැක්වෙන නීතිය උල්ලංඝනය කර ඇති බවට තොරතුරු අනාවරණය වෙයි.

## (b) සංචාරය සඳහා සහභාගි වූ පිරිස

2021.09.06 වන දින වැලිකඩ බන්ධනාගාරය නිරීක්ෂණය කිරීම සඳහා පැමිණි හිටපු රාජ්‍ය අමාත්‍යවරයාව පළමුවෙන් ම නිරීක්ෂණය කර තිබූ ප්‍රධාන දොරටු භාර නිලධාරි 'ඩබ්ලිව්.එම්.අනිල් වීරසිංහ' විසින් ඊට අදාළව ලබා දුන් සාක්ෂිය වන්නේ "මූලස්ථාන අධිකාරි ලාහිරි මහතායි, බුද්ධි අංශයේ අධිකාරි තුමායි, බුද්ධි අංශයේ ප්‍රධාන ජේලර් නාමල් එදිරිසිංහ මහතායි යන අය සමග ලැලි දොරෙන් මම ඉන්න ස්ථානයේ යකඩ දොරට ඇමති තුමායි, ඇමති තුමාගේ කාර්ය මණ්ඩලයයි ඇතුල් වුනා. කාර්ය මණ්ඩලයේ තුන් දෙනෙක් හිටියා. එස්.ටී.එෆ් එකේ එයාගේ ආරක්ෂක නිලධාරීන් තුන් දෙනයි, ඇමති ආරක්ෂක එකේ එම්.එස්.ඩී. නිලධාරීන් දෙන්නයි එතනට ආවා. ඊට පස්සෙ මගේ රාජකාරිය පරිදි කිසිම ආයුධයක් බන්ධනාගාරය තුළට ගෙන යන්න බැහැ, ආරක්ෂක අංශයේ නිලධාරීන්ගෙන් මම විමසුවා. සියළු ම ආයුධ එළියෙන් තියලා ආවා කිව්වා." වශයෙනි. (2021.10.04 වන දින සාක්ෂි - 3 පිටුව).

මේ අනුව රාජ්‍ය අමාත්‍යවරයා සමග සිටි ආරක්ෂක නිලධාරීන් පස් දෙනාට අමතරව තවත් තිදෙනෙකු ද බන්ධනාගාරය තුළට පැමිණ තිබූ බවට අනාවරණය වෙයි.

මීට අමතරව, එදින වැපල් අංශයේ රාජකාරි කර තිබූ 'නාමල් කරුණාරත්න' නැමැති බන්ධනාගාර නියාමකවරයා විසින් ද හිටපු රාජ්‍ය ඇමතිවරයා සමගින් ආරක්ෂක නිලධාරීන් පස් දෙනාට අමතරව සිවිල් ඇඳුමින් සැරසුණු තවත් තිදෙනෙක් පැමිණි බවට සාක්ෂියක් ලබා දී ඇත. (2021.10.04 වන දින සාක්ෂි - 3 පිටුව)

එසේම, මෙහි ප්‍රධාන දොරටුව අසළ ම රාජකාරි කර තිබූ විශේෂ කාර්ය බලකායේ 'උ.පො.ප.පෙරේරා' විසින් ද හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සමග

විශේෂ කාර්ය බලකායේ තිදෙනෙක් සමගින් තවත් පස් දෙනෙක් පමණ පිරිස සිටි බවට පවසා ඇත. (2021.10.11 වන දින සාක්ෂි - ප.ව.1.30 - 2 පිටුව)

තව ද, එම ප්‍රධාන දොරටුව අසළ රාජකාරි කළ විශේෂ කාර්ය බලකායෙහි 'පො.කො.අමරසිරි' ද හිටපු රාජ්‍ය අමාත්‍යවරයා හැරෙන්නට ආපු පිරිස වෙන් වෙන්ව කියන්න අමතක වුව ද, ඔහුත් සමග S.T.F නිලධාරීන් ද ඇතුළුව තවත් 8 දෙනෙක් සිටි බවට කියන්න මතක බවටත් සාක්ෂියක් ලබා දී ඇත. (2021.10.11 වන දින සාක්ෂි - පව.3.20 - 3 පිටුව)

කෙසේ වුව ද, වැපල් අංශයෙහි ම රාජකාරි කර තිබූ 'ඩී.යූ.එම්.තිලකරත්න' ලබා දුන් සාක්ෂියෙන් අනාවරණය වන්නේ ආරක්ෂක නිලධාරීන් පස් දෙනාට අමතරව සිවිල් ඇඳ ගත්ත පිරිමි දෙදෙනෙක් සිටි බවයි. (2021.10.04 වන දින සාක්ෂි - 2 පිටුව)

වැපල් අංශය සවස වැසීමේ රාජකාරියෙහි යෙදුනු ජේලර් 'පී.ඒ.එන්.ජයසිංහ' විසින් ද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සමග සිටි ආරක්ෂක නිලධාරීන් පස් දෙනාට අමතරව තවත් සිවිල් ඇඳුමින් සැරසුණු තිදෙනෙකු සිටි බවට පැහැදිලි සාක්ෂියක් ලබා දී ඇත. (2021.10.04 වන දින සාක්ෂි - 1 පිටුව)

එසේ ම, 'වැලිකඩ බන්ධනාගාර අධිකාරිවරයා' විසින් ද හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සමග සිටි ආරක්ෂක් නිලධාරීන් පස් දෙනාට අමතරව තවත් පිළිවෙළකට සපත්තු, ඇඳුම් දා ගෙන සිටි නිසා කාර්ය මණ්ඩලයේ යැයි සිතිය හැකි තවත් දෙදෙනෙක් හෝ තිදෙනෙක් සිටි බවට සාක්ෂියක් ලබා දී ඇත. (2021.10.05 වන දින සාක්ෂි - පෙ.ව.8.30 - 1 පිටුව)

මීට අදාළව සහකාර බන්ධනාගාර අධිකාරිවරයා වූ 'ඩබ්ලිව්.රුවන් ප්‍රභාත්' ගේ සාක්ෂිය වූයේ ආරක්ෂක නිලධාරීන් පස් දෙනාට අමතරව සිවිල් ඇඳ ගත් තවත් පිරිමි දෙදෙනෙක් සිටි බවත්, ඔවුන් ඇමතිවරයාත් සමගින් ම පිළිවෙලට සපත්තු දමා, දිග කලිසමකින් සහ ෂර්ට් එකකින් සැරසී සිටි නිසා

කාර්ය මණ්ඩලයේ අය යැයි සිතූ බවට ය. (2021.10.05 වන සාක්ෂි - පෙ.ව.10.55 - 1 වන පිටුව)

හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සමග පැමිණි පිරිස සම්බන්ධව තොරතුරු අඩංගු කර තිබූ ලේඛනයක් ලෙසට මෙම කමිටුවට ඉදිරිපත් වූයේ "A" වශයෙන් ලකුණු කළ 'අමුත්තන්ගේ පැමිණීමේ ලේඛනය' පමණි. එහි පැමිණි අමුත්තන්ගේ නම්, ගම්, ප්‍රමාණය දක්වා නැතත්, අමාත්‍ය කාර්ය මණ්ඩලය, ඇමති ආරක්ෂක නිලධාරීන් සහ විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් සහභාගි වූ බවට 7 වන සහ 8 වන පේළියෙහි දක්වා ඇත.

එපමණක් ද නොව, අමාත්‍යවරයාගේ මෙකී සංචාරයේ දී එල්ලුම් ගහ අසළ රැඳී සුළු වේලාවක් එය නිරීක්ෂණය කර තිබූ බවට අනාවරණය වූ හෙයින්, එල්ලුම් ගහ පිහිටි කාමරය ඉදිරිපස ඇති සී.3 විශේෂ අංශයේ 93 වන කාමරයෙහි රඳවා ඇති මරණ දඬුවමක් විඳින 'බී.එල්.සුනිල්' ගෙන් ද, ඇමති තුමාත් එක්ක සිවිල් ඇඳුම් ඇඳ ගත් කවුරු හරි හිටියා දැයි විමසූ විට දී හිටියා දෙන්නෙක්, තුන් දෙනෙක් යැයි පවසා ඇත. (2021.10.12 වන දින සාක්ෂි - ප.ව.1.30 - 3 පිටුව)

ඉහත කී සියළු සාක්ෂි සළකා බැලීමේ දී හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සමග ආරක්ෂක නිලධාරීන් පස් දෙනෙකුට අමතරව, තවත් සිවිල් ඇඳුමින් සැරසුණු පුද්ගලයින් දෙදෙනෙක් හෝ තිදෙනෙක් වැලිකඩ බන්ධනාගාරය තුළට පැමිණ තිබූ බවට අනාවරණය වෙයි. මෙකී සිවිල් ඇඳ ගත් අය ඇතැම් බන්ධනාගාර නිලධාරීන් විසින් කාර්ය මණ්ඩලයේ යැයි සිතුවා යැයි පැවසුවත්, නිශ්චිතවම ඔවුන් කවුරුන්දැයි හඳුනා ගැනීම සඳහා විශේෂ කිසිවක් තිබී නොමැති බවට ද හෙළි වෙයි.

කෙසේ වුවද, 'හිටපු රාජ්‍ය අමාත්‍යවරයා' ගෙන් ද ඔහු සමග සිටි බවට අනාවරණය වන සිවිල් ඇඳුම් ඇඳ ගත් පිරිස කවුදැයි හඳුනා ගැනීම සඳහා "ඔබතුමාත් සමග කී දෙනෙක් පැමිණියා දැයි" විමසූ විටදී, "ඇමති

ආරක්ෂක සේවයේ නිලධාරීන් තිදෙනෙක් ආවා. බන්ධනාගාර බුද්ධි අංශයේ නිලධාරීන් හතර දෙනෙක් ආවා" යනුවෙන් පවසා ඇත. ඒ අනුව "මේ අය ආරක්ෂක නිලධාරීන් ලෙස හඳුනා ගත හැකි නිල ඇඳුමින් ද සැරසී සිටියේ දැයි" යනුවෙන් විමසූ ප්‍රශ්නයට ද "ඔව්" යනුවෙන් සාක්ෂියක් ලබා දුන් නිසා "ඊට අමතරව සිවිල් ඇඳුමෙන් කවුරු හරි පැමිණියා ද?" යනුවෙන් පැහැදිලිව විමසන ලදී. ඊට ද "නැහැ" යනුවෙන් පැවසූ බැවින් "කවුරු හරි සාක්ෂියක් දීලා තිබුනා නම් තවත් සිවිල් ඇඳුමෙන් දෙදෙනෙක් හෝ තුන් දෙනෙකුත් පැමිණියා කියලා. ඒක නිවැරදි ද?" යනුවෙන් විමසූ විට දී "ඒක වැරදියි. ආරක්ෂක නිලධාරීන් පමණයි පැමිණියේ" යනුවෙන් පවසා ඇත. එනමුදු එකී සාක්ෂිය සත්‍ය සාක්ෂියක් බවට තහවුරු කිරීම සඳහා කිසිදු වාචික හෝ ලේඛනගත සාක්ෂියක් නැත.

එසේම හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් සිවිල් ඇඳුමෙන් සැරසුනු කිසිවෙකු නොපැමිණි බවට පවසා සිටියත්, ඉදිරිපත්වූ අනෙක් සියළු ම සාක්ෂිවලින් අනාවරණය වන්නේ ආරක්ෂක නිලධාරීන් ලෙසට නිල ඇඳුමින් හඳුනාගත හැකි වූයේ නිලධාරීන් පස් දෙනෙක් පමණක් බවත්, අනෙක් අයවළුන් සිවිල් ඇඳුමෙන් සැරසී සිටි බවටත් ය. මේ අනුව හිටපු රාජ්‍ය අමාත්‍යවරයා, ඔහු සමඟ බන්ධනාගාරයට පැමිණි සිවිල් ඇඳුමෙන් සැරසී සිටි පිරිස සම්බන්ධව කරුණු සඟවමින් අසත්‍ය සාක්ෂියක් දෙනු ලබන බවට පැහැදිලි වේ.

හිටපු රාජ්‍ය අමාත්‍යවරයා බන්ධනාගාරයට පැමිණි වේලාව 1877 අංක: 16 දරන බන්ධනාගාර පනතේ 39 (2) වගන්තියට අනුකූල බවට පෙන්වා දීම සඳහා සවස 5.30 ට පෙර පැමිණි බවට ඒත්තු ගැන්වීමට, බන්ධනාගාරය පවත්වා ගෙන ගිය ලේඛනත් වෙනස් කර තිබූ බන්ධනාගාර නිලධාරීන් පවා, රාජ්‍ය ඇමතිවරයා සමඟ සිවිල් ඇඳ ගත් දෙදෙනෙක් හෝ තිදෙනෙක් සිටි බවට ලබා දුන් සාක්ෂිය 'විය නොහැක්කක්' ලෙසට හෝ 'ඒකාකාරී බවින් තොර' වන බවට හෝ සළකා බැලිය නොහැක. එබැවින්, බන්ධනාගාර නිලධාරීන්ගේ සාක්ෂි අසත්‍යයක් යැයි සළකා බැලිය නොහැක. එපමණක් ද

නොව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සමග සිටි පිරිස නිරීක්ෂණය කිරීමට හැකියාව තිබූ වැලිකඩ බන්ධනාගාරය තුළ රඳවා සිටි සුනිල් නැමැති සිරකරුගේ සාක්ෂියෙන් පවා හිටපු රාජ්‍ය අමාත්‍යවරයාත් සමගින් ආරක්ෂක නිලධාරීන් නොවන තවත් දෙදෙනෙක් හෝ තිදෙනෙක් සිටි බවට තොරතුරු අනාවරණය වෙයි.

මෙම සියළු කරුණු සළකා බැලීමේ දී, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට සාධාරණ හේතුවක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ පිරිමි පුද්ගලයින් දෙදෙනෙකු / තිදෙනෙකු හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් බන්ධනාගාරය තුළට 2021.09.06 වන දින රැගෙන විත් ඇති බවට අනාවරණය වෙයි.

කෙසේ වෙතත්, 2021.09.06 වන දින වැලිකඩ බන්ධනාගාරය තුළට හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් කාන්තාවක් ද රැගෙන විත් තිබූ බවට සමාජය අතර කථාබහක් තිබුන ද, එබඳු සිදු වීමක් සිදු වී තිබූ බවට කිසිදු සාක්ෂියක් මගින් අනාවරණය නොවූ බවට ද සඳහන් කළ යුතු මය.

## (c) ශ්‍රී ලංකා ජනරජය නියෝජනය කළ අන්දම

2021.09.06 වන දින වැලිකඩ බන්ධනාගාරයට ගියේ කුමන කටයුත්තක් සඳහා දැයි හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගෙන් මෙම කමිටුව විසින් විමසූ විට දී පවසා සිටියේ එදින බන්ධනාගාරයට ගියේ රාජකාරිමය කටයුත්තක් සඳහා බවටයි. තවදුරටත් එය පැහැදිලි කරමින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා පවසා සිටියේ පෝරකය බලන්න අවශ්‍ය යැයි නිලධාරීන්ගෙන් ඉල්ලා සිටි බවටත්, ඊට අමතරව සිරකරුවන් විසින් නැවත සිවි අවුරුදු සමාලෝචනය ලබා දෙන්න යැයි ඉල්ලීමක් කර තිබූ බවටත්, මරණ දඬුවම නියම වෙච්ච අයගේ ප්‍රශ්න දැන ගැනීමට අවශ්‍ය වූ බවටත් ය. (2021.10.18 වන දින සාක්ෂි - 1 සහ 3 පිටු)

එසේ වුව ද, 2021.09.06 වන දින බන්ධනාගාරයේ සංචාරය කිරීම සඳහා රාජ්‍ය අමාත්‍යවරයා පැමිණියේ ටී ෂර්ට් එකකින් සහ දණ හිසට අඟල් 3ක් පමණ පහළට දික් වූ කොට කලිසමකින් සැරසී, දෙපයට සෙරෙප්පු දෙකක් දා ගෙන යැයි ප්‍රධාන දොරටු භාර නිලධාරි 'ඩබ්ලිව්.එම්.අනිල් වීරසිංහ' විසින් සාක්ෂියක් ලබා දී ඇත. (2021.10.04 වන දින සාක්ෂි - 6 පිටුව)

මෙම සාක්ෂිය තහවුරු කරන ලද එදින වැපල් අංශයෙහි රාජකාරි කරන ලද බන්ධනාගාර නියාමකවරුන් වූ 'කරුණාරත්න' නැමැති නිලධාරිවරයාත්, මධුශාන් තිලකරත්න යන නිලධාරිවරයාත් රාජ්‍ය අමාත්‍යවරයා දණ හිසට කකුල් තිබෙන කොට කලිසමකින් සහ උඩට අත් කොට ටී ෂර්ට් එකක් ඇඳ ගෙන සිටි බවට පවසා ඇත. (පිළිවෙළින් 2021.10.04 වන දින සාක්ෂි - 5 පිටුව සහ එදින ම සාක්ෂි - 5 පිටුව)

එපමණක් ද නොව, වසර 23ක සේවා කාලයක් පවතින වැලිකඩ බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර්වරයා වූ 'නිශාන්ත ප්‍රනාන්දු' ද, වසර 38ක සේවා කාලයක් පවතින දෙවන පෙළ ජේලර්වරයෙකු වූ 'පී.ඒ.නන්දසිරි

ජයසිංහ' ද හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ටී ෂර්ට් එකක් සහ කොට කලිසමකින් සැරසී, දෙපයට සෙරෙප්පු දෙකක් දා ගෙන සිටි බවටත්, තම සම්පූර්ණ සේවා කාලයට කිසිදු ප්‍රභූවරයෙකු හෝ නිලධාරියෙකු එබඳු ඇඳුමකින් සැරසී රාජකාරියක නියැලෙනවා මීට පෙර දැක නැති බවටත් පවසා ඇත. (පිළිවෙළින් 2021.10.05 වන සාක්ෂි - ප.ව.1.35 - 2 පිටුව සහ 2021.10.04 වන දින නන්දසිරි ජයසිංහගේ සාක්ෂි - 6 පිටුව)

තව ද, වැලිකඩ සහකාර බන්ධනාගාර අධිකාරි 'ඩබ්ලිව්.රුවන් ප්‍රභාත්' යන නිලධාරිවරයාත් ඉහත කී සාක්ෂි තහවුරු කරමින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ඇඳ ගෙන සිටියේ දණහිස තෙක් දික්වූ කොට කලිසමක් සහ ටී ෂර්ට් එකක් බවටත්, සෙරෙප්පු දෙකක් දා ගෙන සිටි බවටත්, මීට පෙර තම සේවා කාලය වූ අවුරුදු 22 පුරාවට ම මේ අයුරින් සැරසී රාජකාරි කටයුත්තක් සඳහා පැමිණි ප්‍රභූවරයෙක් හෝ නිලධාරිවරයෙක් දැක නොමැති බවටත් පැහැදිලි සාක්ෂියක් ලබා දී ඇත. (2021.10.05 වන දින සාක්ෂි - පෙ.ව.10.55- 1 සහ 2 පිටු)

මීට අදාළව වැලිකඩ බන්ධනාගාර අධිකාරි 'යූ.බී.වලිසුන්දර' මහතා පවසා සිටියේ "2021.09.06 වන දින රාජ්‍ය අමාත්‍යවරයා ආපු ගමන් ම කිව්වේ වැපල් අංශයට ගිහින් එල්ලුම් ගහ බලන්න ඕන කියලයි. එදින සිදු කළ මුළු සංචාරය ම වැඩි වේලාවක් ගත කළේ එල්ලුම් ගහ ළඟයි. රාජකාරි ගමනක් එන බවට දැනුම් දීමක් කරලා තිබුනේ නැහැ. වෙනත් වාර්තාවක් මගෙන් ඉල්ලුවෙත් නැහැ. ඇඳ ගෙන හිටියේත් සාමාන්‍ය ගමනක් යන විධියටයි. ඒ අනුව මට හිතෙන්නේ ප්‍රධාන අරමුණ තිබුනේ එල්ලුම් ගහ බලන්න" වශයෙනි. (2021.10.05 වන දින සාක්ෂි - 7 පිටුව)

මීට අමතරව වැපල් වාට්ටුවේ සී.3 විශේෂ අංශයෙහි කාමර අංක: 102 හි රැඳී සිටින කාමර පාටියෙහි සිටි සැකකරුවෙකු වූ 'එල්.සුසිල් ප්‍රේමතිලක' විසින් ද මීට පෙර එක් වතාවක් දැක ඇති, පසුව රාජ්‍ය ඇමති ලෙස හඳුනා ගත් ලොහාන් රත්වත්ත මහතාව 2021.09.06 වන දින මුලින් ම දුටුවේ කොට

කලිසමක් සහ ටී ෂර්ට් එකකින් සැරසී, කකුල් දෙකට සෙරෙප්පු දෙකක් ඇඳ ගෙන බවයි. මෙහි දී මෙම සාක්ෂිකරුගෙන් "ඔබ හිතුවේ කවුරු කියලා ද?" යනුවෙන් විමසූ විට දී, "අපි ඒ මහත්තයාව ගණන් ගත්තේ නැහැ. බන්ධනාගාර මහත්තුරු සෙල් එකට දාන්න මනුස්සයෙක් ගෙනල්ලා කියලා හිතුවේ" වශයෙනි. (2021.10.12 වන දින සාක්ෂි - පෙ.ව.11.45 - 2 පිටුව)

මේ හැරෙන්නට කාමර අංක: 93 සිර මැදිරියෙහි රඳවා සිටි 'බී.එල්.සුනිල්' විසින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ඇඳ සිටි ඇඳුම විස්තර කළේ මීට මාස 2, ½කට, 3කට උඩ දී ඇමති තුමා එල්ලුම් ගහ බලන්න ආවා, ඒ වතාවේ මම දැක්කේ ඇමති කෙනෙක් වගේ සූට් එකක් ඇඳලායි, මේ වතාවේ දැක්කේ ව්‍යායාම කරන්න ආවා වගේ කොට කලිසමකුයි, ටී ෂර්ට් එකකුයි ඇඳලා වශයෙනි. ( 2021.10.12 වන දින සාක්ෂි - ප.ව.1.30 - 2 සහ 3 පිටු)

තවත් සිරකරුවෙකු වූ 'සුනිල් හෙට්ටිආරච්චි' යන අය ද හිටපු රාජ්‍ය අමාත්‍යවරයාව විස්තර කළේ, එතැන කොට කලිසමක් ඇඳ ගෙන හිටපු මහත්තයා මට කිව්වා කෝල් එකක් ගන්න විදිය කියන්න කියලා වශයෙනි. (2021.10.05 වන දින සාක්ෂි - ප.ව.1.05 - 1 වන පිටුව)

මේ අනුව බන්ධනාගාර නිලධාරීන් මෙන් ම සිරකරුවන් පවා ලබා දුන් සාක්ෂි මගින් 2021.09.06 වන දින හිටපු රාජ්‍ය අමාත්‍යවරයා බන්ධනාගාරයට ගොස් තිබුනේ, "රාජකාරි කටයුත්තක් කිරීම සඳහා සහභාගි වන යම් ප්‍රභූවරයෙකු හෝ යම් නිලධාරියෙකු කිසිසේත් සැරසී යන සුදුසු ඇඳුමකින් නොව, සිරකරුවෙකුගේ ඇඳුමකට පවා සම කළ හැකි ඇඳුමකින් බවට තොරතුරු අනාවරණය වූ හෙයින්, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගෙන් මීට අදාළව මෙම කමිටුව විසින් ප්‍රශ්න කරමින් "වැලිකඩ බන්ධනාගාරයට රාජකාරි කටයුත්තක් කිරීම සඳහා පැමිණියේ කුමන ඇඳුමකින් සැරසිලා ද?" යනුවෙන් විමසන ලදි. ඊට "ඩෙනිම් කලිසමකුයි, ටී ෂර්ට් එකකිනුයි සැරසිලා" යනුවෙන් පැහැදිලි පිළිතුරක් ලබා දී ඇත. ඒ අනුව නැවත වරක් "ඊට අදාළව ලැබී ඇති සාක්ෂි මගින් හෙළිදරවු වන්නේ ඔබ සැරසී සිටියේ

කොට කලිසමකින් යැයි කියලා නම් එය අසත්‍යයක් ද?" යනුවෙන් විමසූ විට දී "එය සම්පූර්ණ අසත්‍යයක්" යැයි පවසා ඇත. මේ අනුව නැවත වරක් "කොට කලිසමකින් සැරසී සිටි බවට අසත්‍ය සාක්ෂියක් ලබා දීමට බන්ධනාගාර නිලධාරියෙකුට හෝ නිලධාරීන්ට හෝ සිරකරුවන්ට කිසියම් හේතුවක් පවතින්නේ යැයි ඔබ සිතනවා ද?" යනුවෙන් ද ඇසූ ප්‍රශ්නයට "ඔව්, මම බන්ධනාගාර අමාත්‍යාංශය භාර ගත්තාට පසුව බන්ධනාගාරය තුළ අක්‍රමිකතා නැවැත්වීම සඳහා උසස් නිලධාරීන් හා සෙසු නිලධාරීන්ගේ සාක්ෂි මත වැඩ තහනම් කළා. ඔවුන්ගේ බලපෑම මත මෙසේ සිදු විය හැකි යැයි මා සැක කරනවා" යනුවෙන් සාක්ෂියක් ලබා දී ඇත.

මේ අනුව "දැන් රාජකාරි කරන වර්තමාන බන්ධනාගාර නිලධාරීන් ඔබට විරුද්ධව සාක්ෂියක් ලබා දීමට ඔබගෙන් යම් කිසි ක්‍රියාවක් සිදු වුනා ද? යනුවෙන් ද විමසූ විට දී 'දැන් ඉන්න නිලධාරීන්ට යම් කිසි ක්‍රියාවක් සිදු වුනේ නැහැ' යනුවෙන් ද සාක්ෂියක් ලබා දී ඇති අතර ම (2021.10.18 වන දින සාක්ෂි - 6 සහ 7 පිටු) 'මම ලංකාවේ සෑම බන්ධනාගාරයකට ම යන්නේ එවැනි සැහැල්ලු ඇඳුමකින් සැරසිලා' යනුවෙන්ද පවසමින්, බන්ධනාගාරයට ගියේ සෙරෙප්පු දෙකක් දමා ගෙන බවටත් පිළි ගෙන ඇත. (2021.10.18 වන දින සාක්ෂි - 15 වන පිටුව).

හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ලබා දුන් ඉහත සාක්ෂි සළකා බැලීමේ දී ඔහු බන්ධනාගාරයට කොට කලිසමකින් හා ටී ෂර්ට් එකකින් සැරසී ගොස් තිබූ බවට වන සාක්ෂිය ප්‍රතික්ෂේප කර ඇතත්, සැහැල්ලු ඇඳුමකින් සැරසී ගිය බවට පිළි ගෙන ඇත.

එසේ ම හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ඇඳ සිටි ඇඳුම් සම්බන්ධව අසත්‍ය සාක්ෂි ගෙතීමට බන්ධනාගාර නිලධාරීන්ට හේතුවක් තිබුනා යැයි පෙන්වා දීම සඳහා වෙනත් නිලධාරීන් කිහිප දෙනෙකුගේ වැඩ තහනමක් යැයි හිටපු රාජ්‍ය අමාත්‍යවරයා පවසා සිටියත්, මෙම විමර්ශනයේ දී සාක්ෂි ලබා දුන්

බන්ධනාගාර නිලධාරීන්ට එකී වැඩ තහනම් කරපු නිලධාරීන් සමගින් යම් සම්බන්ධයක් පවතින බවට පෙන්වා දීමට අපොහොසත් වී ඇත.

මේ හැරෙන්නට, බන්ධනාගාර නිලධාරීන් පමණක් නොව සිරකරුවන් පවා අමාත්‍යාවරයා සැරසී සිටි ඇඳුම විස්තර කරමින් ඔවුන්ට එම අවස්ථාවේ දී නැඟුනු සිතිවිලි පවා පැහැදිලි කරමින් ලබා දී ඇති සාක්ෂිත් සළකා බැලීමේ දී, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා බන්ධනාගාරයට පැමිණියේ කොට කලිසමකින් සහ ටී ෂර්ට් එකකින් බවට 'ඒකාකාරී පරීක්ෂණයෙන්' සහ 'විය හැකි භාවයේ පරීක්ෂණයෙන්' සමත් වන හෙයින්, එම සාක්ෂි සත්‍යයක් බවට සාධාරණව පිළි ගත හැක.

## (d) බන්ධනාගාරය තුළ සිදු කර තිබූ ක්‍රියාකාරකම්

වැලිකඩ බන්ධනාගාරයට පැමිණෙන බව තමාට සහ/හෝ වෙනත් නිලධාරියෙකුට පූර්ව දැනුම් දීමක් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් සිදු කර නොතිබූ බවට වැලිකඩ බන්ධනාගාර අධිකාරි යූ.බී.වලිසුන්දර මහතා විසින් සාක්ෂියක් ලබා දී ඇති අතර, (2021.10.05 වන දින සාක්ෂි - පෙ.ව.8.30 - 2 පිටුව) මෙම කමිටුව විසින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගෙන් එසේ පැමිණෙන බවට පූර්ව දැනුම් දීමක් සිදු කළේ දැයි විමසූ විටදී, "මට මතක නැහැ" යනුවෙන් පිළිතුරක් ලබා දෙමින් (2021.10.18 වන දින සාක්ෂි - පෙ.ව.10.30 - 3 පිටුව) පූර්ව දැනුම් දීමක් සිදු නොකළ බවට පවතින සාක්ෂිය ප්‍රතික්ෂේප කර නැත.

අනතුරුව, වැලිකඩ බන්ධනාගාරයට හිටපු රාජ්‍ය අමාත්‍යවරයා පැමිණ, යම් කිසි දැනුම් දීමක් කළා දැයි බන්ධනාගාර අධිකාරිගෙන් විමසූ ප්‍රශ්නයට ලබා දී තිබූ පිළිතුර වූයේ "ඉස්සරලා ම වැපල් අංශයට යන්න ඕන කියලා කිව්වා. ඊට පස්සෙ වැපල් අංශයට ආවා. ඊට පස්සෙ සී.3 අංශයේ එල්ලුම් ගහ බලන්න ඕන කිව්වා. ඒ අනුව සී.3 අංශයට ඇතුල් වෙලා ඒ අංශයේ සංචාරය කළා. ඊට පස්සේ එල්ලුම් ගහ තිබෙන ස්ථානය ඇරලා පෙන්නුවා" වශයෙනි.

මේ හැරෙන්නට, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සිදු කර තිබූ ක්‍රියාවන් විස්තර කරමින් වැපල් අංශයෙහි විනාඩි 45ක් පමණ ගත කළ බවටත්, ඉන් විනාඩි 25ක් පමණ එල්ලුම් ගහ ළඟ ගත කළ බවටත්, එල්ලුම් ගහ තිබෙන කාමරයට යන එන ගමන් දෙපස පිහිටි සිර මැදිරිවල දොර ළඟට ගොස් රැඳවියන්ගෙන් නඩු ගැන, සමාව ගැන කථා කොට, නිදහස් වී එළියට ගොස් හොඳින් සිටීමට උපදෙස් දුන් බවටත්, එහි ද සිරි මැදිරි 3ක් පමණ විවෘත කර දොර ළඟට ගොස් කථා කල බවටත් බන්ධනාගාර අධිකාරි විසින්

වැඩිදුරටත් සාක්ෂියක් ලබා දී ඇත. (2021.10.05 වන දින සාක්ෂි - 3 පිටුව) අනතුරුව, වැපල් අංශයෙන් එළියට පැමිණ, ප්‍රධාන කාර්යාලයට යාබදව ඇති දුරකථන කුටි අසළට ගොස් එහි විනාඩි 10ක් පමණ ගත කළ බවටත්, එහි දී සිරකරුවෙකුට දුරකථන ඇමතුමක් ගන්නා ලෙසට දැනුම් දී, ඔහුගේ නඩුව ගැන ද විමසූ බවටත් පවසා ඇත. එම ස්ථානයෙන් පසුව ප්‍රධාන කාර්යාලයට ගොස් රාජකාරි සහ සිරකරුවන්ට සමාව දීම ගැන විනාඩි 10ක් පමණ කථා කොට වාහනය ගෙන්වා ගෙන වැලිකඩ බන්ධනාගාරයෙන් පිටව ගිය බවට ද පවසා ඇත. (වැලිකඩ බන්ධනාගාර අධිකාරිගේ 2021.10.05 වන දින සාක්ෂි - 5 පිටුව)

හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ 2021.09.06 වන දින වැලිකඩ බන්ධනාගාර සංචාරය සම්බන්ධව සහකාර බන්ධනාගාර අධිකාරි 'විතාරණ රුවන් ප්‍රභාත්' ගේ සාක්ෂිය වූයේ, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා පළමුවෙන් ම 'වැපල් අංශයට යමු' කියා වැපල් අංශයට යන විට දී, වැපල් අංශය අසළ දී මුණ ගැසුණු පුහුණු බන්ධනාගාර නිලධාරීන් 60ක් පමණ සමග විනාඩි 5ක් පමණ කථා කළ බවටත්, පසුව වැපල් අංශයෙහි සී.3 අංශයේ කාමරයක් තුළ පිහිටි එල්ලුම් ගහ බැලීමට යන එන අවස්ථාවල දී දෙපස පිහිටි සිර මැදිරිවල සිරකරුවන් සමග කථා කළ බවටත්, මතකය හැටියට හිටපු රාජ්‍ය අමාත්‍යවරයා එල්ලුම් ගහ අසළ විනාඩි 20ක් පමණ ද, යන එන ගමනේ දී සිරකරුවන් සමගින් කථා කිරීමට විනාඩි 10ක් පමණ කාලයක් ද ගත කළ බවටත්ය. මෙහි දී 'එල්ලුම් ගහ' අසළ සිටි කාලය තුළ දී සිරකරුවන් සමගින් කථා කළේ දැයි විමසූ අවස්ථාවේ දී ඒ අසළ සිරකරුවන් නොසිටි බවට පිළිතුරක් ලබා දී ඇත.

තවද, එල්ලුම් ගහ බැලීමෙන් පසුව දුරකථන කුටි අසළට ගොස් එහි ද විනාඩි 8 - 10ක් ගත කොට, අනතුරුව බන්ධනාගාර අධිකාරිගේ කාර්යාලයට ද ගොස් විනාඩි 10ක් පමණ ගත කර එදින සවස 6.15ට පමණ පිටව ගිය බවට ද, 2021.09.06 වන දින හිටපු රාජ්‍ය අමාත්‍යවරයා බන්ධනාගාරයට

පැමිණියේ එල්ලුම් ගහ නිරීක්ෂණය කිරීම සඳහා යැයි හිතෙන බවට ද වැඩිදුරටත් සාක්ෂියක් ලබා දී ඇත. (2021.10.05 වන දින සාක්ෂි - පෙ.ව.10.55 - 3 සහ 4 පිටු)

මේ හැරෙන්නට, කාමර පාටියේ සිටි නිසා එළිමහනේ රැඳී සිටීමට අවසර තිබූ සී.3 විශේෂ අංශයෙහි 102 කාමරයෙහි සිටින 'සුසිල් ප්‍රේමතිලක' නැමැති සිරකරු විසින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා චැපල් අංශයට ගිය අවස්ථාවේ දී නිරීක්ෂණය කිරීමට හැකියාව ලද බවට පවසා සිටි හෙයින්, ඔහුගෙන් 'තමන්ට හිතෙන විධියට සී.3 අංශයෙහි සිටින රැඳවියන්ව නිරීක්ෂණය කිරීමට සහ/හෝ රැඳවියන්ගේ ප්‍රශ්න සොයා බැලීමට හිටපු රාජ්‍ය අමාත්‍යවරයා පැමිණියා ද?' යනුවෙන් විමසූ විට දී ඔහු දුන් පිළිතුරු වූයේ, "මහත්තයා දැක්කා ම හිතුවේ සමාව ගැන කථා කරපු නිසා, ඒ ගැන කථා කරන්න ආවා කියලා. පස්සෙ එල්ලුම් ගහ බලන්නනේ ගියේ. පස්සෙ හිතුනා එල්ලුම් ගහ බලන්න ආවා කියලා. එල්ලුම් ගහ ගාව වැඩි වේලාවක් ගත කළේ. එල්ලුම් ගහ බලන්න යන එන විට කථා කළා. ඒ අයගේ ප්‍රශ්න ඇහුවා. සමාව ගැන තමයි කථා කළේ. මහත්තයා හැම කාමරයක ම අය එක්ක කථා කළේ නැහැ. කාමර 3, 4 ක ඉන්න අය එක්ක විතරයි කථා කළේ. ඒ අයගේ නඩුව, දඬුවම හා සමාව ගැන" (2021.10.12 වන දින සාක්ෂි - පෙ.ව.11.45 - 4 සහ 5 පිටු) වශයෙනි.

2021.09.06 වන දින වැලිකඩ බන්ධනාගාරය තුළ කළ නිරීක්ෂණය විස්තර කිරීමට එකී හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට දන්වා සිටි අවස්ථාවේ දී, ඊට අදාළව ලබා දුන් සාක්ෂිය වන්නේ, සිරකරුවන් සමග විනාඩි 15ක් පමණත්, එල්ලුම් ගහ අසළ විනාඩි 5 - 10ක අතර පමණ කාලයකුත්, දුරකථන කුටිය අසළ සහ බන්ධනාගාර අධිකාරි කාර්යාලයෙහි ද, විනාඩි 5 - 10ක් බැගිනුත් සිටි බවයි. මෙසේ ලබා දුන් පිළිතුරු අනුව, ඔහු බන්ධනාගාරය තුළ විනාඩි 45ක් පමණ සිටි බවට අනාවරණය වූ හෙයින්, බන්ධනාගාරයට පැමිණියා යැයි පවසන වේලාවත් සමග එක්ව සළකා බැලීමේ දී, බන්ධනාගාරයෙන් පිටව ගිය

වේලාව ලෙසට සටහන්වල සවස 6.15 ලෙසට දැක්වීම සම්බන්ධව යම් පැහැදිලි කිරීමක් කළ හැකි දැයි විමසූ විට දී, එසේ පැහැදිලි කළ නොහැකි බවටත්, ආපු වේලාව සහ පිටව ගිය වේලාව පිළිබඳ අමතක වීමක් හෝ හරියට මතකයක් නැති නිසා එබන්දක් විය හැකි බවටත් යැයි හේතු ලෙස දක්වා ඇත. තව ද, වැලිකඩ බන්ධනාගාරයට පැමිණීමේ ප්‍රධාන අරමුණ වූයේ සිව් වස් සමාලෝචනය ගැන සිරකරුවන් සමග සාකච්ඡා කිරීමට කියා කිව්වොත් නිවැරැදි වුවත්, වැපල් අංශයේ රඳවා සිටින සිරකරුවන්ගෙන් ඉතා සුළු ප්‍රමාණයක් සමග පමණක් සාකච්ඡා කළ බවටද, වැඩිපුර රැඳවියන් සමග කථා කිරීමට කිසිදු බාධාවක් නොතිබුන ද, කථා කරපු සිරකරුවන්ගෙන් සියළු දෙනාට ම නිදහස් වී ගෙදර යාම බව වැටහුණු හෙයින්, ඒ අයත් සමග පමණක් කථා කිරීමෙන් සෑහීමට පත් වූ බවටද පැහැදිලිවම පවසා ඇත. (2021.10.18 වන දින සාක්ෂි - 6 සහ 7 පිටු)

වැලිකඩ බන්ධනාගාර අධිකාරිවරයාගේ සාක්ෂිවලට අනුව, වැපල් අංශයෙහි A1, A2, A3, B1, B2, B3 සහ C1, C2, C3 වශයෙන් වූ ගොඩනැගිලි තුනෙහි සිරකරුවන් 800ක් පමණ රඳවා ඇත. එල්ලුම් ගහ පිහිටා ඇත්තේ සී.3 අංශයෙහි එක් සිර මැදිරියකය. සී.3 අංශයෙහි ඇති සිර මැදිරිවල ද රැඳවියන් 70 - 80ක් පමණ සිටී. මේ සියළු ම සිරකරුවන් අතරින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා කථා බහ කර ඇත්තේ 10 දෙනෙක් පමණ පිරිසක් සමගින් පමණි. (2021.10.15 වන දින සාක්ෂි - 6 පිටුව)

ඉහත සියළු සාක්ෂි සළකා බැලීමේ දී, 2021.09.06 වන දින වැලිකඩ බන්ධනාගාරයට ගියේ සිරකරුවන්ගේ ප්‍රශ්න සොයා බැලීමටත්, සිව් වස් සමාලෝචනය සම්බන්ධයෙන් ක්‍රියා කිරීමටත් යන ඉතා වැදගත් අරමුණු පෙරදැරිව යැයි පැවසුව ද, සැබැවින් ම එකී යහපත් වූ අභිප්‍රායන් ඉටු කර ගැනීමට වැලිකඩ බන්ධනාගාරයෙහි සිරකරුවන් 800ක් පමණ ද, සී.3 අංශයෙහිම සිර මැදිරිවල රැඳවියන් 70-80ක් පමණ ද වූ පිරිසක් සිටියත්, ඉන් තෝරා ගෙන තිබූ පිරිස 10-20ත් අතර වූ ඉතා සුළු ප්‍රමාණයක් වූ බවටත්

පමණක් නොව, එම සුළු පිරිස සමගින් ද සාකච්ඡා කර සොයා ගත් එකම කරුණ වී තිබුනේ ඕනෑම ජීවී සත්වයෙකුට පවතින පොදු හැඟීම වූ 'නිදහස් වීම' පමණක් බවටත් පැහැදිලි වෙයි.

ඉහත සියලු කරුණ සළකා බැලීමේදී, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ වැලිකඩ බන්ධනාගාරය සංචාරය කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ සිව් වස් සමාලෝචනය ගැන සිරකරුවන් සමග සාකච්ඡා කිරීමට නොවන බවට තොරතුරු අණාවරණය වෙයි.

එපමණක් ද නොව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සිය මුළු සංචාරයේ දී ම වැඩි වේලාවක් ගත කර තිබුනේ එල්ලුම් ගහ අසළ වන බවට ද කරුණු අනාවරණය වෙයි.

මේ හැරෙන්නට, 2021.04.20 වන දින ද ප.ව.2.00ට වැලිකඩ බන්ධනාගාරයෙහි වැපල් අංශයට ගොස් එල්ලුම් ගස බලා ප.ව.3.00ට පිටව ගිය බවට මෙන්ම, 2020.12.05 වන දිනයෙහිද, උපවාසයෙහි යෙදී සිටි සිරකරුවන් සමග සාකච්ඡා කිරීමට ප.ව.1.15ට හිටපු රාජ්‍ය අමාත්‍යවරයා වැලිකඩ බන්ධනාගාරයට පැමිණ ප.ව.2.15ට පිටව ගොස් තිබූ බවටත්, එම සංචාරයට තමන්ද සහභාගි වූ බවටත් පවසමින් 'සහකාර බන්ධනාගාර අධිකාරිවරයා' විසින් සාක්ෂියක් ලබා දී, ඊට අදාළ දොරටු පොතේ පවතින සටහන් 'X' සහ 'X1', 'Y', 'Y1'සහ 'Y2' වශයෙන් සළකුණු කර ඉදිරිපත් කර ඇත. (2021.10.13 වන දින පෙ.ව. 11.00 සාක්ෂි - 1 සහ 2 පිටු)

ඉහත කී වාචික සහ ලිඛිත සාක්ෂි සළකා බැලීමේ දී 2021.09.06 වන දින හැරෙන්නට ඊට පෙරත් එල්ලුම් ගහ තමන් නිරීක්ෂණය කර තිබූ බවට තොරතුරු අනාවරණය වෙයි. මෙම කරුණ, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ද සාක්ෂි ලබා දුන් අවස්ථාවේ දී පිළි ගෙන ඇත. ( 2021.10.18 වන දින සාක්ෂි - 4 පිටුව)

මේ අනුව, මාස 5ක් ඇතුළත හිටපු රාජ්‍ය අමාත්‍යවරයා වැපල් අංශයේ සී.3 විශේෂ අංශයෙහි පිහිටි එල්ලුම් ගස දෙවරක් නිරීක්ෂණයට බඳුන් කර තිබූ බවට අනාවරණය වෙයි.

කෙසේ වුව ද, මෙලෙස හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට එකිනෙකට ආසන්න කාල වකවානුවකදී එල්ලුම් ගස නිරීක්ෂණය කිරීමට විශේෂ හේතුවක් තිබුනේ දැයි හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සාක්ෂි ලබා දුන් අවස්ථාවේ දී මෙම කමිටුව විසින් ප්‍රශ්න කළ විටදී , ලබා දුන් පිළිතුරු වූයේ විශේෂ හේතුවක් නොවූ බවයි. (2021.10.18 වන දින සාක්ෂි - 4 පිටුව)

මේ හැරෙන්නට, එල්ලුම් ගහ සම්බන්ධව සහ/ එම කාමරය සම්බන්ධව සහ/හෝ එල්ලුම් ගහට සම්බන්ධිත යම් කරුණක් සම්බන්ධයෙන් සහ/හෝ කිසියම් ගැටළුවක් පවතින බවට තමන් විසින් ඉහළ නිලධාරීන්ට කිසිදු දැනුම් දීමක් සිදු කර නොතිබූ බවට වැලිකඩ බන්ධනාගාර අධිකාරිවරයා ද සාක්ෂියක් ලබා දී ඇත. (2021.10.05 වන දින සාක්ෂි - පෙ.ව.8.30 -4 පිටුව)

මෙකී සියලු කරුණු අනුව, වැලිකඩ බන්ධනාගාරයෙහි වැපල් අංශයෙහි සී.3 විශේෂ අංශයෙහි පිහිටි එල්ලුම් ගස 2021.09.06 වන දින ද නිරීක්ෂණය කිරීමට තරම් විශේෂ හේතුවක් සහ/හෝ හදිසියක් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට නොතිබූ බවට පැහැදිලි වෙයි.

- අනුරාධපුර බන්ධනාගාර සංචාරයට අදාලව

අනාවරණය වූ තොරතුරු

හිටපු රාජ්‍ය අමාත්‍යවරයා, අනුරාධපුර බන්ධනාගාරයෙහි සිදු කළ සංචාරය සම්බන්ධව තොරතුරු රැස් කිරීමේ දී, 2021.09.12 වන දින සවස් භාගයේ දී අනුරාධපුර බන්ධනාගාරයට ඇතුළු වී, ප්‍රථමයෙන්ම, 'F' වාට්ටුවේ රඳවා සිටි විශේෂ ගණයේ රැඳවියන් 18 දෙනාගෙන්, ත්‍රස්ථවාදී පණත යටතේ රඳවා සිටි රැඳවියන් 10 දෙනෙකුව 'F' වාට්ටුව අසළ වූ මිදුලට කැඳවා කථා බස් කිරීමෙන් අනතුරුව, 'F' වාට්ටුව ඇතුළට ද ගොස් එහි සිටි රැඳවියන් කිහිප දෙනෙකු සමග කථා කර, එළියට පැමිණ මඳ වේලාවක් රැඳී සිට, සහකාර බන්ධනාගාර අධිකාරිවරයාගේ කාර්යාලයට ද ගොස් එහි ද සුළු වේලාවක් ගත කර ආපසු සවස 7.00ට පමණ පිටව ගොස් තිබූ බවට මෙම කමිටුවට තොරතුරු අනාවරණය විය.

"F" වාට්ටුව ඇතුළට ගොස් ආපසු එළියට පැමිණ මඳ වේලාවක් රැඳී සිටි කරුණ හැරෙන්නට අනිකුත් කරුණු හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ද කිසිදු හබ කිරීමකින් තොරව පිළි ගන්නා ලදී.

කෙසේ වුවද, ත්‍රස්ථවාදී පණත යටතේ රඳවා සිටි සහ 'F' වාට්ටුව අසළ වූ මිදුලට කැඳවා තිබූ රැඳවියන් 10 දෙනා සමග හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සිදු කර තිබූ හමුවේ දී, රැඳවියන්ව සාපරාධි බියට පත් කිරීමට සහ/හෝ, වරද කියාපාන ලෙසට බලහත්කාරකම් පෑම සහ/හෝ, වධ හිංසා පීඩනයන්ට ලක් කරමින් නීත්‍යානුකූල නොවන අන්දමට රඳවා තැබීම සහ/හෝ, මිනීමැරීමට තැත් කිරීම ද හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් සිදු කොට තිබූ බවට ද තොරතුරු අනාවරණය වුන මුත්, එකී සියළු කරුණු හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

a) පැමිණි සහ පිට වූ වේලාව

අනුරාධපුර බන්ධනාගාරයෙහි ප්‍රධාන ලෑලි දොරටුව භාර නිලධාරි වශයෙන් 2021.09.12 වන දින රාජකාරි කර තිබූ 'දීගල්ලේ මුදියන්සේලාගේ වීරසිංහ' නැමැති බන්ධනාගාර සැරයන්වරයා විසින් ඊට අදාළව ලබා දී තිබූ සාක්ෂිය වූයේ, බන්ධනාගාර විෂය භාර ඇමතිවරයා පැමිණෙන බවටත්, පිරිසිදුව තබා ගන්නා ලෙසටත් 2021.09.12 වන දින සවස 5.30ට පමණ ප්‍රධාන ජේලර් මහතා විසින් ඔහුට දන්වා තිබූ බවත්, අනතුරුව සවස 5.45ට පමණ ඇමතිවරයා සමග නිල ඇඳුමෙන් සැරසුණු නියාමන නිලධාරීන් හතර දෙනෙක් සහ MSD යන අකුරු ඇඳුම්වල යොදා තිබූ ආරක්ෂක නිලධාරීන් තිදෙනෙකුත්, 'රියන්සි' නම් තවත් මහතෙකුත් ඇතුළු වූ බවත්ය. (2021.10.07 වන දින සාක්ෂි - 3 සහ 4 පිටු) එසේ වුව ද, 'රියන්සි' නැමැත්තා බන්ධනාගාරය තුළට නොගොස්, ආපසු පිටව ගිය බවටද, රාජ්‍ය ඇමතිවරයා ඇතුළු නිලධාරීන් පිටව ගියේ රාත්‍රී 7.00ට බවටද සාක්ෂියක් ලබා දී ඇත.

තව ද, ඇමති තුමා සමග පැමිණි නිලධාරීන්ට ආයුධ ගෙනත් තිබේ නම්, ඒවා තබා ඇතුල් වන ලෙසට දැනුම් දුන්න ද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට තිබූ ගෞරවය මත අමාත්‍යවරයාව පරීක්ෂා නොකළ බවටත්, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා බන්ධනාගාරයට ඇතුළු වූ බවටත් වැඩිදුරටත් පවසමින්, ඊට අදාළ ප්‍රධාන දොරටුව අසළ තබා ඇති දොරටු ලේඛනයේ 2021.09.12 වන දින යොදා ඇති සටහන් වල සත්‍ය පිටපතක් 'A' සහ 'B' ලෙසට සළකුණු කර ඉදිරිපත් කර ඇත.

මෙකී සාක්ෂිය සනාථ කරමින් අනුරාධපුර බන්ධනාගාරයෙහි ප්‍රධානියා ලෙසට රාජකාරි කරනු ලබන සහකාර බන්ධනාගාර අධිකාරි 'මද්දුම හෙට්ටිගේ රොහාන් අජිත්' නැමැති නිලධාරිවරයා විසින් ද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා 2021.09.12 වන දින සවස 5.45ට පමණ පැමිණි, එදින ම

සවස 7.00ට පමණ බන්ධනාගාරයෙන් පිටත්ව ගිය බවට පවසා ඇත. (2021.10.24 වන දින සාක්ෂි - පෙ.ව.11.40 - 1 සහ 9 පිටු)

කෙසේ වුව ද, ප්‍රධාන පාරේ සිට බන්ධනාගාරයට ඇතුළු වීමට ඇති ප්‍රථම ගේට්ටුවෙහි (පිටත ගේට්ටුව) 2021.09.12 වන දින රාජකාරි කර තිබූ බන්ධනාගාර නියාමක 'නවරත්න හේවයලාගේ තුෂාර ඉන්දික නවරත්න' විසින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ පැමිණීම සහ පිටවීම විස්තර කිරීමේ දී පවසා සිටියේ ,හිටපු රාජ්‍ය අමාත්‍යවරයා පැමිණි WPKY 5041 දරන කළු පාට මෝටර් රථයත්, ආරක්ෂක නිලධාරීන් රැගත් තවත් රථයකුත්, ගේට්ටුවෙන් ඇතුළු වූයේ සවස 5.35ට පමණ බවයි.

මේ අනුව, "එකී පිටත ගේට්ටුවේ සිට ප්‍රධාන ලෑලි දොරට කොපමණ දුරක් ඇත්දැයි" මෙකී නිලධාරියාගෙන් විමසූ විටදී, ඊට "මීටර් 75ක්, 100ක් පමණ තිබෙනවා" යනුවෙන් පැවසූ හෙයින් "එම දුර වාහනයකින් එන්න කොපමණ වේලාවක් යන්නේ දැයි" වැඩිදුරටත් විමසන ලදී. ඊට "විනාඩියක් පමණ. එච්චර වෙලාවක් යන්නේ නැහැ" යනුවෙන් සාක්ෂියක් ලබා දුනි.

ඒ අනුව, ප්‍රධාන දොරටු භාර නිලධාරි වීරසිංහ විසින් රාජ්‍ය අමාත්‍යවරයා ප්‍රධාන දොරටුව අසළට පැමිණියේ සවස 5.45ට යැයි යොදා ඇති සටහන පෙන්වමින්, ඒ සම්බන්ධව ඔහු පවසන්නේ කුමක්දැයි නැවතත් විමසන ලදි. ඊට ඔහු ලබා දුන් පිළිතුර වූයේ , පිටත දොරටුවේ දුරකථනයට සම්බන්ධ වෙලාවන් යෙදූ හෙයින්, වේලාවේ දෝෂයක් වෙන්න පුළුවන් බවටත්, රාජ්‍ය අමාත්‍යවරයා බන්ධනාගාරයට පැමිණියේ සවස 5.40න් පසුව වන බවට පවතින සාක්ෂිය 'විය හැකි' බවටත්ය.

එපමණක් ද නොව, මෙකී නිලධාරියාගේ භාරයේ පැවැති බන්ධනාගාරය තුළට 'පැමිණෙන හා පිට වෙන වාහන' සම්බන්ධයෙන් සටහන් තැබීමේ ලේඛනයෙහි හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ පැමිණි වේලාව යෙදීමේ දී,

ප්‍රථමයෙන් සවස 5.30 යන්න යොදා එය නැවතත් වෙනස් කරමින් 5.35 ලෙසට ඔහු විසින් සටහන් කළ බවටත්, එසේ ඔහු සටහන් වෙනස් කළේ පළමුවෙන් යෙදූ වේලාව වැරදි බවට වැටහුණු නිසා වන බවටත් පවසා ඇත.එසේම, බන්ධනාගාරයෙන් රාත්‍රී 7.00ට පමණ පිට වූවා යැයි ද පවසා ඇත. (2021.10.25 වන දින සාක්ෂි - 1 සිට 3 දක්වා පිටු)

මේ හැරෙන්නට, 2021.09.12 වන දින අනුරාධපුර බන්ධනාගාරයට පැමිණි සහ පිට වූ වේලාව සම්බන්ධව 'හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගෙන්' ප්‍රශ්න කිරීමේ දී ඔහුගේ මතකයේ හැටියට සවස 5.30ට පමණ වන්නේ යැයි ප්‍රථමයෙන් සාක්ෂියක් ලබා දුන්න ද, 'බන්ධනාගාරයට ඇතුල් වූයේ සවස 5.45ට' යැයි සාක්ෂියක් පවතින්නේ නම් , එය 'නිවැරදි විය හැකි'දැයි තවදුරටත් ඔහුගෙන් විමසූ විටදී , කිසිදු හබ කිරීමකින් තොරව 'විය හැකියි' යනුවෙන් සාක්ෂියක් ලබා දී ඇත. එසේ ම බන්ධනාගාරයෙන් පිටව ගියේ කීයටදැයි විමසූ විට මගේ මතකයේ හැටියට ප.ව.7.00ට පමණ යැයි පවසා ඇත. (2021.10.18 වන දින සාක්ෂි - 7 සහ 12 පිටු)

ඉහතින් දක්වා ඇති සියළු වාචික සහ ලිඛිත සාක්ෂි විශ්ලේෂණය කිරීමේ දී අනුරාධපුර බන්ධනාගාර සංචාරය කිරීම සඳහා හිටපු රාජ්‍ය අමාත්‍යවරයාම සවස 5.45ට පමණ බන්ධනාගාරයට ඇතුළු වී සවස 7.00ට පමණ පිටවූ බව සනාථ වෙයි.

විවිධ පනත්වලින් සංශෝධිත 1877 අංක:16 දරන බන්ධනාගාර ආඥා පනතින් බන්ධනාගාරය සහ එහි සිටින රැඳවියන් පරීක්ෂා කිරීම සඳහා ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට, දිසා විනිසුරුවරයෙකුට සහ මහෙස්ත්‍රාත්වරයෙකුට පෙ.ව.5.30ත්, ප.ව.5.30ත් අතර වූ කාලයේ දී සංචාරය කළ හැකි අතර, තම නිරීක්ෂණය සහ නිර්දේශ අමුත්තන්ගේ පොතේ සටහන් කළ හැක.

ඒ අනුව 2021.09.12 වන දින හිටපු රාජ්‍ය අමාත්‍යවරයා අනුරාධපුර බන්ධනාගාරයට ඇතුළු වීම සහ පිටවීම සිදු කර තිබුනේ ද, 1877 අංක: 16 දරන බන්ධනාගාර ආඥා පනතේ 39(2) උප වගන්තියෙහි දැක්වෙන නීතිය උල්ලංඝනය කරමින් බවට තොරතුරු හෙළිදරවු වෙයි.

**b) ශ්‍රී ලංකා ජනරජය රජය නියෝජනය කළ අන්දම**

අනුරාධපුර බන්ධනාගාරයෙහි සහකාර බන්ධනාගාර අධිකාරි 'එම්.එච්.රොහාන් අජිත්' මහතාගේ සාක්ෂිය වූයේ කිසිදු දැනුම් දීමකින් තොරව හිටපු රාජ්‍ය අමාත්‍යවරයා නිල් පාට ඩෙනිම් කලිසමකින් සහ අත් දිග, ඉදිරිපස පොකට් සහිත ජර්සයකින් සැරසී එම්.එස්.ඩී.ලාංඡනය යෙදූ නිලධාරීන් තිදෙනෙකුත්, බන්ධ. පොලිස් නිලධාරීන් හතර දෙනෙකුත් සමගින් බන්ධනාගාරයට පැමිණ, බන්ධනාගාරය ඇතුලේ සංචාරය කිරීමට අවශ්‍ය බවට තමන්ට දැන් වූ බවයි.(2021.10.24 වන දින සාක්ෂි - 3 පිටුව)

මෙම සාක්ෂිය ම තහවුරු කරමින්, අනුරාධපුර බන්ධනාගාරයෙහි ප්‍රධාන ජේලර්වරයා වූ 'ලියනගේ සමන්ත ප්‍රියදර්ශන ලියනගේ' විසින් ද පවසා සිටියේ පූර්ව දැනුම් දීමකින් තොරව හිටපු රාජ්‍ය අමාත්‍යවරයා බන්ධනාගාරයට නිල් පාට ඩෙනිම් කලිසමකින් සහ ඉදිරිපස පොකට් ඇති අත් දිග ස්වේටර් එකකින් ද, දෙපයට සෙරෙප්පු දෙකක් ද සහිතව පැමිණ, බන්ධනාගාරය තුළට ගොස් නේවාසිකයන්ව හමු වීමට අවශ්‍ය බවට කී බවටත්ය. ((2021.10.25 වන දින සාක්ෂි - පෙ.ව.9.30 - 2, 4 සහ 5 පිටු)

හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් ඉහත කී සාක්ෂි කිසිවක් හබ කර නැති අතර, අනුරාධපුර බන්ධනාගාරයට සංචාරය කිරීම සඳහා ඔහු ගියේ සැහැල්ලු ඇඳුමක් වූ ඩෙනිම් ක්ලිසමක් සහ ඉදිරිපසින් අත් දෙක දැමිය හැකි සාක්කුවක් සහිත අත් දිග ස්වීටර් එකකින් සැරසී බවටත්, දෙපයට සෙරෙප්පු දෙකක් දමා තිබූ බවටත් වූ සාක්ෂිය නිවැරැදි බවට පිළි ගන්නා ලදී. (2021.10.18 වන දින සාක්ෂි - 12 සහ 13 පිටු)

මේ අනුව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා 2021.09.12 වන දින අනුරාධපුර බන්ධනාගාරයට සිදු කර තිබූ නිල සංචාරය සඳහාද පැමිණ තිබුනේ, සම්පූර්ණයෙන්ම සිවිල් ඇඳුමකින් සැරසී බවට තොරතුරු අනාවරණය වෙයි.

## c) බන්ධනාගාරය තුළ සිදු කර තිබූ ක්‍රියාකාරකම්

අනුරාධපුර බන්ධනාගාර ප්‍රධානියා වූ සහකාර බන්ධනාගාර අධිකාරි 'අජිත්' මහතා මීට අදාළව ලබා දුන් සාක්ෂිය වූයේ, බන්ධනාගාරයෙහි සිර මැදිරි නිරීක්ෂණය කිරීම සඳහා හිටපු රාජ්‍ය අමාත්‍යවරයාව රැගෙන ගිය අවස්ථාවේ දී 'F' වාට්ටුව අසළ දී, රැඳවියන් ගැන විස්තර ඇසූ විට දී , එහි විශේෂ අංශයේ රැඳවියන් සිටින බවට නිලධාරීන් විසින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට දැන් වූ විට දී, එල්.ටී.ටී.ඊ.සිර/සැකකරුවන්ගේ සමාව සම්බන්ධව සහ ඔහුගේ ගැටළු ගැන කථා කිරීමට ඔවුන්ව පිටතට කැඳවන්න යැයි දැන් වූ බවයි. ඒ අනුව එම වාට්ටුවේ රඳවා සිටි 'C' දරන ලේඛනයෙහි දැක්වෙන රැඳවියන් 18 දෙනාගෙන් එල්.ටී.ටී.ඊ. සිර/සැකකරුවන් 10 දෙනෙක් 'F' වාට්ටුව අසළ වූ මිදුලට කැඳවූ බවටත්, ඔවුන් අඩ කවයක හැඩයට සිට ගත් බවටත්, එවිට වේලාව ප.ව.6.10ත්, 6.15ටත් පමණ වූ බවටත් ය. (2021.10.24 වන දින සාක්ෂි - 4 සහ 5 පිටු)

අනතුරුව, ප්‍රධාන ජේලර් මහතා විසින් රාජ්‍ය අමාත්‍යවරයා පැමිණියේ ඇයිදැයි යන්න රැඳවියන්ට පැහැදිලි කර දෙමින්, 'රැඳවියන්ගේ සමාව සම්බන්ධ කටයුතු කරන්නත්, රැඳවියන්ගේ ගැටළු සම්බන්ධව සොයා බලා ජනාධිපතිට දන්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට' යැයි පැවසූ බවට ද සාක්ෂිකරුට මතකයක් ඇතැයි යනුවෙන් ද, සාක්ෂියක් ලබා දී ඇත. (2021.10.24 වන දින සාක්ෂි - 5 පිටුව)

මෙහි දී රැඳවියන්ගෙන් බොහෝ දෙනෙක් ද්‍රවිඩ ජාතිකයින් වූ හෙයින් ද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා බොහෝ වචන සිංහලෙන් කථා කළ හෙයින් ද, ද්‍රවිඩ භාෂා පරිවර්තකයෙක් සිටියේ දැයි යන්න විමසීමක් සිදු කළ අතර, එබඳු පරිවර්තකයෙක් නොසිටිය ද, මතකයේ හැටියට 'සුලක්ෂන්' නැමැති

රැඳවියා භාෂණ පරිවර්තනය සිදු කළ බවට දුටු බව ද, එසේ වුව ද, ඔහු එක දිගට ම එය සිදු කරනු නොදුටු බවට ද සාක්ෂියක් ලබා දී ඇත. (2021.10.24 වන දින සාක්ෂි - 5 සහ 6 පිටු)

මේ හැරෙන්නට, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා රැඳවියන්ගෙන් මොන මොන වගේ ප්‍රශ්න අහනවා ඇසුනේ දැයි විමසූ විටදී, 'ඔවුන්ට තිබෙන නඩු ගැන, ඔවුන්ගේ ගම් පළාත් සම්බන්ධ තොරතුරු විමසනවා ඇහුනා' යනුවෙන් ද, සමහර අවස්ථාවල හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් රැඳවියන් කිහිප දෙනෙකුට 'ඇත්ත කියන්න, ඇත්ත කියන්න' යැයි කියනු ඇසුන බවටත්, හිතෙන විධියට එසේ කියන්න ඇත්තේ බොරු ප්‍රකාශ කරනවා කියා ඇමතිවරයාට හිතෙන්න ඇති නිසා බවටත්, ඒක නිසා 'ඇත්ත කිව්වා' බවටත් පැහැදිලි සාක්ෂියක් ලබා දී ඇත. (2021.10.24 වන දින සාක්ෂි - 6 පිටුව).

එපමණක් ද නොව, මෙකී හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ ඉදිරියෙහි රැඳවියන් දෙදෙනෙක් පමණ බිමට පහත් වී සිටිනු නිරීක්ෂණය කළ බවට ද, එනමුත් ඔවුන් බිම දණ ගහ ගෙන සිටියා ද, නැතහොත් බිම වාඩි වී සිටියා දැයි යන්න නිවැරදිව කීමට හරිහැටි සාක්ෂිකරුට නිරීක්ෂණය කළ නොහැකි වූ බවට ද, එතැන එළියේ සිටි රැඳවියන්ගෙන් විනාඩි 15ක්, 20ක් පමණ ප්‍රශ්න කළ පසුව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා 'F' වාට්ටුව තුළට ගොස්, එහි ඇතුලේ ද විනාඩි 10ක් පමණ ගත කර, නැවතත් එළියට පැමිණි බවට ද, ප්‍රථමයෙන් ම එළියට කැඳවා තිබූ රැඳවියන් ආපසු වාට්ටුවලට යනවා දුටුවේ එසේ හිටපු රාජ්‍ය අමාත්‍යවරයා එළියට පැමිණ විනාඩි 5-10කින් පමණ පසුව බවට ද, රාජ්‍ය අමාත්‍යවරයා රැඳවියන් සමග සිටි සම්පූර්ණ කාලය තුළ දී ඔහු කළ සෑම දෙයක්ම නිරීක්ෂණය කිරීමට සාක්ෂිකරුට හැකියාවක් නොතිබූ බවට ද, ඊට හේතුව වූයේ ,සාක්ෂිකරුට තිබූ දණ හිස් අමාරුව මත ඇතැම් අවස්ථාවල පිටුපස වූ විදුලි කණුව අසල හේත්තු වී සිටීමට සිදු වීම නිසාත්, පිටුපසට වී ආරක්ෂාව සම්බන්ධව විමසා බැලීමට

සහ නිලධාරීන් අදාළ කාමරවල රාජකාරි කරන්නේ ද යන්න සොයා බැලීමට සිදුවූ නිසාත් යැයි ද සාක්ෂියක් ලබා දී ඇත. (2021.10.24 වන දින සාක්ෂි - 7 සහ 8 පිටු)

ඉහත කී සාක්ෂිය සනාථ කරමින් අනුරාධපුර බන්ධනාගාරයෙහි දෙවැනියට ප්‍රධානියා වූ 'ප්‍රධාන ජේලර්වරයා' විසින් ද සාක්ෂියක් ලබා දෙමින්, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් බන්ධනාගාරය තුළට ගොස් නේවාසිකයන් මුණ ගැසිය යුතු බවට පැවසූවා යැයි සඳහන් කර ඇත. තවද, මුලින් ම හමු වන සිර වාට්ටුව වූ දකුණුපස පිහිටි 'F' වාට්ටුව අසළ දී එල්.ටී.ටී.ඊ.රැඳවියන් සහ විශේෂ ගණයේ රැඳවියන් සිටින බවට ද, ඔවුන් දීර්ඝ කාලයක් රිමාන්ඩ් බන්ධනාගාරගතව සිටින හෙයින්, නඩු කටයුතු කඩිනම් කරන ලෙසට මෙන්ම, යාපනය සහ මැගසින් බන්ධනාගාර වෙත මාරු වී යාමට ඉල්ලීම් කරන බවට ද සාක්ෂිකරු විසින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට දැන් වූ අවස්ථාවේ දී, එකී රැඳවියන්ව හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට ඉදිරිපත් කරන ලෙසට දන්වා සිටි බවටත්, ඒ අනුව 'F' වාට්ටුවේ රඳවා සිටි 18 දෙනාගෙන් විවිධ ඉල්ලීම් කර තිබූ එල්.ටී.ටී.ඊ. රැඳවියන් 10 දෙනෙකු ප.ව.6.10ට පමණ 'F' වාට්ටුව අසළ වූ මිදුලට කැඳ වූ බවටත් පවසා ඇත.

එමෙන් ම, මෙසේ මිදුලට පැමිණි රැඳවියන් අඩ කවයක ආකාරයෙන් රාජ්‍ය අමාත්‍යවරයා ඉදිරිපිට සිට ගෙන සිටිය දී, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා පැමිණි කාරණය සාක්ෂිකරු විසින් රැඳවියන්ට දැනුවත් කර, ඔවුන්ගේ ගැටළු හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට දන්වන්න යැයි දැනුම් දී, රැඳවියන්ට තම ගැටළු රාජ්‍ය අමාත්‍යවරයාට ඉදිරිපත් කිරීම සඳහා සාක්ෂිකරු පිටුපසට ගිය බවට ද පවසා ඇත.

මේ හැරෙන්නට, කිසියම් බන්ධනාගාර නිලධාරියෙක් හෝ වෙනත් තැනැත්තෙක් විසින් සිංහල භාෂාව ද්‍රවිඩ භාෂාවට පරිවර්තනය කළේදැයි යන්න ද මෙම සාක්ෂිකරුගෙන් විමසූ විට දී බන්ධනාගාර නිලධාරීන් කිසිවෙකු පරිවර්තනය කිරීමක් සිදු නොකළ බවටත්, හිටපු රාජ්‍ය

අමාත්‍යවරයා කථා කරනු ඇසුනේ සිංහල භාෂාවෙන් බවටත්, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා කියන දෙය 'රැඳවියන්' විසින් පරිවර්තනය කරනු ඇසුණු බවටත් පැහැදිලි සාක්ෂියක් ලබා දී ඇත.

මෙහි දී රැඳවියන් සහ හිටපු රාජ්‍ය අමාත්‍යවරයා කථා කළේ කුමක්දැයි යන්න මෙම සාක්ෂිකරුගෙන් ද විමසූ විට දී, රැඳවියන් විසින් ඔවුන් නඩුවලට සම්බන්ධ නොමැති බවටත්, බොරු චෝදනා එල්ල කර ඇති බවටත් පවසනවා ඇහුන ද, යාපනය හෝ මැගසින් බන්ධනාගාරවලට මාරු කර යැවීම සඳහා ඉල්ලීමක් කරනු නොඇසුණු බවට ද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් රැඳවියන්ගෙන් නඩුවල විස්තර අසද්දී 'ඇත්ත කියන්න' කියා කියනු ඇසුණු බවටත් පවසා ඇත.

මේ හැරෙන්නට හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ඉදිරියෙහි කිසියම් රැඳවියෙකු බිම වාඩි වී සහ/බිම දණ ගසා ගෙන සිටිනවා සාක්ෂිකරු විසින් දුටුවා දැයි යන්න ද විමසූ විට දී රැඳවියන් දෙදෙනෙක් බිමට පහත් වී සිටිනු දුටුව ද, ඔවුන් නිශ්චිතව දණ ගසා සිටියා ද, බිම වාඩි වී සිටියා ද යන්න ගැන ඔහුගේ අවධානය යොමු වී නොතිබූ බවට ද පවසා ඇත.

එසේ ම, එළියට ගත් රැඳවියන් සමග විනාඩි 10ක් පමණ හිටපු රාජ්‍ය අමාත්‍යවරයා කථා කළ පසුව 'F' වාට්ටුව තුළ රඳවා සිටි රැඳවියන් හා කථා කිරීම සඳහා 'F' වාට්ටුව තුළට ගොස් රැඳී සිටිය බවට ද, මෙම අවස්ථාවේ දී එළියට ගත් රැඳවියන් සිටියේ එළියේ ම බවට ද, ඔවුන් නැවතත් 'F' වාට්ටුව තුළට ගියේ, 'හිටපු රාජ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් විවෘත කළ F' වාට්ටුවල සිර මැදිරි වැසීම අවසන් වූ පසුව සාක්ෂිකරු එළියට පැමිණ රැඳවියන්ට වාට්ටුවලට යන ලෙසට දැන් වූ අවස්ථාවේ දි බවට ද , එසේ සිර මැදිරි වැසීමට විනාඩි 10කින් පමණ ගතවූ බවටද සාක්ෂියක් ලබා දී ඇත.

මේ හැරෙන්නට, 'F' වාට්ටුවේ සිර මැදිරි වසා එළියට පැමිණ බැලූ විට දී, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා කාර්යාලය පැත්තට යනවා දුටු බවට ද, 'F'

වාට්ටුවට රාජ්‍ය අමාත්‍යවරයා යද්දී සාක්ෂිකරු ද හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සමගින් ගිය ද, 'F' වාට්ටුවේ සිට පිටතට හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ආපසු එද්දී තමන් 'F' වාට්ටුවේ තුල රැඳී සිටිමින් සිර මැදිරි වැසීම සඳහා සහභාගිව සිටි බවට ද සාක්ෂියක් ලබා දී ඇත. (2021.10.25 වන දින සාක්ෂි - 7 සිට 10 දක්වා වූ පිටු)

ඉහත කී හිටපු රාජ්‍ය 'අමාත්‍ය ලොහාන් රත්වත්ත' මහතා විසින් ද මෙම කමිටුව ඉදිරියෙහි සාක්ෂි ලබා දුන් අවස්ථාවේ දී, රාජකාරි කටයුත්තක් වශයෙන් බන්ධනාගාරවල සැබෑ තත්ත්වය නිරීක්ෂණය කිරීම සඳහා, පූර්ව දැනුම් දීමකින් තොරව, අනුරාධපුර බන්ධනාගාරයට ගොස්, බන්ධනාගාරය නිරීක්ෂණය කිරීමට අවශ්‍ය බවට නිලධාරීන්ට තමන් දැනුම් දුන් බවට පිළි ගෙන ඇත.

තව ද, සියළු ම වාට්ටු නිරීක්ෂණය කිරීමට තමන්ට අවශ්‍යතාවය තිබුන මුත් වෙලාවේ ප්‍රශ්නයක් තිබූ හෙයින්, දරුණු ගණයේ සිරකරුවන් සිටි 'F' වාට්ටුව නිරීක්ෂණය කිරීමට ඉල්ලා සිටි බවට ද, 'F' වාට්ටුව අසළට ගිය විට දී එහි සිටින රැඳවියන් ත්‍රස්තවාදී පනත යටතේ රඳවා සිටින සැකකරුවන් සහ සිරකරුවන් බවට දැන ගැනීමට ලැබුණු බවට ද, තමන්ගේ දැනුම් දී මත මෙම රැඳවියන් දහ දෙනෙක්, දොළොස් දෙනෙක් තමන් හට ඉදිරිපත් කළ බවට ද, මෙම වාට්ටුව අසළට යන විට වේලාව සවස 6.00 පමණ වූ බවට ද පිළි ගෙන ඇත.

මේ හැරෙන්නට, මෙම රැඳවියන් තමන් ඉදිරියට රැගෙන ආ අවස්ථාවේ දී ඔවුන් අඩ කවයක් ලෙස සිට ගත් බවටත්, ඔවුන් සැම දෙනෙක් සමග ම වෙන වෙන ම කථා කරමින් එහි විනාඩි 10ක් පමණ රැඳී සිටි බවටත් පිළි ගෙන ඇත. (2021.10.18 වන දින සාක්ෂි - 8 සිට 10 දක්වා පිටු)

කෙසේ වුව ද, ඔහුත් රැඳවියනුත් අතර වූ කථා බහ බන්ධනාගාර නිලධාරියෙක් භාෂා පරිවර්තනයට ලක් කළ බවට පවසා සිටියේය. ඒ

අනුව, එකී බන්ධනාගාර නිලධාරියා සම්බන්ධව විස්තරයක් කළ හැකිදැයි විමසා සිටි මුත්, ඊට පිළිතුරු දී කියා සිටියේ 'නම මම දන්නේ නැහැ, ඔහු බන්ධනාගාර නියාමකවරයෙක්' වශයෙන් පමණි. (2021.10.18 වන දින සාක්ෂි - 10 පිටුව)

ඒ අනුව, අනුරාධපුර බන්ධනාගාරයෙහි ප්‍රධානියා වූ සහකාර බන්ධනාගාර අධිකාරී 'රොහාන් අජිත්' ගෙන් මෙන් ම දෙවෙනි ප්‍රධානියා වූ 'සමන්ත ප්‍රියදර්ශන ලියනගේ' මහතා ගෙන් ද, යම් බන්ධනාගාර නිලධාරියෙකු ද්‍රවිඩ භාෂා පරිවර්තකයෙකු වශයෙන් ක්‍රියා කරමින් සිංහල භාෂාව, ද්‍රවිඩ භාෂාවට පරිවර්තනය කලේ ද යන්න විමසන ලදි.

'අජිත්' මහතා පවසා සිටියේ 'සුලක්ෂන්' නැමැති සැකකරු ඇතැම් අවස්ථාවල එසේ ක්‍රියා කළ මුත්, බන්ධනාගාර නිලධාරියෙක් භාෂණ පරිවර්තනය කිරීම සිදු කළ බවට මතකයක් නැති බවටත්ය. (2021.10.24 වන දින සාක්ෂි - 6 පිටුව)

ඉහත කී 'සමන්ත ලියනගේ' මහතා ද පැහැදිලිව ම පවසා සිටියේ, රාජ්‍ය අමාත්‍යවරයා සිංහලෙන් කථා කළ බවත්, කිසිදු බන්ධනාගාර නිලධාරියෙකු එය පරිවර්තනය නොකළ බවත්, ඒ වුනාට, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා කියන දේ 'රැඳවියන්' විසින් පරිවර්තනය කරනු ඇසුන බවටත් ය. (2021.10.25 වන දින සාක්ෂි - 7 පිටුව)

හිටපු රාජ්‍ය අමාත්‍යවරයා අනුරාධපුර බන්ධනාගාරයට සංචාරය කළ අවස්ථාවේ දී ඒ අසළ රැඳී සිටි කිසිදු ජේලර්වරයෙකු හෝ බන්ධනාගාර නියාමකවරයෙකු හෝ රැඳවියෙකු විසින් හෝ හිටපු රාජ්‍ය අමාත්‍යවරයා රැඳවියන් සමග කථා කළ අවස්ථාවේ දී, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා කථා කළ දෑ බන්ධනාගාර නිලධාරියෙකු විසින් පරිවර්තනය කළ බවට පවසා නැත. සැබැවින්ම එබන්දක් සිදුවී තිබුනා නම්, කැඳවන ලද සාක්ෂිකරුවන් 20 දෙනාගෙන් එක් අයෙකු හෝ එය නිරීක්ෂණය කල යුතුව තිබින.

එමෙන් ම, එසේ භාෂා පරිවර්තනය කළ නිලධාරියා කවුදැයි යන්න හඳුනා ගැනීම සඳහා කිසියම් හෝ විස්තරයක් පැවසීමට ද හිටපු රාජ්‍ය අමාත්‍යවරයා අසමත් වී ඇත. අනෙක් අතට බලන විට දී රාජ්‍ය අමාත්‍යවරයා විසින් පවසන අන්දමට බන්ධනාගාර නියාමකවරයෙකු භාෂා පරිවර්තනය කිරීම සිදු කළා නම්, අවම වශයෙන් ඒ අසළ ම සිටි සහකාර බන්ධනාගාර අධිකාරී සහ ප්‍රධාන ජේලර් එය නොදැක සිටින්නට යම් හේතුවක් ඇතැයි සිතිය නොහැක.

ඉහත සියළු කරුණු සළකා බැලීමේ දී, රැඳවියන් සමග හිටපු රාජ්‍ය අමාත්‍යවරයා කථා කළ දේ බන්ධනාගාර නිලධාරියෙකු විසින් දෙමළ භාෂාවෙන් භාෂා පරිවර්තනයට ලක් කළා යැයි හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ලබා දුන් සාක්ෂිය ද 'විය හැකි භාවයෙහි' පරීක්ෂණයෙන් මෙන් ම 'ඒකාකාරී භාවයෙහි' පරීක්ෂණයෙන් ද අසමත් වන මුත්, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා කථා කල දෑ 'රැඳවියෙකු' විසින් භාෂා පරිවර්තනය කළ බවට වන සාක්ෂිය 'ඒකාකාරී භාවයෙහි පරීක්ෂණයෙන්' මෙන් ම 'විය හැකි භාවයෙහි පරීක්ෂණයෙන්' ද සමත් වෙයි.

මේ අනුව, බන්ධනාගාර නිලධාරිවරයෙකු විසින් භාෂණ පරිවර්තනයක් සිදු කළ බවට, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා කරුණු වසන් කරමින් ,අසත්‍ය සාක්ෂි දෙන අයෙකු වන බවට තොරතුරු අනාවරණය වේ.

මේ හැරෙන්නට, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා රැඳවියන් සමගින් කථා කරද්දී ප්‍රථමයෙන් රැඳවියන් අඩ කවයක හැඩයට සිට ගෙන සිටි බවට දුටුවද, පසුව හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ඉදිරියෙහි රැඳවියන් දෙදෙනෙකු බිමට පහත් වී සිටිනු දුටු බවට ඉහත කී සහකාර බන්ධනාගාර අධිකාරිවරයාත්, ප්‍රධාන ජේලර්වරයාත් සාක්ෂියක් ලබා දුන්න ද, 'හිටපු රාජ්‍ය අමාත්‍යවරයා' පවසා සිටියේ ඔහු සමග පැය ½ක් පමණ රැඳවියන් සිටියත්, ඒ අතරතුර කිසිදු අවස්ථාවක කිසිදු රැඳවියෙකු බිම දණ ගැසීමක් හෝ වාඩි වීමක් සිදු නොවූ බවයි. එසේම, මිදුලට කැඳවන ලද කිසිම රැඳවියෙකු හෝ රැඳවියන් වාඩි

වීමක් හෝ දණ ගැසීමක් සිදු කල බවට හෝ තමන් විසින් යම් රැඳවියෙකුට 'ඇත්ත කියන්න' යැයි දැන් වූ බවට යම් සාක්ෂියක් පවතී නම්, එය සම්පූර්ණ අසත්‍යයක් වන බවටද, ඔහු එසේ නොකළ බවටද පවසා ඇත. (2021.10.18 වන දින සාක්ෂි - 11 පිටුව)

කෙසේ වුව ද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ නියමය මත 'F' වාට්ටුව ඉදිරිපිටට කැඳවා තිබූ රැඳවියන් දහ දෙනා අතරින් පස් දෙනෙකුව සාක්ෂියට කැඳවන ලදී.

එහිදී, හොඳින් සිංහල කථා කිරීමට හැකි බවටත්, කථා කරන සිංහල භාෂාව තේරෙන බවටත් පවසමින්, සිංහල භාෂාවෙන් ම මෙම කමිටුව ඉදිරියෙහි සාක්ෂි ලබා දුන් වවුනියා මහාධිකරණ නඩු අංක: HCV/2491/13 දරන නඩුවට රිමාන්ඩ් බන්ධනාගාරගතව සිටින 'මදිඅරසන් සුලක්ෂන්' නැමැත්තා විසින් 2021.09.12 වන දින හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ ක්‍රියා කළාපය සහ සිදු වූ සිද්ධිය විස්තර කරමින් සඳහන් කර සිටියේ, එල්.ටී.ටී.ඊ. නඩුවලට ඉන්න අය එළියට පැමිණෙන ලෙසට බන්ධනාගාර නිලධාරියෙක් සවස 6.00ට පමණ කළ දැනුම් දීම මත 'F' වාට්ටුව ඉස්සරහ ඇති මිදුලට ගිය විට දී, නිල් පාට ඩෙනිම් ජීන්ස් එකක් ද, ඉදිරිපිට අත් දැමිය හැකි සාක්කුවක් සහිත ටී ෂර්ට් එකක් ද ඇඳ සිටි මහත්තයා ගේ ඉණ වටේට තිබුණ පිස්ටල් පටියක රුඳවූ පිස්තෝලයක් දැකිය හැකි වූ බවත්, එම පිස්තෝලය ෂර්ට් එකෙන් භාගයට් වැසී තිබුණු බවටත්ය.

තව ද, එළියට පැමිණි රැඳවියන් දහ දෙනා රවුම් භාගයක හැඩයට සිටි බවටත්, පෝලිමේ පළමුවෙන් ම සිටියේ සූරියබාලන් බවටත්, සාක්ෂිකරු පෝලිමේ නව වෙනියට සිටිය බවටත් පවසා ඇත.

මෙම ස්ථානයෙහි අනුරාධපුර බන්ධනාගාරයෙහි සහකාර බන්ධනාගාර අධිකාරී අජිත් මහතා ද, ප්‍රධාන ජේලර් සමන්ත ලියනගේ ද, ජේලර් ලාල් සහ ජයතිලක ද, නම නොදන්නා තවත් මහත්වරු කීප දෙනෙක් ද සිටි

බවටත්, ප්‍රධාන ජේලර්වරයා විසින් මේ අපේ අමාත්‍යාංශයේ ඇමති තුමා. ඕගොල්ලන්ට සමාව දෙන්න ඇවිල්ලා ඉන්නේ, ඇත්ත කියන්න යැයි කී බවටද පවසා ඇත.

රාජ්‍ය අමාත්‍යවරයා විසින් වැනි වැනී, "උඹලාට ජනාධිපති තුමා මට බලතල දීලා තියෙනවා නිදහස දෙන්න. උඹලාව මරන්නත් පුළුවන්, නිදහස් කරන්නත් පුළුවන්, ඒ හින්දා ඇත්ත කියන අයව මම නිදහස් කරනවා, උඹලා සිංහල මිනිස්සු කී දෙනෙකුව මරලා තිබෙනවා ද?, "කියා ඇසූ බවටත්, එවිට රැඳවියන් විසින් එක පාරට ම "සර් අපි සිංහල මිනිස්සු මැරුවේ නැහැ" යැයි කී විට, එක් එක්කෙනාව ප්‍රශ්න කිරීමට පටන් ගත් බවටත් පවසා ඇත.

මේ අනුව පෝලිමේ ප්‍රථමයෙන් සිටි සූරියබාලන්ගෙන් 'ඇත්ත කියන්න' යැයි හිටපු රාජ්‍ය අමාත්‍යවරයා කියද්දී, 'සූරියබාලන්' සිංහල භාෂාව නොදන්නා කමට උත්තර නොදී බලන් සිටිද්දී , සූරියබාලන් සිංහල නොදන්නා බවට සාක්ෂිකරු කියන්න උත්සාහ කරද්දී, රාජ්‍ය අමාත්‍යවරයා අත දික් කර සාක්ෂිකරුට ඉන්න කියා, 'ෂුවර් එකට ම දන්නවා මුට සිංහල දන්නවා කියලා' කී බවටත්, පසුව සූරියබාලන් විසින් යාළුවෙකුට උදව් කරන්න ගොස් ඔහුව අත් අඩංගුවට ගත් බවට කී විට දී, 'තමුසේ බොරු කියනවා' යැයි පවසමින්, වම් අත දික් කර 'දණ ගහන්න' යැයි ඇන් වූ බවටත්, ඒ අනුව සූරියබාලන් දණ ගැසූ බවටත් සාක්ෂියක් ලබා දී ඇත.

ඉන් අනතුරුව එක එක්කෙනාට 'ඇත්ත කියන්න', 'ඇත්ත කියන්න', 'තමුන් සිංහල මිනිස්සු මැරුවා ද, එල්.ටී.ටී.එකේ හිටියා ද, මම නම් මිනිස්සු මරලා තියෙන්නේ, මම බය නැහැ, ඇත්ත කිව්වොත් සමාව දෙනවා" කියලා කී බවට ද, සිර දඬුවම් නියම වූ සුදාකරන් නොහොත් යෝගරාජා විසින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට කී දෙයින් පසුව, "මෙයා නම් ඇත්ත කිව්වා, මුට මම නිදහස දෙනවා" යැයි පැවසූ බවටත්, එක් එක්කෙනාගෙන් ප්‍රශ්න කළ පසුව 9 වෙනියට සිටි සාක්ෂිකරුගෙන් ද ' එල්.ටී.ටී.ඊ. එකේ

හිටිය ද, ඇත්ත කිව්වොත් සමාව දෙනවා' යැයි හිටපු රාජ්‍ය අමාත්‍යවරයා කිව් විට 'සර් මම නම් ඇත්ත තමයි කියන්නේ, එල්.ටී.ටී.එකේ හිටියා කියලා මහාධිකරණයේ නඩු පවරලා තිබෙනවා' යැයි පවසා සිටි බවට සඳහන් කර ඇත. එවිට 'සිංහල මිනිස්සු මැරුවා' ද කියා විමසූ විට දී ඊට 'නැහැ' යැයි සාක්ෂිකරු කියූ විට දී 'තමුසෙත් බොරු කියන්නේ' යැයි පවසා සූරියබාලන් දණ ගසා සිටින තැන පෙන්වා එතැන දණ ගසන්න යැයි දැන් වූ බවටත්, එවිට,හිටපු රාජ්‍ය ඇමතිතුමාට තිබූ බයට, අකමැත්තෙන් දණ ගැසූ බවටත් සාක්ෂියක් ලබා දී ඇත. (2021.09.28 වන දින සාක්ෂි - 4 සිට 6 දක්වා පිටු)

එපමණක් ද නොව, ඉහත කී සාක්ෂිකරු විසින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ ක්‍රියා කළාපයන් වැඩිදුරටත් විස්තර කරමින් , හිටපු රාජ්‍ය අමාත්‍යවරයා මෙම අවස්ථාවේ දී සිහියෙන් නොසිටි බවටත්, බීපු අයෙකු හැසිරෙන අන්දමට එකම ප්‍රශ්නය නැවත නැවත අසමින්, සිට ගැනීමට ද අපහසු අන්දමට වැනි වැනී සිටි බවටත් පවසමින්, 10 වෙනියට සිටි රැඳවියාගෙන් ප්‍රශ්න කළාට පසුව 'F' වාට්ටුව තුළට ගිය බවටත්, එසේ ස් නැවත එළියට එන තෙක් සූරියබාලන් සහ සාක්ෂිකරු බයට තවදුරටත් දණ ගසා ගෙන සිටි බවටත්, එසේ දණ ගසා ගෙන සිටි ස්ථානයෙහි බිම, වැලි බොරළු තිබුණු හෙයින් ගල් ඇනී රිදුන බවටත්, සරම ගුලි කර දණ හිසට තියා ගෙන දණ ගසා ගෙන සිටි හෙයින්, තුවාල සිදු නොවුන බවටත් වැඩිදුරටත් සාක්ෂියක් ලබා දී ඇත. (2021.09.28 වන දින සාක්ෂි - 6 සහ 7 පිටු)

තව ද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා 'F' වාට්ටුවට ගොස් නැවතත් එළියට ආ පසුව, එළියේ එතෙක් හිට ගෙන සිටි අනිත් රැඳවියන් අට දෙනාට ද වැලි සහිත බිමේ දණ ගැසීමට දන්වා, සාක්ෂිකරුත්, සූරියබාලන් යන අයත් දණ ගසා ගෙන සිටිය තැනට අඩි 1 ½ ක් පමණ දුරින් සිට ගෙන, "ඇත්ත කියනවද, නැද්ද" කියා හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ ඉණේ තිබුන

පිස්තෝලය එළියට ගෙන, සූරියබාලන්ට' ඇත්ත කියන්න' කියා දන්වන ලෙසට සාක්ෂිකරුට කල දැන්වීමට, දෙමළ භාෂාවෙන් එය සූරියබාලන්ට තේරුම් කර දුන් විට, සූරියබාලන් විසින් දෙමළෙන් සාක්ෂිකරුට, "කසාද බැඳ දුවෙකු සිටින බවටත්, යාළුවෙකුට උදව් කළ බවටත්, ඇත්ත තමයි පවසන්නේ" යැයි කී බවත්, ඒ අනුව, සූරියබාලන් පැවසූ දෙය හිටපු රාජ්‍ය ඇමතිවරයාට පැවසූ බවටත් සාක්ෂියක් ලබා දී ඇත.

එසේ වුවද, මෙම අවස්ථාවේදි හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ අත තිබූ පිස්තෝලය ලෝඩ් කර, බිම දණ ගසා ගෙන සිටි සාක්ෂිකරුගේත්, සූරියබාලන්ගේත් මුහුණ දෙසට එල්ල කරමින්, එක් ඇඟිල්ලක් පිස්තෝලේ කොකාට ද තබා ගෙන සිටිය බවටද, මෙම අවස්ථාවේ දී වැරදිලාවත් ඇඟිල්ල කොකාට තද වුනා නම්, පිස්තෝලේ තිබුණු විදිහට සාක්ෂිකරුගේ ඔළුවට වෙඩි වදින බැවින්, සාක්ෂිකරු හොඳට ම බියට පත් වී අත් දෙක පිටි පස්සට බැඳ ගෙන සිටිය බවටද, එම අවස්ථාවේ දී සහකාර බන්ධනාගාර අධිකාරි විසින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ අනිත් අතේ වැලමිටෙන් අල්ලා (පිස්තෝලේ තිබුණ අත නොව) "සර්" කියා කී බවටද පවසා ඇත.

මෙම සිද්ධියෙන් පසුව හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සූරියබාලන්ව පෙන්වමින්, 'මෙයාට වෙඩි තියන්න ඕන කියා මෙයා අතනට එක්ක යන්න, වෙඩි තියන්න ඕන' යැයි කියා කී බැවින්, අඩි 15ක්, 20ක් පමණ දුරකට සූරියබාලන්ව රැගෙන ගිය විට දී, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ඒ පසුපස ගිය බවටද, මේ අවස්ථාවේ දී ප්‍රධාන ජේලර්වරයා පැමිණ අනික් සියළු දෙනාට වාට්ටුවට යන ලෙසට දන්වා සිටි බවට ද සඳහන් කර ඇත. එසේ වාට්ටුවට යන විට දී රූපවාහිනියේ දෙරණ ප්‍රවෘත්ති පටන් ගෙන තිබූ බවට වැඩිදුරටත් සාක්ෂියක් ලබා දී ඇත. ((2021.09.28 වන දින සාක්ෂි - 7 සිට 11 දක්වා පිටු)

ඉහත කී සාක්ෂිය ම සනාථ කරමින්, වවුනියා මහෙස්ත්‍රාත් අධිකරණ නඩු අංක: B/13/19 දරන නඩුවට රිමාන්ඩ් බන්ධනාගාරගතව සිටින සුලක්ෂන්

විසින් 'සූරියබාලන්' යනුවෙන් හඳුන්වන ලද, 'පුබාලසිංහම් සූරියබාලන්' යන අය ද සාක්ෂි දෙමින් පවසා සිටියේ, එල්.ටී.ටී.ඊ නඩු හා සම්බන්ධ 10 දෙනෙකු 'F' වාට්ටුවේ සිටින බවත්, ඉන් 9 දෙනෙක් සැක පිට සිටින අයවළුන් වන බවත්, එක් අයෙක් පමණක් දඬුවම් විඳින අයෙක් වන බවත් ය. එමෙන් ම 2021.09.12 වන දින සවස 6.05ට පමණ වාට්ටුව භාර මහතා පැමිණ එල්.ටී.ටී.ඊ අයට එළියට එන ලෙසට කළ ඉල්ලීමට, එළියට ඇවිත් බලද්දී ඩෙනිම් කලිසමක් සහ ස්වේටර් එකක් ඇඳ ගෙන බන්ධනාගාරයට පැමිණ තිබූ, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ ස්වේටරය යටින් පිස්තෝලයක් වැනි පොඩි තුවක්කුවක් ද ඉණට පහළින් තිබෙනු දුටුව බවටද පවසා ඇත.

අනතුරුව, එළියට පැමිණි රැඳවියන්ට බන්ධනාගාරයෙහි ප්‍රධාන ජේලර් විසින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාව හඳුන්වා දුන් බවටද, එම අවස්ථාවේ දී සහකාර බන්ධනාගාර අධිකාරිවරයා ද, ජේලර්වරු තිදෙනෙකු ද, ප්‍රධාන ජේලර් ද, වාට්ටුව භාර මහත්මයා සහ 'F' වාට්ටුව නිලධාරි ද එකතුව, බන්ධනාගාර නිලධාරීන් 8 දෙනෙක් පමණ සිටි බවටද, ප්‍රධාන ජේලර් විසින් 'ඇමති තුමා ඇවිත් ඉන්නේ නිදහස් කිරීම සම්බන්ධව කථා කරන්න' යැයි කී බවටද, හිටපු රාජ්‍ය ඇමතිවරයා සිංහලෙන් කියූ මෙම කරුණු සාක්ෂිකරු අසළ සිටි 'සුදාකරන්' ඔහුට දෙමළෙන් කී බවට ද පවසා ඇත.

මේ හැරෙන්නට, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් පලමුවෙන්ම කථා කලේ ඔහු සමගින් වන බවටද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සිංහලෙන් කියූ දේත් , සාක්ෂිකරු විසින් දෙමලෙන් කියූ දේත් තේරුම් කරදුන්නේ ඒ ආසන්නයෙහි සිටි 'සුදාකරන්' යැයි ද සාක්ෂියක් ලබා දී ඇත.

ඒ අනුව, 'සුදාකරන්' විසින්, සාක්ෂිකරුට 'ඇත්ත කියන්න, ඇත්ත කිව්වොත් අපිව නිදහස් කරනවා' යැයි හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් කියන බවට දැන්වූ විටදි, සාක්ෂිකරු විසින් ඔහු 2019 දී සැක පිට අත් අඩංගුවට ගත් බවට දෙමලෙන් පිලිතුරු දුන්නද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් 'සිංහලෙන් කියන්න' යැයි කියා තිබූ බවටද, පවසා ඇත. එහිදී

නවවෙනි තැන සිටි සුලක්ෂන් විසින් සාක්ෂිකරු කියූ දේ සිංහල භාෂාවෙන් කියන්න උත්සාහ කරද්දි, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සුලක්ෂන්ව අතින් නතර කර, 'මොහු සිංහල දන්නවා, සිංහලෙන් කියන්න' යැයි කියා තිබූ බවටද පවසා ඇත. මෙහිදී , සාක්ෂිකරු සිංහල නොදන්නා බව සුදාකරන් විසින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට දන්වා ඇත. එවිට, 'මොහු සිංහල දන්නවා, සිංහලෙන් කියන්න' යැයි හිටපු රාජ්‍ය අමාත්‍යවරයා පවසා ඇත. අනතුරුව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සාක්ෂිකරුගේ ආසන්නයට පැමිණ, 'උඹ ගෙවල්වලට ඇතුල් වෙලා කී දෙනෙක් වෙඩි තියලා තිබෙනවා ද?' කියා අසා ඇත. ඒ අනුව සාක්ෂිකරු විසින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට දෙමළෙන් පිළිතුරු දී එවැනි ක්‍රියාවක් කර නැති බවටත්, සැක පිට අත් අඩංගුවට ගෙන තිබෙන බවටත් දැන් වූ විට දී, හිටපු රාජ්‍ය ඇමතිතුමා විසින් සාක්ෂිකරුට බොරු කියන බවට දන්වා, දණ ගහණ ලෙසට, සාක්ෂිකරු හිට ගෙන හිපු තැන සිට අඩියක් පමණ දුරින් වම් අත දික් කරමින් පෙන්වා ඇත.

ඒ අනුව, හිටපු රාජ්‍ය ඇමතිතුමා වෙත තිබූ භයට  එම ස්ථානයට ගොස්, අකමැත්තෙන් බිම දණ ගසා ගෙන සිටියද, එම ස්ථානය වැලි සහ පොඩි ගල් සහිත බිමක්  වූ හෙයින් දණ හිස් තුවාල වූ බවට ද සාක්ෂියක් ලබා දී ඇත.

එපමණක්ද නොව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා පෝලිමේ සිටි  එකිනෙකා ගාවට ගොස් ප්‍රශ්න කර, නව වෙනියට සිටි සුලක්ෂන් ළඟට ද ගොස් මොකක්ද අසා, සුලක්ෂන්ටත් සාක්ෂිකරු ළඟට ගොස් දණ ගසන ලෙසට කල දැන්වීම මත , සුලක්ෂන් ද තමා අසලට පැමිණ දණ ගසාගෙන  සිටි බවට ද, වැඩිදුරටත් සාක්ෂියක් ලබා දී ඇත. (2021.09.29 වන දින සාක්ෂි - 4 සිට 8  දක්වා පිටු)

එමෙන්ම, 10 වෙනියට හිටපු පුද්ගලයාගෙන් ප්‍රශ්න කළ පසුව හිටපු රාජ්‍ය අමාත්‍යවරයා 'F' වාට්ටුවට ගිය මුත්, ඔවුන්ට 'නැගිටින්න' කියා ඇනුම්

තුදුන් හෙයින්, ආපසු 'F' වාට්ටුවේ සිට එළියට එන තෙක් විනාඩි 15ක්, 20ක් පමණ එළියේ දණ ගසා ගෙන සිටිය බවට ද, අනතුරුව හිටපු රාජ්‍ය අමාත්‍යවරයා එළියට පැමිණි පසුව අනික් රැඳවියන් අට දෙනාට ද බොරළු සහ වැලි සහිත පොළවේ දණ ගැසීමට දන්වා, සාක්ෂිකරුත්, සුලක්ෂනුත් සිටි තැනට පැමිණ සිංහලෙන් යමක් කී බවට ද සාක්ෂියක් ලබා දී ඇත.

තව ද, මෙලෙස කී දේ සුලක්ෂන් සාක්ෂිකරුට දෙමළ භාෂාවෙන් පැහැදිලි කර දෙමින් "ඇත්ත කියන්න, ඇත්ත කියන්න" යැයි හිටපු රාජ්‍ය අමාත්‍යවරයා පවසනවා යැයි කී විට "මට දෙමව්පියන් සහ මම විවාහ වෙලා මා හට දුවෙකුත් ඉන්නවා, මම යාළුවෙකුට උදව් කරන්න ගිහිල්ලා තමයි මාව අත් අඩංගුවට ගත්තේ" කියලා දෙමළෙන් කී බවත්, එය සුලක්ෂන් විසින් ඇමතිවරයාට පැවසූ විට දී, සිංහලෙන් යමක් පැවසූ බවත්, සුලක්ෂන් විසින් එය දෙමළෙන් තමන්ට පැහැදිලි කර දෙමින්, "මට වෙඩි තියන්නත් පුළුවන්, නිදහස් කරන්නත් පුළුවන්, ඒ නිසා ඇත්ත කියන්න" කියා කියන බවට දැන් වූ බවත්, මෙම අවස්ථාවේදි "නෑ සර් මම කියන්නේ ඇත්ත" යැයි පැවසූ විට දී සුලක්ෂන් එය ද හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට සිංහලෙන් පැවසූ විට දී "තමන් බොරු කියනවා" යැයි පවසා ඉණේ තිබූ පිස්තෝලය අතට ගෙන, එය ලෝඩ් කර, සුලක්ෂන් සහ සාක්ෂිකරුගේ හිස දෙසට එල්ල කළ බවට ද පවසා ඇත.

මෙම අවස්ථාවේ දී ඔවුන්ට අඩි 2ක් පමණ දුරින් සිටිමින්, හිටපු රාජ්‍ය ඇමති තුමා පිස්තෝලය ලෝඩ් කළ හෙයින් ද, හිටපු රාජ්‍ය ඇමති තුමාගේ අතින් කොකා ගැස්සුණා නම් ඔවුන් දෙදෙනාගෙන් එක් අයෙකු මැරෙන බැවින් ද, අත් දෙක පිටි පස්සට බැඳ ගෙන 'වෙඩි තබා මරයි' කියා බියට පත් වුණු බවට ද සාක්ෂියක් ලබා දී ඇත. එසේම, මෙම අවස්ථාවේ දී සහකාර බන්ධනාගාර අධිකාරිවරයා හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ අතින් ඇල්ලූ බවට ද, පසුව හිටපු රාජ්‍ය ඇමතිවරයා සිංහලෙන් යමක් පැවසූ පසුව හිටපු රාජ්‍ය ඇමතිවරයා සමග සිටි නිලධාරියෙක් සාක්ෂිකරුගේ උර හිසට

තට්ටු කර මීටර් 10ක් පමණ එහා පැත්තට එක්ක ගෙන ගිය බවටද පවසා ඇත.

අනතුරුව, එම ස්ථානයට ද පැමිණි හිටපු රාජ්‍ය ඇමතිවරයා සාක්ෂිකරුගේ මුහුනු ආවරණය ගලවා පෙන්වන ලෙසටත්, නැවතත් දණ ගහන ලෙසටත් නියම කර, හිටපු රාජ්‍ය ඇමතිවරයාගේ මුහුණු ආවරණය ද ඉවත් කර, ඔහුගේ අතේ තිබූ පිස්තෝලය නැවතත් සාක්ෂිකරුගේ ඔළුව දෙසට දික් කර, 'ඇත්ත කියන්න, ඇත්ත කියන්න' කියූ බවට ද, ඒ අවස්ථාවේ දී හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට අත් දෙකින් වැඳ ගෙන 'සර් මට පවුලක් තිබෙනවා, විවාහ වෙලා දුවෙකුත් ඉන්නවා, මම ඇත්ත කියන්නේ' කියලා පවසමින්, වෙඩි තියන්න යන බවට සිතා බියට පත්ව හොඳට ම ඇඩූ බවටද, අනතුරුව, ඇමති තුමා ඒ දෙස බලා යන්න ගිය බවටත් සාක්ෂියක් ලබා දී ඇත.

ඉන් අනතුරුව එතනට පැමිණි නිලධාරි මහත්මයෙක්, උරහිසට තට්ටු කර වාට්ටුවට යන ලෙස දැන් වූ විටදී, කකුල් අමාරුවට නොන්ඩි ගසමින්, සිර මැදිරියට පවා ගොස් සාක්ෂිකරු හොඳටම හැඬූ බවටත් සාක්ෂියක් ලබා දී ඇත. (2021.09.29 වන දින සාක්ෂි - 8 සිට 10 දක්වා පිටු)

තවද, මෙලෙස හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ක්‍රියා කළ අවස්ථාවේ දී බීමත්ව සිටි බවට සාක්ෂිකරු දැන ගත්තා යැයි ද, වැඩිදුරටත් පවසා සිටි හෙයින්, 'එසේ හිතන්නේ කුමක් නිසාදැයි' සාක්ෂිකරුගෙන් විමසූ විට දී, 'මගේ ඉස්සරහ හිට ගෙන ඉන්න කොට ඔහු වැනි වැනී හිටියේ. ඊට අමතරව මා ළඟට ඇවිත් මාස්කස් එක ගලවන කොටත් ගඳක් ආවා යනුවෙන් ද අපේ කිසිම සුභ සාධනයක් ගැන අසා බැලුවේ නැහැ' යනුවෙන්ද සඳහන් කරමින්, 'බන්ධනාගාරයට එදින ආවේ රාජකාරියකට නොවෙයි, එහෙම මම කියන්නේ එතුමා මේ ආවේ තමන්ගේ පුද්ගලිකව මේ ගමන ඇවිත් තිබෙන්නේ' යනුවෙන් ද සාක්ෂියක් ලබා දී ඇත. (2021.09.29 වන දින සාක්ෂි - 12 පිටුව)

ඉහත කී 'සුලක්ෂන්' මෙන් ම 'සූරියබාලන්' නැමැත්තා ද ලබා දුන් සාක්ෂි සනාථ කරමින් සිංහල භාෂාව කථා කිරීමට මෙන් ම, එසේ කථා කරන භාෂාව තේරෙන බව පවසන ලද්දා වූ ද, සූරියබාලන් විසින් 'සුදාකරන්' වශයෙන් හඳුන්වන ලද්දා වූ ද, වවුනියාව මහෙස්ත්‍රාත් අධිකරණයේ අංක: B/13/19 දරන නඩුවට රිමාන්ඩ් බන්ධනාගාරගතව සිටින 'මෙයියමුත්තුරාසා සුදාකරන්' යන අය ද සාක්ෂියක් ලබා දී ඇත. ඔහුගේ සාක්ෂිය වූයේ ඔහුද 'F' වාට්ටුවේ රඳවා සිටින එල්.ටී.ටී.ඊ නඩුවලට සම්බන්ධ අයෙක් වන බවත්, 2021.09.12 වන දින සවස 6.05ට පමණ එල්.ටී.ටී.ඊ නඩුවල සිටින අයවලුන්ට එළියට එන ලෙසට කළ දැනුම් දීම මත ඔහු ද එළියට ගිය අවස්ථාවේදී, ප්‍රධාන ජේලර් මහතා විසින් බන්ධනාගාර ඇමතිතුමා කට්ටියට සමාව දෙන්න පැමිණ ඇති බවට දැනුම් දුන් බවටත්, ඩෙනිම් කලිසමකින් සහ අත් දිග ස්වීටර් වගේ ටී ෂර්ට් එකකින් සැරසී සිටි මෙකී රාජ්‍ය ඇමතිවරයාගේ ඉණේ පිස්තෝලයක් ඕල්සර් එකක රඳවා ගෙන තිබෙනු දුටු බවටත් ය.

එසේම සියළු දෙනා ම එළියට පැමිණි පසුව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සිංහලෙන් කථා කරමින් ජනාධිපති තුමා විසින් බලය ලබා දී තිබෙන බවට ද, 'සමාව දෙන්නත්, මරන්නත් පුළුවන්' යැයි කියමින් ද 'ඇත්ත කියන්න' කියා කී බවට ද, ඒ වෙලාවේ ජනාධිපති තුමා සමාව දෙයි කියා ඔහු සිතූ බවට ද පවසා ඇත. තවද, පළමුවෙන් ම සිටගෙන සිටි සූරියබාලන්ගෙන් 'කී දෙනෙකුට වෙඩි තිබ්බා ද' කියා හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සිංහලෙන් විමසූ විට දී සූරියබාලන් විසින් 'සිංහල දන්නේ නෑ' යැයි දෙමළෙන් කී විටදී, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් 'කවුද සිංහල දන්නේ' කියා විමසුව බවත්, එවිට සාක්ෂිකරු විසින් 'පොඩ්ඩක් දන්නවා' යැයි කී විට, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් නැවතත් සූරියබාලන්ට සිංහලෙන් කථා කරමින් 'ලංකාවේ ඉපදිලාත් සිංහල දන්නේ නැද්ද' කියා 'බොරු කියන්න එපා ඔයා සිංහල දන්නවා, සිංහල කථා කරන්න' යැයි කියමින්, 'අපේ කට්ටිය කී දෙනෙකුට වෙඩි තිබ්බා ද' කියා විමසා සිටි බවටත් සාක්ෂියක් ලබා දී ඇත.

මෙම කරුණ දෙමළෙන් සාක්ෂිකරු විසින් සූරියබාලන්ට කී විට දී, '2019 දී අත් අඩංගුවට ගත්තා' යැයි සූරියබාලන් පැවසූ කරුණ හිටපු රාජ්‍ය ඇමති තුමාට සිංහලෙන් කී විට දී, හිටපු රාජ්‍ය ඇමති තුමා විසින් 'බොරු කියන්න එපා' යැයි ද, 'ඔයා බොරු කියන්නේ ඔයා සිංහල දන්නවා'. අතනට ගිහින් දණ ගහන්න යැයි අත දික් කරමින් පවසා සිටිය බවටත්, ඒ අනුව හිටපු රාජ්‍ය අමාත්‍යවරයා අතින් පෙන්වා දීපු තැනට ගොස් සූරියබාලන් දණ ගහ ගත්ත බවටත් සාක්ෂිකරු ලබා දී ඇත.

ඉන් අනතුරුව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා තමන් ළඟට ද ඇවිත් "අපේ කට්ටිය කී දෙනෙකුට වෙඩි තිබ්බා ද" යනුවෙන් විමසූ විට දී "නැහැ සර් 2019 මාව අත් අඩංගුවට ගත්තේ" යැයි පවසා සිටියද , "බොරු කියන්න එපා" යැයි ද "ඇත්ත කියන්න, බොරු කියන්න එපා" යැයි ද පැවසුව බවටත් වැඩිදුරටත් පවසා ඇත.

මෙලෙස එක් එක් රැඳවියන්ගෙන් "ඇත්ත කියන්න සිංහල මිනිස්සු මැරුවා ද? " වැනි ප්‍රශ්න වැඩිපුර අසමින්, නව වෙනියට සිටි සුලක්ෂන් ගාවට ද ගොස් මොනවාද කථා කර, සූරියබාලන් ඉන්න තැනට අත දික් කර පෙන්වමින් යමක් කී බවටත්, එවිට සුලක්ෂන් ද, සූරියබාලන් අසළින් දණ ගසා ගත් බවටත් වැඩිදුර සාක්ෂියක් ලබා දී ඇත. (2021.09.29 වන දින සාක්ෂි - ප.ව.1.40 - 3 සිට 7 දක්වා පිටු)

එපමණක් ද නොව, 10 වෙනියාට සිටි අයට ද කථා කර අවසන් වූ පසුව, හිටපු රාජ්‍ය ඇමතිවරයා 'F' වාට්ටුව ඇතුළට ගියද, ආපසු පැමිණෙන තෙක් රැඳවියන් තවදුරටත් මිදුලේ රැඳී සිටිය බවට ද, අනතුරුව හිටපු රාජ්‍ය අමාත්‍යවරයා එළියට පැමිණ, සිටගෙන සිටි අනිකුත් රැඳවියන් සියළු දෙනාටම වැලි මිශ්‍ර බොරළු පොළවේ දණ ගසන ලෙසට ඇනුම් දුන් බවට ද සාක්ෂියක් ලබා දී ඇත.

ඉන් අනතුරුව, යෝගරාජා, කාන්තරූබන් සහ සිදුර්සන් ළඟට ගොස් 'ඔයා ඇත්ත කිව්වා' යනුවෙන් පවසා, 'සූරියබාලන්' ළඟට ද ගොස් යමක් කථා කරනවාත්, 'සුලක්ෂන්' එය දෙමළ භාෂාවට පරිවර්තනය කරනවාත් යාන්තමින් ඇසුණු මුත්, 'ඔයා බොරු කියනවා, ඇත්ත කියන්න' යැයි කියනු ඇසුණු බවට පවසා ඇත. එසේ ම සූරියබාලන් විසින් 'සර් මම බැඳලා ඉන්නේ, දුවෙකුත් ඉන්නවා යැයි පැවසූ දේ සුලක්ෂන් සිංහලෙන් හිටපු රාජ්‍ය ඇමතිවරයාට කියනවාත්, හිටපු රාජ්‍ය ඇමතිවරයා විසින් 'බොරු කියනවා' යැයි කියා පිස්තෝලය අතට ගෙන, ලෝඩ් කර, සූරියබාලන් සහ සුලක්ෂන් යන දෙදෙනාගේ මුහුණ පැත්තට තුවක්කු බටේ එල්ල කළ බවට මෙන්ම, මෙම අවස්ථාවේ දී සහකාර බන්ධනාගාර අධිකාරිවරයා විසින් හිටපු රාජ්‍ය හිටපු රාජ්‍ය ඇමතිවරයාගේ අත ඇල්ලූ බවට ද මතකයක් පවතින බවට සාක්ෂියක් ලබා දී ඇත.

එනමුදු නැවතත්, හිටපු රාජ්‍ය ඇමතිවරයාගේ උපදෙස් පිට ඔහුගේ ආරක්ෂක නිලධාරීන් සූරියබාලන්ව නැගිට්ටවා මීටර් 10-18ක් දුරකට රැගෙන ගිය පසුව,නැවතත් දණ ගසා ගෙන සිටිනු දුටු බවට ද, මේ අතරතුර එළියේ සිටි රැඳවියන් 'F' වාට්ටුව තුළට ගිය බවට ද, ඊට විනාඩි 2-3කට පසුව හිටපු රාජ්‍ය ඇමතිවරයා පිටව ගිය පසුව,සූරියබාලන් අඩ අඩා නොන්ඩි ගසමින්,සූරියබාලන් සහ සාක්ෂිකරු එකට සිටින සිර මැදිරියට පැමිණි බවට ද සාක්ෂියක් ලබා දී ඇත.

එසේ ම, 'සූරියබාලන්' සිර මැදිරියට පැමිණි පසුව සූරියබාලන්ගේ කකුල් දෙකේ අයිඩෙක්ස් ගසා ඔහු විසින් මසාජ් කළ බවට ද, දණ හිස් දෙකේ ම ගල් ඇනිච්ච තැළුම් තුවාල දුටු බවට පමණක් නොව, සාක්ෂිකරුගේ ද දණ හිස්වල ගල් ඇණුනු තුවාල තිබුණු බවට ද සාක්ෂියක් ලබා දී ඇත.

එපමණක් ද නොව, සූරියබාලන්ට සිංහල කථා කිරීමට අපහසු බැවින්, දණ හිස් අමාරුවට බෙහෙත් ගැනීම සඳහා පසු දින බන්ධනාගාර රෝහලේ සිටිය වෛද්‍යවරිය ළඟට සාක්ෂිකරු විසින් සූරියබාලන්ව රැගෙන ගොස්,

බෙහෙත් රැගෙන ආ බවටත්, එනමුත්, වෛද්‍යවරිය කොරෝනා නිසා අඩි 4ක් පමණ දුර සිට සූරියබාලන්ව පරීක්ෂා කර බෙහෙත් ලබා දුන් බවටත් පවසා ඇත. (2021.09.29 වන දින සාක්ෂි - 7 සිට 10 දක්වා පිටු)

ඉහත කී සාක්ෂි තහවුරු කරමින් වවුනියා මහාධිකරණයේ අංක: 249/13 දරන නඩුවට රිමාන්ඩ් බන්ධනාගාරගතව සිටින 'රාසතුරෙයි තිරුවරුල්' නැමැත්තා ද සාක්ෂියක් ලබා දී ඇත. ඔහු වවුනියා මහාධිකරණ අංක: 249/13 දරන නඩුවට අනුරාධපුර බන්ධනාගාරයෙහි සිටින රිමාන්ඩ් සිරකරුවෙකි.

මෙම සාක්ෂිකරු ද පවසා සිටියේ, එල්.ටී.ටී.ඊ නඩු සම්බන්ධව සිටින පුද්ගලයන්ට එළියට එන්න යැයි කළ දැනුම් දීමක් මත ඔහු ද ඇතුළුව දස දෙනෙකු 'F' වාට්ටුව ඉදිරියෙහි තිබෙන මිදුලට ගොස් රවුම් හාගයක හැඩයට හිට ගෙන සිටිද්දී, බන්ධනාගාරයෙහි ප්‍රධාන ජේලර් පැමිණ "ඕගොල්ලන්ව නිදහස් කිරීමට ඇමති තුමා ඇවිත් ඉන්න බවට සහ 'ඇත්ත කියන්න' යැයි දැන් වූ මුත් , අනතුරුව හිටපු රාජ්‍ය ඇමතිවරයා මුලින් ම සිට ගෙන සිටි සූරියබාලන් ළඟට ගොස් කථා කරමින් "බොරු කියනවා"යැයි පවසා, දණ ගැසීමට දැන් වූ බව ය.

තව ද, මෙලෙස සුදාකරන්, සිදුර්සන්, ගජින්ද්‍රන්, කාන්ත රූබන්, යෝගරාජ් යන අයගෙන් ද ප්‍රශ්න කරමින් පැමිණ, හත් වෙනියට සිටි සාක්ෂිකරු ළඟට ද පැමිණි බවටත්, එම අවස්ථාවේ දී ඇමතිවරයා ඇඳ ගෙන සිටි ටී ෂර්ට් එක පොඩ්ඩක් ඉස්සී තිබුන හෙයින් ඉනේ බැඳ ගෙන හිටපු පිස්තෝලය සාක්ෂිකරු දුටුව බවටත් පවසා ඇත.

එපමණක් ද නොව, තමන් ළඟට හිටපු රාජ්‍ය ඇමතිවරයා පැමිණි අවස්ථාවේ දී අත් දෙක මුහුණට පහළින් මිටි කොට, එකට එක් කොට, පහර දීමට වගේ සිටිමින් සිංහලෙන් මොනවාද කිව්ව බවත්, එය සාක්ෂිකරුට නොතේරුන බවටත් පවසා ඇත. අනතුරුව, තමන්ට එහා සිටි

සුලක්ෂන් ළඟට ද ගොස් මොකක්ද කථා කර සූරියබාලන් හිටිය තැන අතින් පෙන්නුව බවටත්, එවිට සුලක්ෂන් ද ගොස් සූරියබාලන් අසළ දණ ගහ ගත් බවටත් පවසා ඇත. මෙම සාක්ෂිකරුට ද සිංහල නොතේරුන මුත්, සුලක්ෂන් තමන්ට දෙමළ භාෂාවෙන් තේරුම් කර දුන් බවට ද සඳහන් කර ඇත. (2021.09.30 වන දින සාක්ෂි - ප.ව.12.45 - 18 සහ 19 පිටු)

මේ හැරෙන්නට, පෝලිමේ අන්තිමට හිටපු අයත් සමගින් ද කථා කළ පසුව 'F' වාට්ටුව තුළට ගොස් විනාඩි 20කට පමණ පසුව හිටපු රාජ්‍ය අමාත්‍යවරයා එළියට පැමිණ, හිට ගෙන හිටපු අනිත් අට දෙනාට ද දණ ගහන ලෙසට කියූ බැවින් , තමන් ද අකමැත්තෙන් වුව ද හිටපු රාජ්‍ය ඇමතිවරයාට තිබුණු බයට දණ ගැසූ බවට ද, අනතුරුව ඇමතිවරයා සුලක්ෂන් සහ සූරියබාලන් ළඟට ගොස් යමක් පවසා ඉනේ තිබූ පිස්තෝලය එළියට ගත් අයුරු දුටුව බවටත් පවසා ඇත.කෙසේ වුවද, ඒ වස්ථාවේ දී හිටපු රාජ්‍ය අමාත්‍යවරයා වට කරගෙන සිටි පිරිස නිසා , සිදු වූ දෙය නිරීක්ෂණය කළ නොහැකි වු නමුත් , පිස්තෝලය ලෝඩ් කරන ශබ්දය ඇසුණු බවටත් පවසා ඇත.

අනතුරුව, ප්‍රධාන ජේලර් මහතා පැමිණ ඔවුනට වාට්ටුවලට යන ලෙසට දන්වා සිටි හෙයින්, ඔවුන් නැගිටලා ගිය බවට ද, 'සුලක්ෂන්' ද විනාඩි 5කින් පමණ ඔවුන් සිටි තැනට පැමිණි බවට ද, 'සූරියබාලන්' ඉන්චාර්ජ් ඔෆිස් එක තිබෙන දෙසට රැගෙන යනු දුටු බවට ද පවසා ඇත.

එසේම, සියළු දෙනා ම වාට්ටුව තුළට ගිය පසුව සහ සිර මැදිරි වසා විනාඩි 5කට පමණ පසුව, තම සිර මැදිරියට ඉදිරිපස පිහිටි සිර මැදිරියෙහි රදවා සිටින 'සූරියබාලන්' නොන්ඩි ගසමින් අඩ අඩා පැමිණෙනු දැක, සාක්ෂිකරු විසින් සූරියබාලන්ගෙන් ඊට හේතුව විමසුව විට දී "ඇමති තුමා වෙඩි තියන්න හැදුවා" යැයි පැවසුව බවටත්, සූරියබාලන්ගේ කකුලේ අමාරුවට අයිඩෙක්ස් පවා ඔහු දුන්න අවස්ථාවේ දී, සුදාකරන් එය ගානවා දුටුව බවටත් සාක්ෂියක් ලබා දී ඇත.

මේ හැරෙන්නට හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සාක්ෂිකරුත් සමග කථා කිරීමට පැමිණි අවස්ථාවේ දී අඩි 1 ½ක් වැනි කෙටි දුරකින් සිටි හෙයින් අරක්කු ගඳ දැනුනු බවට පමණක් නොව, කථා කරන විට දී ද වැනි වැනී කථා කළ බවටත්, ආපු වෙලේ සිට 'ඇත්ත කියන්න, ඇත්ත කියන්න' යැයි පවසමින් සිටි බවටත් සාක්ෂියක් ලබා දී ඇත. (2021.09.30 වන දින සාක්ෂි - ප.ව.12.45 - 19 සිට 22 දක්වා පිටු)

මේ හැරෙන්නට, අනුරාධපුර බන්ධනාගාරයෙහි 'F' වාට්ටුවේ 8 වෙනි සිර මැදියෙහි එල්.ටී.ටී.ඊ සංවිධානයට උදව් කිරීමේ වරදට සිර දඬුවමක් විඳින 'වේලු යෝගරාජා' නැමැත්තා ද ඉහත කී සිද්ධිය විස්තර කරමින් 2021.09.12 වන දින සවස 6.00ට පමණ රූපවාහිනිය නරඹමින් සිටිය දී එල්.ටී.ටී.ඊ නඩුවලට සිටින අයවලුන්ට එළියට එන ලෙසට කළ දැන්වීමට ඔවුන් දස දෙනා එළියට ගොස් සිට ගෙන සිටිය දී, ප්‍රධාන ජේලර් මහතා විසින්, සමාව දීම සඳහා හිටපු රාජ්‍ය ඇමති තුමා පැමිණ ඇති බවටත්, අහන දේට උත්තර දෙන ලෙසටත් දන්වා සිටි බවට පවසා ඇත.

අනතුරුව, පළවෙනියට සිටි සූරියබාලන් වෙත ගිය හිටපු රාජ්‍ය ඇමතිවරයාට, දෙමළෙන් කථා කළ විට දී 'සිංහලෙන් කියන්න' යැයි කියූ බවට ද, ඊට අල්ලපු එක්කෙනා "එයා සිංහල දන්නේ නැහැ" කියා කී විට, "මූ ඇත්ත කියන්නේ නැහැ" යැයි පවසා සූරියබාලන්ව දණ ගැස්සුව බවට ද සාක්ෂියක් ලබා දී ඇත. පසුව ඊළඟට සිටිය 'සිදූර්සන්' ළඟට ද ගොස් 'කී දෙනෙක් මරා ඇද්දැයි' විමසා, ඊට යාබදව සිටි 'කාර්තික්' නැමැති අය වෙත ද ගොස් ප්‍රශ්න කලා යැයිද පවසා ඇත.

පසුව, සාක්ෂිකරු ළඟට ද පැමිණ, 'කී දෙනෙක් මරා ඇතිදැයි' විමසා, සාක්ෂිකරුට විරුද්ධව පැවති නඩු 6 ටම වරද පිළි ගෙන හිරේ ඉන්න බවට දැන් වූ විට දී , හිටපු රාජ්‍ය ඇමතිවරයා විසින් "මූ ඇත්ත කියනවා, සමාව දෙන්න පුළුවන්" යැයි කියා ජේලර් මහතාට තම නොම්මරය ලියා ගන්න ලෙසට දැන් වූ බවට ද පවසා ඇත. තව ද, තමන් ළඟට හිටපු රාජ්‍ය

ඇමතිවරයා පැමිණ කථා කළ විට දී හිටපු රාජ්‍ය ඇමතිවරයාගේ ඉණේ තිබූ කළු පාට පටියක රඳවා තිබූ පිස්තෝලයක් දුටුව බවට ද සාක්ෂියක් ලබා දී ඇත.

එසේ ම, අන්තිම කොනේ සිටි 'සුලක්ෂන්' ගෙන් ද ඇත්ත කියන්න ඕන, මොකටද ඉන්නේ යැයි විමසා සුලක්ෂන්ට ද "මූ බොරු කියනවා" යැයි පවසා සූරියබාලන් සිටින තැන අත දික් කර පෙන්වමින් දණ ගසන ලෙසට දැන් වූ බවටත්, සුලක්ෂන් ඒ අනුව දණ ගසා ගත් බවටත් සාක්ෂියක් ලබා දී ඇත. (2021.09.30 වන දින සාක්ෂි - පෙ.ව.9.00 - 3 සිට 6 දක්වා පිටු)

එපමණක් ද නොව, හිටපු රාජ්‍ය ඇමතිවරයා ඉන් අනතුරුව, 'තිල්ලෙයි' ගාවට ද ගොස් ප්‍රශ්න කර, 'F' වාට්ටුව තුළට ගොස් එහි ද විනාඩි 10-15ක් පමණ ගත කර එළියට ඇවිත් මිදුලේ සිටි ඉතිරි රැඳවියන් සියළු දෙනාට ම දණ ගසන්න යැයි පවසා දණ ගැස්සුව බවට ද, එම ස්ථානය වැලි බොරළු පසක් නිසා, ගල්වල දණ හිස් ඇනී රිදුන බවට ද, පසුව සුලක්ෂන් සහ සූරියබාලන් ළඟට ගොස් කථා කරනු දුටුව ද, සාක්ෂිකරු අඩි 15ක් පමණ දුරින් සිටිය නිසා කථා කරන දෙය නොඇසුණ බවට මෙන් ම ඇමතිවරයාගේ වටේට කට්ටිය සිටි නිසාත්, සාක්ෂිකරු දණ ගසා සිටි නිසාත් සිදු වූ දේ කිසිවක් නුදුටු බවට ද, එනමුත් ප්‍රධාන ජේලර් මහතා පැමිණ වාට්ටුවට යන ලෙසට දැන් වූ බවට ද, එම අවස්ථාවේ දී අමාත්‍යවරයා සූරියබාලන් ළඟට යනවා දුටුව බවට ද සාක්ෂියක් ලබා දී ඇත.

කෙසේ වුව ද, විනාඩියක්, 2ක් වැනි කාලයක් තුළ ඇතුළට පැමිණි 'සුලක්ෂන්' විසින් හිටපු රාජ්‍ය ඇමතිවරයා 'තුවක්කුව ලෝඩ් කර, තුවක්කු බැරල් එක ඔළුව ළඟට ආවා' යැයි ශබ්ද නගා කියනු ඇසුනා යැයි ද,පවසමින් සූරියබාලන් සිර මැදිරියට ආවේ සිර මැදිරි වැසුව පසුව යැයි ද සාක්ෂියක් ලබා දී ඇත. (2021.09.30 වන දින සාක්ෂි - පෙ.ව.9.00 - 7 සිට 8 දක්වා පිටු)

මේ හැරෙන්නට, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා 'ඇත්ත කියන්න, ඇත්ත කියන්න' යැයි පවසමින් එකම දේ නැවත අසමින් කථා කළ ශෛලියෙන් බීමත්ව සිටි බවට සාක්ෂිකරුට හිතුන බවට ද පවසා ඇත.

එමෙන්ම, රහසේ යමක් මෙම කමිටුවට කීමට අවශ්‍ය යැයි ද සඳහන් කර, මෙම සිද්ධිය සිදු වී දින 2-3කට පසුව ප්‍රධාන ජේලර් පැමිණ, පිස්තෝලේ ගැන නොකියන ලෙසට ඉල්ලා සිටි හෙයින්, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සන්තකයෙහි පිස්තෝලයක් තිබූ බවට සහ/හෝ දණ ගසා සිටි බවට මෙම කමිටුව ඉදිරියෙහි සාක්ෂි ලබා දීමට පෙර කට උත්තර ලබා දුන් අවස්ථාවේ දීත්, මානව හිමිකම් කොමිසමටත් නොපැවසූ බවටත්, එසේ සිදු කළේ හිටපු රාජ්‍ය ඇමතිතුමාටත්, බන්ධනාගාර නිලධාරීන්ටත් විරුද්ධව යමක් පැවසුවොත්, 2025 නිදහස් වීමට සිටින ඔහුට, ජනාධිපති සමාව ලැබෙන්නේ නැතැයි සිතූන නිසා යැයි ද පවසා ඇත.

තවද, මෙම කමිටුව ඉදිරියෙහි සාක්ෂි දෙනු ලබන්නේ කිසිදු බලපෑමක් හෝ තර්ජනයක් හේතුවෙන් නොවන බවටත්, තනි කැමැත්තෙන් බවටත්, හිටපු රාජ්‍ය ඇමතිවරයා ඉදිරියේ දණ ගැසුවේ තිබූ බයට සහ ඔහුගේ අත්සනින් නිවසට යාමට හැකියාව ඇතැයි සිතුව නිසා වන බවටත් යැයි ද සාක්ෂියක් ලබා දී ඇත. (2021.09.30 වන දින සාක්ෂි - පෙ.ව.9.00 - 10 පිටුව)

මේ අනුව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාව මුණ ගැසීම සඳහා 'F' වාට්ටුවේ සිට එළියට රැගෙන ආ රැඳවියන් අතරින් සාක්ෂි ලබා ගැනීම සඳහා කැඳවා තිබූ සාක්ෂිකරුවන් පස් දෙනා ලබා දුන් සාක්ෂි විශ්ලේෂණය කළ විට,

හිටපු රාජ්‍ය අමාත්‍යවරයා රැඳවියන්ට පෙනෙන අන්දමට පිස්තෝලයක් තම සන්තකයේ තබා ගෙන,

i. මරණ දඬුවම නියම කල හැකි වරදක් වන මිනීමැරීමේ වරද ත්‍රස්තවාදීන් ලෙසට සිදුකලාදැයි අනාවරණය කරන ලෙසට රැඳවියන්ට වෙන් වෙන්ව බලකරමින්

ii. එසේ කිසිදු ත්‍රස්තවාදී ක්‍රියාවක් නොකළ බවට රැඳවියන් පැවසූ විට දී, ඒවා පිළි නොගෙන ඔවුන් කියන්නේ 'බොරු බවටත්, ඇත්ත කියන ලෙසටත්' දන්වමින්,

iii. එළියට රැගෙන ආ රැඳවියන්ව භීතියට පත් කරමින්,

iv. සුලක්ෂන්' සහ 'සූරියබාලන්' නැමැති රැඳවියන් දෙදෙනාට, ශාරීරික සහ මානසික පීඩා ගෙනෙන අන්දමට මිදුලේ රළු පොළවක් මත දණ ගස්වා තිබූ බවට පමණක් නොව,

v. 'සුලක්ෂන්' සහ 'සූරියබාලන්' යන දෙදෙනා ආසන්නයටම ගොස්, එතෙක් ඉණේ රදවාගෙන තිබූ පිස්තෝලය අතට ගෙන, එය ලෝඩ් කර, එක් ඇඟිල්ලක් පිස්තෝලයේ කොකාට තබා ගෙන, එම ඇඟිල්ලෙන් කොකා තද වූවා නම්, අනිවාර්යෙන්ම 'සුලක්ෂන්'සහ/හෝ 'සූරියබාලන්'ට වෙඩි වැදී මරණය ගෙන දෙන ආකාරයට 'සුලක්ෂන්' සහ 'සූරියබාලන්' ගේ හිස දෙසට එල්ල කොට තබා ගෙන මිනිමැරීමට තැත් කර තිබූ බවත්, එම ක්‍රියාව නතර කොට තිබුනේ අනුරාධපුර බන්ධනාගාර සහකාර අධිකාරිවරයා විසින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ අත අල්ලා ගැනීම නිසා බවටත්, තොරතුරු අනාවරණය වෙයි. එසේම, එකී සාක්ෂි 'ඒකාකාරීභාවයෙහි පරීක්ෂණයෙන්' ද සමත් වෙයි.

මේ හැරෙන්නට, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට එරෙහිව සහ/හෝ වෙනත් යම් කටයුත්තක් සඳහා කුමන්ත්‍රණයක් දියත් කරමින්, රාජ්‍ය අමාත්‍යවරයාට විරුද්ධව අසත්‍යයක් පැතිරවීමට රැඳවියන් ක්‍රියා කර තිබුනේදැයි විමසා බැලීමට අනුරාධපුර බන්ධනාගාරයෙහි එදින රාජකාරියෙහි යෙදී සිටි බන්ධනාගාර නිලධාරීන් 10 දෙදෙනෙකුගේ සාක්ෂි ලබා ගන්නා ලදී.

එහිදී, 'F' වාට්ටුවේ සිට එළියට ගොස් ආපසු 'F' වාට්ටුවට පැමිණි අවස්ථාවේදි මෙකී රැඳවියන්ට තිබූ පසු හැසිරීම විමසා බැලීමට '2021.09.12 වන දින F' වාට්ටුව භාරව සිටිමින්, සවස 5.15 සිට රාත්‍රී පළමු

සේවා මුරයෙහි රාජකාරියට වාර්තා කර තිබූ සහ ස්වාධීන සාක්ෂිකරුවෙකු ලෙසට සැළකිය හැකි, 'හේමපාලගේ ප්‍රියන්ත කුමාර දිසානායක' නැමැති බන්ධනාගාර නියාමකවරයාගේ සාක්ෂි ලබාගන්නා ලදි.

ඔහුගෙන් එළියට ගිය රැඳවියන් ආපසු 'F' වාට්ටුවට පැමිණි අවස්ථාවේ දී, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ යම් කිසි ක්‍රියා කළාපයක් ගැන නොසන්සුන් භාවයක් ඔබ නිරීක්ෂණය කළාද? යනුවෙන් විමසීමක් කරන ලදි. ඊට සාක්ෂිකරු විසින් 'නොසන්සුන්තාවයක් නිරීක්ෂණය කළා' යනුවෙන් පමණක් නොව, රැඳවියන් සෙල් ඇතුළට ගියේ හිටපු රාජ්‍ය ඇමතිවරයා විසින් පිස්තෝලයක් එල්ල කර, තර්ජනය කළා' කියලා කියමින් යැයි ද, සාමාන්‍යයෙන් රැඳවියන්ව සෙල්වලට දාන්නේ අතපය සෝදා ගත්තාට පසුව වුව ද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ඒමට පෙර සෙල්වලට දා තිබූ රැඳවියන්, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාව මුණ ගැසීමට එළියට ගොස් ආපසු සෙල්වලට යෑම සඳහා පැමිණි අවස්ථාවේ දී, සෙල්වලට නැවත ගියේ නැවත වරක් අතපය පවා සෝදා ගෙන යැයි ද පැහැදිලි සාක්ෂියක් ලබා දී ඇත. (2021.10.25 වන දින සාක්ෂි - පෙ.ව.1.30 - 2 සිට 3 දක්වා පිටු)

එපමණක් ද නොව, මෙකී සාක්ෂිකරුගෙන්, 2021.09.12 වන දින 'F' වාට්ටුව භාර නිලධාරියා වශයෙන්, එළියට ගිය රැඳවියන් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට එරෙහිව සහ/හෝ වෙනත් යම් කටයුත්තක් සඳහා හෝ රාජ්‍ය අමාත්‍යවරයාට විරුද්ධව අසත්‍යයක් පැතිරවීමට සහ/හෝ කුමන්ත්‍රණයක් දියත් කිරීමට රැඳවියන් ක්‍රියා කළා යැයි හිතුනාද? යනුවෙන් විමසූ විට දී ද, 'එහෙම දෙයක් තේරුනේ නැහැ, ඒ අය එළියේ ඉඳලා ආව ගමන් මේ කථාව කිව්වේ' යනුවෙන් (2021.10.25 වන දින සාක්ෂි - ප.ව.1.30 - 5 පිටුව) වැඩිදුරටත් පවසා ඇත.

මෙම සාක්ෂිය සලකා බැලීමේ දී, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා මුණ ගැසීමට එළියට ගිය රැඳවියන්ව වැලි, ගල් මිශ්‍රිත පොළවේ බිම දණ ගසා ගෙන සිටිය බවට මෙන්ම හිටපු රාජ්‍ය ඇමතිවරයා විසින් ඔවුනට

පිස්තෝලයක් එල්ල කර, තර්ජනය කළ බවට ලබා දී ඇති සාක්ෂි, 'අප්‍රමාදී භාවයෙහි පරීක්ෂණයෙන්' සමත් වන හෙයින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට එරෙහිව සහ/හෝ වෙනත් යම් කටයුත්තක් සඳහා හෝ රාජ්‍ය අමාත්‍යවරයාට විරුද්ධව අසත්‍යයක් පැතිරවීමට සහ/හෝ කුමන්ත්‍රණයක් දියත් කිරීමට රැඳවියන් විසින් ගොතන ලද අසත්‍ය කථාවක් ලෙසට සලකා බැලිය නොහැක.

එපමණක් ද නොව, තවත් ස්වාධීන සාක්ෂියක් ලෙසට සැලකිය හැකි , අනුරාධපුර බන්ධනාගාර රෝහලේ වෛද්‍යවරිය වූ සුමුදු ශ්‍රීමාල් බෝගහවත්ත යන නිලධාරිනියව සාක්ෂියට කැඳවූ අවස්ථාවේ දී, දණහිස් අමාරුවක් පවතින බවට පවසමින් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා 'පූබාලසිංහම්' නැමැති රැඳවියා , 'සුදාකරන්' නැමැති රැඳවියාත් සමගින් 2021.09.13 වන දින උදෑසන පැමිණි බවටත්, සුදාකරන් විසින් පූබාලසිංහම් දෙමළෙන් කී දේ පරිවර්තනය කළ බවටත් සාක්ෂියක් ලබා දී, ඔහුට ප්‍රතිකාර වශයෙන් 'පැරසිටමෝල්' ලබා දුන් බවට ද පවසමින්, ඊට අදාළව නිකුත් කළ ඕ.පී.ඩී. තුන්ඩුවේ සත්‍ය පිටපතක් ඉදිරිපත් කර ඇත. එය "M1" වශයෙන් සළකුණු කර ඇත. එසේ ම මොහුගේ සිර අංකය ද මෙම තුන්ඩුවේහි ලියා ඇති බවට ද පවසා ඇත. මෙම ඕ.පී.ඩී.තුණ්ඩුවේ දිනය ලෙසට 2021.09.13 ද, සිර අංකය සහ නම වශයෙන් 363, සූරියබාලන් යන්න ද යොදා ඇත.

කෙසේ වුව ද, මොහුට සිංහල කථා කිරීමට නොහැකි නිසා, ප්‍රශ්න ටිකක් පමණක් ඇසූ බවටත්, බන්ධනාගාරයෙහි කොවිඩ් රෝගය තිබෙන නිසා මීටර් 1, ½ක දුරස්ථභාවයක් තබා ගෙන පරීක්ෂා කළ බවටත්, දණ හිස් පරීක්ෂා නොකළ බවටත් මෙම වෛද්‍යවරිය පවසා ඇත. (2021.09.30 වන දින සාක්ෂි - පෙ.ව.11.45 - 2 සහ 3 පිටු) මෙම සාක්ෂිය සලකා බැලීමේ දී, 'පූබාලසිංහම්'නැමැත්තා රළු පොලවේ අකමැත්තෙන් බිම දණ ගසා ගෙන සිටීම නිසා ඇතිවූ වේදනාවට,

කකුල නොන්ඩි ගසමින් යැමට සිදුවූ බවට ලබා දුන් සාක්ෂිය 'විය හැකිභාවයෙහි පරීක්ෂණයෙන්' ද සමත් වෙයි.

මේ හැරෙන්නට, 'F' වාට්ටුවෙහි 5 වන සිර මැදිරියේ සිර දඬුවමක් විඳිනු ලබන, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා පැමිණි අවස්ථාවේ දී එළියට නොගොස් ඇතුළේ ම රැඳී සිටි Y 68 දරන සිර අංකය හිමි 'පාලන්තැන්නගේ රසික නුවන් සංජීව' විසින් ද, එළියට ගිය රැඳවියන් ආපසු සිර මැදිරිවලට පැමිණි අවස්ථාවේ දී, තම සිර මැදිරියට ඉදිරිපස අඩි 5ක් පමණ දුරින් පිහිටි සිර මැදිරියෙහි රැඳී සිටින සුලක්ෂන්ගෙන් සහ ඊට යාබද පිහිටි කාමරයෙහි සිටින 'කන්නන්' ගෙන් 'ඔයාලට නිදහස දෙනවාද, ඉක්මනට යන්න කියලා කිව්වා ද' කියා විමසද්දී 'මොන නිදහස ද, තව පොඩ්ඩෙන් මරනවා, ඉස්සරලා ම දෙන්නෙක් දණ ගැස්සුවා, මහත්තයා අපිව බලලා ආයිත් එළියට ගිහිල්ලා අනෙක් හැමෝම/ඔක්කොම දණ ගහපියව් කියලා ඔක්කොම දණ ගැස්සුවා, ඒ ඇරෙන්න අතින් තුවක්කුවක් ලෝඩ් කරන හැටි පෙන්නලා, මහත්තයා සුලක්ෂන්ටයි, සූරියබාලන්ටයි තුවක්කුවක් එල්ල කළා' කිව්වා යනුවෙන් ද පවසමින් සාක්ෂිකරු විසින් තුවක්කුව ලෝඩ් කළ අන්දම ඔහුට පෙන්වා සිටි අයුරුද මෙම කමිටුව වෙත නිරූපනය කර පෙන්වා දී ඇත.

මේ හැරෙන්නට, සහකාර බන්ධනාගාර අධිකාරිවරයා අමාත්‍යවරයාගේ අතින් ඇල්ලූ බවට ද, බීලා සිටිය බවට ද, ඇත්ත කියන්න යැයි පවසමින්, 'ඇත්ත කිව්වේ නැත්නම් යන්න වෙන්නේ නැහැ' කියා බය කළ බවට ද, සුදාකරන් කළ දේවල් අසා 'උඹ ඇත්ත කිව්වා' කියා ඔහුව පැත්තකට කළ බවට ද පවසා සිටිය බවටත් පැවසූවා යැයිද, සාක්ෂියක් ලබා දෙමින්, මෙම කරුණු අනාවරණය කළේ රැඳවියන් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා වෙත ගොස් ආපසු පැමිණ, පැය ½ක්, විනාඩි 45කින් පමණ වූ කාලයකින් හෙයින් ද, ඔවුන් පැමිණ සුළු වේලාවකින්

සිර මැදිරිවල දැමූ හෙයින් ද, මෙම රැඳවියන් පැමිණි පසුව ඇතැමෙකු දණ හිස්වල ගල් වැලි තිබෙනවා කියා සෝදා ගැනීමට ගිය හෙයින් ද, සියළු දෙනා ම කියා සිටියේ එකම කථාවක් වූ හෙයින්ද , ඔවුන් බොරුවක් ගොතා කියූ බවක් පෙනී නොගිය බවට ද මෙම සාක්ෂිකරු විසින් වැඩිදුරටත් පවසා ඇත. (2021.10.06 වන දින සාක්ෂි - 3 සහ 4 පිටු)

තවද, 'F' වාට්ටුවේ 10 වන කාමරයේ හිටපු රාජ්‍ය අමාත්‍යවරයා 'පංජලිංගම් කෝකිලන්' නැමැති සිරකරු ද, ඉහත කී රසික නුවන් සංජීවගේ සාක්ෂිය තවදුරටත් තහවුරු කරමින්, ඔහුත් සූරියබාලන් යන අයත් එකම කාමරයක සිටින බවත්, සූරියබාලන් එළියේ සිට නැවත කාමරයට අඬා ගෙන පැමිණි, මිදුලේ දණ ගසා සිටිය බවට ද, ඇමතිතුමා පිස්තෝලේ ඔළුවට තබා ඇත්ත කියන්න කියා පවසා තිබූ බවට ද, සූරියබාලන්ගේ කකුල් දෙකේ ම දණ හිස් ගල් පාරවල් ඇනී හම යටට ගොස් තිබෙනු දුටු බවට ද, ඉස්සරහ කාමරයේ සිටි 'තිරුවරුල්' යන අයගෙන් අයිඩෙක්ස් ලබාගෙන, 'සුදාකරන්' විසින් 'සූරියබාලන්ගේ' දණ හිස්වල ගා, පසුවදා උදේ බෙහෙත් ගන්නත් ගිය බවට ද, පවසා ඇත. (2021.10.06 වන දින සාක්ෂි - ප.ව.2.00 - 2 පිටුව)

එපමණක් ද නොව, 'F' වාට්ටුවේ 5 වන සිර මැදිරියෙහි රඳවා සිටින තවත් සිරකරුවෙකු වූ 'දිසානායක මුදියන්සේලාගේ ගයිත ශ්‍රී සමාධි' යන සිරකරු ද සාක්ෂි දෙමින් කියා සිටියේ හිටපු රාජ්‍ය අමාත්‍යවරයා පැමිණි පසු ඔහු සිටින සිර මැදිරියට ඉදිරියෙහි පිහිටි සිර මැදිරියෙහි රඳවා සිටින 'සුලක්ෂන්' සිර මැදිරියට පැමිණි පසුව, ඔහුටත්, 'රසික නුවන්' ටත්, රාජ්‍ය අමාත්‍යවරයා කට්ටිය ම දණ ගැස්සුව බවටත්, තුවක්කුවක් ඔළුවට තිබ්බ බවටත්, සූරියබාලන් හැඬූ බවට ත්'සුලක්ෂන්' පැවසූ බවයි. එසේ ම, මෙම කථාව එළියට ගිහින් ආපු

ගමන් ම කියනවා ඇසුණු හෙයින්, යමෙකුට කථාවක් හදන්න තරම් වෙලාවක් නොතිබූ බවට ද සාක්ෂියක් ලබා දී ඇත. මේ හැරෙන්නට හිටපු රාජ්‍ය අමාත්‍යවරයා තම කාමරයට පැමිණ කථා කළ අවස්ථාවේ දී බීපු පුද්ගලයෙකු මෙන් වැනී වැනී සිටිනු දුටු බවත්, සිර මැදිරිවල සිටින අය ඒ සම්බන්ධව කථා වෙනු ඇසුණු බවටත් පවසා ඇත. (2021.10.07 වන දින සාක්ෂි - 3 පිටුව)

තවද, 'F' වාට්ටුවේ සිට එළියට ගොස් තිබූ රැඳවියන් සමගින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සිදු කළ කථා බහ නිරීක්ෂණය කිරීමට හැකියාව තිබුනා යැයි සළකා බැලිය හැකි , අනුරාධපුර බන්ධනාගාරයෙහි ප්‍රධානියා වූ සහකාර බන්ධනාගාර අධිකාරි 'මද්දුම හෙට්ටිගේ රොහාන් අජිත්' මහතා විසින් මීට අදාළව සාක්ෂි දෙමින්, ප්‍රථමයෙන්, එළියේ සිටි රැඳවියන් සමගින් විනාඩි 15ක්, 20ක් පමණ හිටපු රාජ්‍ය අමාත්‍යවරයා කථා කොට , 'F' වාට්ටුවේ ඇතුළතට ගොස් එහි ද සුළු වෙලාවක් ගත කර, ආපසු එළියට පැමිණි පසුව, තවත් විනාඩි 5ක්, 10ක් පමණ එළියේ සිටි රැඳවියන් සමග සිටිය බවට පවසා ඇත. කෙසේ වුවද, මෙම අවස්ථාවේ දී ලයිට් කණුව අසළ සාක්ෂිකරු සිටි බැවින් ද, අමාත්‍යවරයා වට කර ගෙන පිරිස ගොඩක් සිටි බැවින්, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා කිසිවෙකුට පිස්තෝලයක් එල්ල කළ බවට නිරීක්ෂණය නොවුනු බවට ද සාක්ෂියක් ලබා දී ඇත.

කෙසේ වුවද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ සන්තකයෙහි ගිනි අවියක් නොතිබූ බව සහකාර බන්ධනාගාර අධිකාරිවරයා නොපවසන අතර, විවිධ හේතූන් දක්වමින් එබන්දක් නිරීක්ෂණය කළ නොහැකි වූවා යැයි පවසා සිටින බවට පැහැදිලි වෙයි. එසේම, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට තිබූ ගෞරවය මත හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සන්තකයේ පිස්තෝලයක් තිබුණා ද? යන්න පරීක්ෂා නොකළ බවට ද පැහැදිලිව ම පවසා ඇත. (2021.10.24 වන දින සාක්ෂි - පෙ.ව.11.00 - 4 පිටුව)

කෙසේ නමුත්, සාක්ෂිකරුවන් කිහිප දෙනෙකු විසින්ම මෙම කමිටුව ඉදිරියෙහි සාක්ෂි දෙමින් 'සුලක්ෂන්' සහ 'සූරියබාලන්' වෙත හිටපු රාජ්‍ය අමාත්‍යවරයා පිස්තෝලය එල්ල කළ අවස්ථාවේ දී හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ අත සහකාර බන්ධනාගාර අධිකාරී විසින් ඇල්ලීම සම්බන්ධව පවතින සාක්ෂිය අනුව, කිසියම් හෝ වෙලාවක හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ අත ඇල්ලීමක් සිදු කළේ දැයි යන්න මෙම සාක්ෂිකරුන්ගෙන් විමසන ලදී. එහි දී හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ අත ඇල්ලූ බව ප්‍රතික්ෂේප කර නැති නමුත්, ඊට හේතුව ලෙසට කොවිඩ් රෝග වසංගතය බන්ධනාගාරය තුළ තිබෙන නිසා හිටපු රාජ්‍ය අමාත්‍යවරයා රැඳවියෙක් ළඟට යන්න හදන විට එය වැළැක්වීම සඳහා හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ අත ඇල්ලීම සිදු කල බවට පවසා ඇත. (2021.10.24 වන දින සාක්ෂි - පෙ.ව.11.00 - 8 පිටුව)

එනමුදු, බන්ධනාගාර වෛද්‍යවරියගෙන් බන්ධනාගාරයෙහි සිටින කොවිඩ් රෝගීන් සම්බන්ධව විමසූ විටදී , 2021.09.12 වන දින කාල වකවානුව තුළ 'F' වාට්ටුවේ පමණක් නොව, එම ගොඩනැගිල්ලේ ද, ඊට ඉහළ මාළයෙහි පිහිටි "G" වාට්ටුවෙහි ද කොවිඩ් වැළඳුනු රෝගීන් සිටි බවට වාර්තා වී නොතිබූ බවට පැහැදිලි සාක්ෂියක් ලබා දී ඇත. (2021.09.30 වන දින සාක්ෂි - පෙ.ව.11.45 - 15 පිටුව)

එපමණක් ද නොව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා'F' වාට්ටුව ඇතුළත වූ සිර මැදිරිවල පවා සිටින රැඳවියන් සමග කථා කිරීමට 'F' වාට්ටුව තුළට ගොස් විනාඩි 10ක් පමණ එහි රැඳී සිටි බවට ද, සහකාර බන්ධනාගාර අධිකාරී පිළි ගෙන තිබුණි. (2021.10.24 වන දින සාක්ෂි - පෙ.ව.11.00 - 7 පිටුව)

එසේම, 'F' වාට්ටුවේ 5 වන සිර මැදිරියේ රඳවා සිටි පී.රසික නුවන් සංජීවගේ සාක්ෂි වලට අනුව ඔහු සිටි සිර මැදිරිය විවෘත කළ පසුව, ඒ ඇතුළට පැමිණි හිටපු රාජ්‍ය අමාත්‍යවරයා, ඔහුට අඩි 3ක්, 3,1/2ක්, 4ක්

පමණ දුරින් සිට ගනිමින්, ඔහුත් සමග වැඩි වේලාවක් කථා බහ කරමින් කාලය ගත කර ඇත. එහි දී හෝ කිසිදු බන්ධනාගාර නිලධාරියෙකු එය වළක්වා තිබූ බවට හෙළිදරවු වී නැති අතර, (2021.10.06 වන දින සාක්ෂි - ප.ව.12.00 - 2 පිටුව) හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ද 'F' වාට්ටුවේ සිටි රැඳවියන් කිහිප දෙනෙක් සමග කථා කරමින් එහි විනාඩි 10ක පමණ කාලයක් ගත කළ බවට ද පිළි ගෙන ඇත. (2021.10.18 වන දින සාක්ෂි - 12 පිටුව)

ඉහත කී සාක්ෂි සළකා බැලීමේ දී 'F' වාට්ටුව තුළ සිටින රැඳවියන්ගෙන් කිසිවෙකුට කොවිඩ් රෝගය වැළඳී තිබුනු බවට සහ/හෝ කොවිඩ් රෝගය හේතුවෙන් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා රැඳවියන් සමගින් කථා කිරීමට අදාළව බන්ධනාගාර නිලධාරීන්ගේ අකැමැත්තක් හෝ බාධා කිරීමක් සිදුවී තිබූ බවට අනාවරණය නොවෙයි. මේ අනුව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ අතින් සහකාර බන්ධනාගාර අධිකාරිවරයා ඇල්ලුවේ කොවිඩ් රෝගය බන්ධනාගාරය තුළ තිබීමේ හේතුවෙන් යැයි ලබා දුන් සාක්ෂිය 'වියහැකි භාවයෙහි පරීක්ෂණයෙන්' අසමත් බවයි. එහෙයින් එම සාක්ෂිය සත්‍යයක් ලෙසට පිළි ගැනීමට අපොහොසත් ය.

මෙම කරුණු අනුව, ඉහත කී රැඳවියන් පවසන පරිදි හිටපු රාජ්‍ය අමාත්‍යවරයා, ඉණේ ගිනි අවියක් රදවා ගෙන පැමිණි බවට වන සාක්ෂියත්, එම ගිනි අවිය අතින් ලෝඩ් කර, බිම දණ ගසා සිටි සුලක්ෂන් සහ සූරියබාලන්ට එල්ල කළ බවට වන සාක්ෂියත් බිඳ වැටීමක් සිදු වී නැත. එසේම, 'වියහැකි භාවයෙහි' සහ 'ඒකාකාරී භාවයෙහි' පරීක්ෂණයෙන්' ද සමත් වෙයි. එහෙයින් එම සාක්ෂිවල විශ්වසනීයත්වය වැඩිය.

මේ හැරෙන්නට , බන්ධනාගාරයෙහි දෙවන ප්‍රධානියා වූ ප්‍රධාන ජේලර් 'සමන්ත ලියනගේ' යන අය ද පවසා සිටියේ , රැඳවියන්

තිදෙනෙකුගෙන් ඔවුන්ට තිබෙන නඩුවල විස්තර අසනවා මෙන් ම රැඳවියන්ට ඇත්තම කියන්න කියා කියනු ඇසුණු බවත්, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ඉදිරියෙහි දෙදෙනෙකු බිමට පහත් වී සිටිනු නිරීක්ෂණය කළ ද, ඔවුන් බිම දණ ගසා ගෙන සිටියා ද, එසේත් නැතහොත් බිම වාඩි වෙලා සිටියා ද කියා අවධානය යොමු කරන්න අවස්ථාවක් නොතිබූ බවටත්, ඊට හේතුව වූයේ ලයිට් කණුව ළඟ සිටි සහකාර බන්ධනාගාර අධිකාරි සමගින් එක්ව වරින් වර ආරක්ෂක කටයුතු ගැන සොයා බැලීමත්, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා අනෙකුත් තැන් බලන්න යාවී යැයි කියා සිතූ හෙයින්, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා අවට සිටි බන්ධනාගාර ජේලර්වරුන් තිදෙනාට සහ නියාමකවරුන් තිදෙනාට අවශ්‍ය උපදෙස් ලබා දීමට සිදු වූ නිසාත් යැයි සාක්ෂියක් ලබා දී ඇත. (2021.10.25 වන දින සාක්ෂි - පෙ.ව.9.30 – 8 සහ 9 පිටු)

එපමණක් ද නොව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා 'F' වාට්ටුව ඇතුළට ගිය අවස්ථාවේ දී සාක්ෂිකරු ද 'F' වාට්ටුවට ගිය මුත්, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා 'F' වාට්ටුවෙන් පිටතට පැමිණි අවස්ථාවේ දී සාක්ෂිකරු 'F' වාට්ටුව තුළ ම රැඳී සිටිමින්, විවෘත කළ සිර මැදිරි වහමින් විනාඩි 10ක් පමණ 'F' වාට්ටුව තුළ තවදුරටත් රැඳී සිටි හෙයින්, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා එළියට පැමිණි පසුව කළ කී දේ නිරීක්ෂණය කිරීමට නොහැකි වූ බවටත් පවසා ඇත. කෙසේ වුවද , සාක්ෂිකරු එළියට පැමිණි අවස්ථාවේ දී හිටපු රාජ්‍ය අමාත්‍යවරයා කාර්යාලය පැත්තට යනවා දුටුව බවට ද, එම අවස්ථාවේ දී මිදුලේ රැඳී සිටි රැඳවියන්ට සාක්ෂිකරු විසින් සිර මැදිරිවලට යන ලෙසට දැනුම් දුන් බවටද වැඩිදුරටත් සාක්ෂියක් ලබා දී ඇත. (2021.10.25 වන දින සාක්ෂි - පෙ.ව.9.30 - 10 පිටුව)

මෙ අනුවද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා 'F' වාට්ටුවේ ඇතුළතට ගොස් ආපසු එළියට පැමිණ තවත් විනාඩි 5ක්, 10ක් පමණ කාලයක් එළියේ

සිටි රැඳවියන් සමග තවදුරටත් කාලය ගත කර තිබූ බවට වන සාක්ෂිය එකිනෙකට තහවුරු වෙයි.

තවද, රැඳවියන් විසින් ලබා දුන් ඉහත කී සාක්ෂිවලට අනුව හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සන්තකයෙහි තිබූ ගිනි අවිය 'සුලක්ෂන්ට' සහ 'සූරියබාලන්ට' එල්ල කර ඇත්තේ හිටපු රාජ්‍ය අමාත්‍යවරයා 'F' වාට්ටුව තුළට ගොස් ආපසු මිදුලට පැමිණි අවස්ථාවේ දී වූ හෙයින් සහ ප්‍රධාන ජේලර්වරයා එම අවස්ථාවේ දී සිට ඇත්තේ 'F' වාට්ටුව තුළ බැවින්, එම අවස්ථාව නිරීක්ෂණය කිරීමට ප්‍රධාන ජේලර්වරයාට අවස්ථාවක් තිබී නොමැති බවටද අනාවරණය වෙයි. එසේම, ප්‍රධාන ජේලර්වරයාගේ ද සාක්ෂි විශ්ලේෂණය කිරීමේ දී ද ,එළියට කැඳ වූ රැඳවියන් දෙදෙනෙකු බිමට පහත් වී සිටි බවටද අනාවරණය වෙයි. එසේ ම මෙකී ප්‍රධාන ජේලර්වරයා විසින් ද හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට තිබූ ගෞරවය මත හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සතුව ගිනි අවියක් තිබේ දැයි පරීක්ෂා කර නැත. (2021.10.25 වන දින සාක්ෂි - පෙ.ව.9.30 - 3 පිටුව) එමෙන්ම, ප්‍රධාන ජේලර් ලබා දුන් සාක්ෂි වලට අනුව හිටපු රාජ්‍ය අමාත්‍යවරයා රැඳවියන් සමග කථා කරද්දී ඔහුගේ අවධානය වෙනත් අතක ද තිබී ඇත.

මෙම සියළු කරුණු සළකා බැලීමේ දී , එළියට රැගෙන තිබූ රැඳවියන් සාක්ෂි ලබා දී ඇති අයුරින්ම, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් රැඳවියන් දෙදෙනෙකුව දණ ගස්වා අනතුරුව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සන්තකයෙහි තිබූ පිස්තෝලය රැගෙන දණ ගස්වා තිබූ රැඳවියන් දෙදෙනා වෙත එල්ල කළ බවට වූ සාක්ෂිය 'විය හැකි භාවයෙහි' පරීක්ෂණයෙන් සමත් වෙයි. එසේ ම 'ඒකාකාරී භාවයෙහි පරීක්ෂණය'ද පළුදු වී නැත. ඒ අනුව ද රැඳවියන් විසින් ඉහතින් ලබා දුන් සාක්ෂිවල විශ්වසනීයත්වය හීන වීමක් සිදු වී නැත.

මේ හැරෙන්නට, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා රැඳවියන් සමග මිදුලේ කතා කරද්දී ඒ අවට සිටියා යැයි පැවසූ ජේලර්වරුන් තිදෙනා වූ සිරිවර්ධන මුදියන්සේලාගේ පබල සංජය සිරිවර්ධන, කෙමාකුඹුරේ ගෙදර ජයතිලක, පී.වී.ලාල් සෝමචන්ද්‍ර යන අයවළුන්ගෙන් ද සාක්ෂි ලබා ගන්නා ලදී.

'සංජය සිරිවර්ධන' යන ජේලර්වරයා ඉහත කී සිද්ධියට අදාළව ලබා දුන් සාක්ෂිය වූයේ හිටපු රාජ්‍ය අමාත්‍යවරයා එළියට පැමිණි රැඳවියන් සමග විනාඩි 15ක් පමණ කථා කර 'F' අංශයට යාමට පෙර හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් එක් එක් පුද්ගලයින්ගෙන් තොරතුරු විමසනවා මෙන්ම , පළමුවෙනියට සිට ගෙන සිටි පුද්ගලයාගෙන් එසේ තොරතුරු විමසූ පසුව ඔහු බිම වාඩි වෙනවා ද දුටුව බවත්, ඉන් අනතුරුව එළියේ සිටි තවත් රැඳවියෙකු ද බිම වාඩි වී සිටිනවා දුටු බවටත්ය. කෙසේ වුව ද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ වටේට ගොඩ පිරිසක් සිටීම නිසාත්, සාක්ෂිකරු අඩි 20ක් පමණ දුරින් සිටිය නිසාත්, මෙසේ වාඩි වී සිටි දෙදෙනාගේ පස්ස බිම තියා ගෙන ද, නැද්ද යන්න නිරීක්ෂණය කිරීමට නොහැකි වූ බවට සාක්ෂියක් ලබා දී ඇත.

එසේ ම හිටපු රාජ්‍ය අමාත්‍යවරයා 'F' අංශයෙහි විනාඩි 5-10ක් අතර කාලයක් ගත කර ආපසු එළියට පැමිණෙන තෙක් බිම වාඩි වී සිටි දෙදෙනා සිට ගත් බවට නිරීක්ෂණය නොකළ බවට මෙන් ම, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා එළියට පැමිණ ද රැඳවියන් සමග නැවතත් කථා කරනු දුටුව ද, එසේ කී දේ නැසුණු බවට ද, මෙම අවස්ථාවේ දී අනෙකුත් රැඳවියන් සිට ගෙන සිටියා ද, වාඩි වී සිටියා ද යන්න කීමට නිවැරදි මතකයක් නොමැති බවට ද, මෙම අවස්ථාවේ දී සාක්ෂිකරු ගොඩක් දුරින් සිටිය නිසා ද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා වටේට බොහෝ පිරිසක් රැස්ව සිටි නිසා ද, සියළු ම දේ නිරීක්ෂණය කිරීමට හැකියාවක් නොලැබුණු බවට ද සාක්ෂියක් ලබා දී ඇත.

ඒ අනුව, මෙම සාක්ෂිකරුගෙන් ද වාඩි වී සිටි දෙදෙනා වෙත හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් ගිනි අවියක් කිසියම් හෝ අවස්ථාවක එල්ල කළේ නැතැයි කීමට ඔබට හැකියාවක් ඇද්ද? යනුවෙන් ප්‍රශ්න කළ විට දී 'නිශ්චිතව ම කියන්න බැහැ, මට හැමදේ ම නිරීක්ෂණය කරන්න හැකියාවක් තිබුණේ නැහැ' යනුවෙන් පැහැදිලි සාක්ෂියක් ලබා දී ඇත. එසේ ම හිටපු රාජ්‍ය අමාත්‍යවරයා බන්ධනාගාරයට ඇතුළු වූ අවස්ථාවේ දී පරීක්ෂාවට ලක් කිරීමක් සිදු කරනු නුදුටු බවට ද පවසා ඇත. (2021.10.08 වන දින සාක්ෂි - ප.ව.2.20 - 3 සිට 6 දක්වා පිටු)

මේ හැරෙන්නට 'කෙමාකුඹුරේ ගෙදර ජයතිලක' නැමැති ජේලර්වරයා ද ඉහත කරුණුවලට අදාළව ලබා දී තිබූ සාක්ෂිය වූයේ 'F' වාට්ටුවේ සිට එළියට රැගෙන විත් තිබූ රැඳවියන් සමගින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා කථා කරනු කම්බි වැට අසළ වූ ගේට්ටුව අසළ සිටියදී දුටුව ද, එම ස්ථානයට සාක්ෂිකරු යන විට විනාඩි 10ක් පමණ පරක්කු වී තිබූ බවටයි. ඊට හේතුව ලෙසට , හිටපු රාජ්‍ය අමාත්‍යවරයා බන්ධනාගාරයට ඇතුළු වීම සඳහා විවෘත කළ ගේට්ටු වැසුවා ද යන්න නිරීක්ෂණය කිරීමේ රාජකාරිවල යෙදී සිටීම යැයි පවසා ඇත.

මේ හැරෙන්නට, සාක්ෂිකරු සිටියේ කම්බි වැට තිබෙන ගේට්ටුව ළඟ බැවින්, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සිරකරුවන්ගෙන් අහපු ප්‍රශ්න අතරින් නම, ගම, කරපු වරද කුමක්ද යන්න ඇසුනද, සමහර ප්‍රශ්න නැසුනු බවට ද පවසා ඇත. තව ද, එළියට ගෙන තිබූ රැඳවියන් 10 දෙනාගෙන් එක් අයෙකු බිම ආසනයක වාඩි වී සිටින අයුරින් වාඩි වී සිටින බවට දුටු මුත්, ඔහු පස්ස බිම ගැවෙන අන්දමට සිටිනු නුදුටු බවත්, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා 'F' වාට්ටුවට යන අවස්ථාවට පෙර එතනින් සාක්ෂිකරු පිටව ගිය බැවින් වෙනත් කිසි දෙයක් ඔහු නුදුටු බවටත් සාක්ෂියක් ලබා දී ඇත. (2021.10.08 වන දින සාක්ෂි - පෙ.ව.9.00 - 4 සහ 5 පිටු)

ඉහත කී ජේලර්වරු දෙදෙනාගේ සාක්ෂි විමසා බැලීමේ දී ද පැහැදිලි වන්නේ, ඉහතින් මා පැහැදිලි කර දී ඇති අන්දමට රැඳවියන් විසින් ලබා දී ඇති සාක්ෂිවල විශ්වසනීයත්වය හීන නොවන බවටත්, රැඳවියන්ගේ සාක්ෂිවල ඒකාකාරීභාවයට පළුද්දක් වී නොමැති බවටත් ය.

කෙසේ වුව ද, 'පුංචිවිදානලාගේ ලාල් සෝමචන්ද්‍ර' නැමැති ජේලර්වරයා ලබා දුන් සාක්ෂිය වී තිබුණේ 2021.09.12 වන දින හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සමග බන්ධනාගාරයේ සංචාරය කිරීම සඳහා හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සමගින් ඉදිරියෙන් ම ගියේ අධිකාරිවරයාත්, ප්‍රධාන ජේලර් මහතාත්, ආරක්ෂක නිලධාරිවරුනුත් බවත්, සාක්ෂිකරු සිටියේ අඩි 10ක් පමණ පිටි පස්සෙන් බවටත් ය. තව ද, එළියට පැමිණි රැඳවියන් සමගින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා කථා කරද්දී සාක්ෂිකරු හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට අඩි 15ක් පමණ දුරින් සිටි බව ද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා රැඳවියන් එක් එක්කෙනා සමගින් කථා කරන අයුරුත්, "ඔයාලා බොරු කියන්න එපා, ඇත්ත කියන්න" කියා කියනු ඇසුණු බවට ද, රැඳවියන් දෙදෙනෙක් බිම ඉඳ ගෙන සිටිනු දුටු බවට ද, රැඳවියන් සමග කථා කළ පසුව 'F' වාට්ටුව තුළට ගිය බවට ද පවසා ඇත.

මෙම කමිටුව ඉදිරියෙහි කිසිදු සාක්ෂිකරුවෙකු ලබා නොදුන් සාක්ෂියක් ද මෙම සාක්ෂිකරු ලබා දෙමින්, බිම වාඩි වූ රැඳවියන් දෙදෙනා එසේ වාඩි වූයේ හිට ගෙන ඉන්න බැරි නම් වාඩි වෙන ලෙසට අතරමැද දී හඳුනා ගැනීමට නොහැකි වූ කවුරු හෝ කී නිසා යැයි ද, එය ඔහුට ඇහුන බවට ද පවසා ඇත.

මේ අනුව, රැඳවියන් සමගින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයා කථා කරමින් සිටිය දී එසේ වාඩි වීමට ඇමතිවරයාට ඉහළින් රැඳවියෙකුට අණක් දීමට වෙනත් කවුරු හරි සිටියේ දැයි මෙම සාක්ෂිකරුගෙන් විමසන ලද අතර, ඊට, එබඳු අයෙක් නොසිටි බවටත්, සිටි එකම පුද්ගලයා හිටපු

රාජ්‍ය අමාත්‍යවරයා පමණක් බවටත්, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා කථා කරද්දී කථා කළේ ප්‍රධාන ජේලර්වරයා පමණක් බවටත්, ජේලර්වරයා සමගින් සාක්ෂිකරු අවුරුදු 3ක් පමණ එකට රාජකාරි කිරීම මත ඔහුගේ කට හඬ ද හඳුනා ගැනීමට හැකියාව තිබුණ ද, රැඳවියන්ට අපහසු නම් වාඩි වෙන්න යැයි කී කෙනා කවුදැයි යන්න හඳුනා ගන්න අපහසු වූ බවටත් පවසමින්, ඔහු ලබා දුන් සාක්ෂිය සත්‍යයක් බවට පිළි ගැනීමට අපොහොසත් වන බවටත් සාක්ෂිකරු ම පිළි ගන්නා ලදී. (2021.10.08 වන දින සාක්ෂි - පෙ.ව.11.15 - 4 සිට 7 දක්වා පිටු)

එසේ ම හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ද, මෙම කමිටුව ඉදිරියෙහි සාක්ෂි ලබා දුන් අවස්ථාවේ දී කිසියම් අවස්ථාවක කිසිදු රැඳවියෙකුට වාඩි වී සිටීමට තමන් විසින් නොකී බවටත්, ඔවුන් කිසිවෙකු වාඩි වීමේ හෝ දණ ගැසීමේ සිද්ධියක් නොවූ බවටත් පවසා ඇත. (2021.10.18 වන දින සාක්ෂි - 11 පිටුව)

මේ හැරෙන්නට, 'ලාල් සෝමචන්ද්‍ර' නැමැති සාක්ෂිකරු විසින්, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා 'F' වාට්ටුවට ගිය පසුව ඔහු එළියේ සිටි බවට පැවසූ හෙයින්, "ඇමතිවරයා එන කොට ඉහත කී දෙදෙනා වාඩි වෙලා ද සිටියේ?" යනුවෙන් විමසා ඇත. ඔහු විසින් ඊට පවසා ඇත්තේ ඇමතිවරයා ගිය පැත්ත බැලුව නිසා රැඳවියන් වාඩි වෙලා ඉන්න ගැන බලන්න බැරි වූ බවත්, ඒ ගැන ඔහුට මතකයක් නොමැති බවත්, මතකයේ ඇත්තේ 'F' වාට්ටුවේ සිට අමාත්‍යවරයා එන විටත් මොවුන් බිම වාඩි වී සිටි බවත් පමණි.

එනමුදු මෙම සාක්ෂිකරුගෙන් වැඩිදුර ප්‍රශ්න කරමින් 'F' වාට්ටුව ඇතුළට ගිය හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට ආරක්ෂාව ලබා දීම සඳහා එම ස්ථානයෙහි ඕන තරම් නිලධාරීන් සිටිය බැවින් ද, මෙම අවස්ථාවේ දී සාක්ෂිකරු මිදුලේ සිටි බැවින් ද, සාක්ෂිකරු සිදු කළ යුතුව තිබුණේ ඇතුළට ගිය අමාත්‍යවරයා දෙස බැලීම නොව, මිදුලේ සිටි රැඳවියන් දෙස බැලීම බවත්, ඒ අනුව බිම

වාඩි වී සිටි දෙදෙනා ගැන අවධානය සාක්ෂිකරුට යොමු කළ යුතුව තිබුණු බවටත් පිළි ගන්නා ලදී. 'F' වාට්ටුව තුළ හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විනාඩි 10ක්, 15ක් පමණ රැඳී සිටි බවට ද මෙම සාක්ෂිකරු පිළි ගෙන ඇත. (2021.10.18 වන දින සාක්ෂි - පෙ.ව.11.15 - 7 සහ 8 පිටු)

මෙම කරුණු සියල්ල එකට ගෙන සළකා බැලීමේ දී, 'F' වාට්ටුව අසළ මිදුලේ රැඳවියන් සමග රැඳී සිටි ඉහත කී ජේලර් ලාල් සෝමචන්ද්‍රට 'වාඩි වුනා' යයි පවසන රැඳවියන් දෙදෙනා කෙරෙහි අවධානයක් මෙකී විනාඩි 10-15 තුළ දී නොතිබුණා යැයි ද, ඒ ගැන කීමට මතකයක් නැතැයි ද පැවසීම, සැබැවින් ම 'විය නොහැක්කක්' ලෙසට සළකා බැලිය හැක. මෙම කරුණත්, මෙම රැඳවියන් වාඩි වුනේ හිටපු රාජ්‍ය අමාත්‍යවරයා කථා කරමින් සිටිය දී යමෙකු විසින් "හිට ගෙන ඉන්න බැරි නම් වාඩි වෙන" ලෙස කළ දැනුම් දීමක් අනුව යැයි පවසන ලද සාක්ෂිය ද සත්‍යයක් බවට පිළි ගැනීමට අපහසු බවට සාක්ෂිකරු විසින් ම පිළි ගෙන තිබීමත් සළකා බැලීමේ දී , හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ අනුරාධපුර බන්ධනාගාර සංචාරය සම්බන්ධව සැබැවින් ම සිදු වූ කරුණු වසන් කරමින්, සිදු නොවූ කරුණු සිදු වූ ලෙසට අසත්‍යයක් ගොතමින් සාක්ෂියක් දෙනු ලබන සාක්ෂිකරුවෙකු ලෙසට මෙම සාක්ෂිකරුව නිරීක්ෂණය කරමි. මේ අනුව මෙම සාක්ෂිකරු ලබා දුන් සාක්ෂිය කෙරෙහි විශ්වාසය නොතබමි.

එපමණක් ද නොව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ අනුරාධපුර බන්ධනාගාර සංචාරයෙන් පසුව, ත්‍රස්තවාදී පනත යටතේ අනුරාධපුර බන්ධනාගාරයෙහි රැඳී සිටි රැඳවියන් පීඩාවට සහ කළකිරීමට පත්ව ඇති බවට මාධ්‍ය මගින් මෙම සාක්ෂිකරුට දැන ගැනීමට හැකියාවක් තිබුන බවට ද, බන්ධනාගාරයෙහි සිර මැදිරි ඇරීමේ සහ වැසීමේ රාජකාරි සිදු කිරීමේ හේතුවෙන් මෙකී රැඳවියන්ව නිතර මුණ ගැසුණ බවටද පිළිගෙන ඇත. එසේ වුවද, මෙකී රැඳවියන්ගෙන්, එසේ මාධ්‍ය මගින් පළ වූ කරුණුවල

පදනම සහ සත්‍ය තත්වය කුමක්ද යන්න සොයා බැලීමට උත්සාහයක් නොකළ බවට පවසා ඇත.

සාමාන්‍යයෙන් යමෙකු විසින් යම් කරුණක් සොයා බලන්නේ යමක සත්‍යතාවයක් දන්නේ නැත්නම් පමණි. සියැසින් ම දුටු කරුණක් තවදුරටත් සොයා බැලීමේ අවශ්‍යතාවයක් පැන නොනගී. මේ අනුව මෙම සාක්ෂිකරුගේ මෙකී පසු හැසිරීම විමසා බැලීමේ දී ද පෙනී යන්නේ, මාධ්‍යවලින් දැන ගත් දේ සොයා බැලීමට වෙහෙසක් දරා නැත්තේ එහි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට ඔහුට හේතුවක් නොතිබූ නිසා බවයි. (2021.10.07 වන දින සාක්ෂි - 3 පිටුව)

හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ අනුරාධපුර බන්ධනාගාර සංචාරය සම්බන්ධව වූ කරුණු දකින්නට ඇති වෙනත් අයවළුන් කවුදැයි යන්න විමසා බැලීමේ දී 'F' අංශයෙහි මිදුලෙහි කොටසක් දැකිය හැකි අඩි 60ක් පමණ දුරින් පිහිටි, මෙම අවස්ථාවේ දී මුළුතැන් ගෙයි වැඩ කරමින් සිටි රැඳවියන් දෙදෙනෙක් ගේ තොරතුරුද, අඩි 100, අඩි 110ක් පමණ දුරින් පිහිටි මැහුම් අංශයෙහි රැඳවියන් පස් දෙනෙකු ද සිටින බවට කරුණු අනාවරණය විය.

ඒ අනුව බන්ධනාගාරයේ වසරක සිර දඬුවමක් විඳින මුළුතැන් ගෙයි සිටි 'ෂිහාබ්දීන් අෆ්රාස්' නැමැත්තාව 2021.10.07 වන දින මා සාක්ෂියට කැඳවිය. ඔහු පවසා සිටියේ හිටපු රාජ්‍ය අමාත්‍යවරයා බන්ධනාගාරයට පැමිණි අවස්ථාවේ දී කුස්සියේ සිටියේ ඔහුත් 'කුස්සි බාස් ගාමිණී' යන අයත් පමණක් බවත්, මෙම අවස්ථාවේදී ඔවුන් දෙදෙනා ම කුස්සිය ඇතුලේ වැඩ කරමින් සිටි හෙයින් සහ ඕනකමින් බැලුවොත් පමණක් පෙනෙන හෙයින් ඔවුන් දෙදෙනා ම හිටපු රාජ්‍ය අමාත්‍යවරයා කළ දේ සොයා නොබැලුව බවත්, ඊට හේතුවක් ද නොවූ බවටත් ය. එසේ ම කිසිවක් නොඇසුන බවට ද සාක්ෂියක් දෙන ලදී. (2021.10.07 වන දින සාක්ෂි - පෙ.ව.10.30 - 1 සහ 2 පිටු)

'ගාමිණී' යන තැනැත්තාව ද, මෙම කමිටුව ඉදිරියට කැඳවා තොරතුරු විමසීමේ දී ඔහු සිද්ධියේ කිසිවක් නුදුටුව බවටත්, නොඇසුණු බවටත් පැවසූ හෙයින් ඔහුගෙන් සාක්ෂි ගැනීම අනවශ්‍ය කාලයක් මිඩංගු කිරීමක් බවට තීරණය කරන ලදී.

එමෙන් ම, මැහුම් අංශයෙහි රඳවන ලද සිරකරුවෙකු වූ හෙට්ටිආරච්චිලාගේ සුජිත් රෝහණ නැමැත්තාගෙන් ද සාක්ෂි ලබා ගත් අවස්ථාවේ දී ඔහු පවසා සිටියේ ඔහුත් සමග තවත් හතර දෙනෙක් මෙම සිර මැදිරියෙහි රඳවා සිටින මුත්, මෙම සිද්ධිය සිදු වූ අවස්ථාවේ දී සිර මැදිරි වසා තිබූ හෙයින්, සිර මැදිරියේ දොර ළඟට පැමිණ කම්බි දැලෙන් බැලුව ද පෙනෙන්නේ එක පැත්තක අඩි 2-3 ක ප්‍රමාණයක් බවත්, එහෙයින් සිද්ධිය හරිහැටි නිරීක්ෂණය කළ නොහැකි වූ බවටත් ය. (2021.10.06 වන දින සාක්ෂි - ප.ව.3.00, 2 සහ 3 පිටු)

මේ අනුව නිවැරදිව සිදු වූ සිද්ධීන් නිරීක්ෂණය කිරීමට හැකියාවක් නොපවතින, කියන දේවල් ද නොඇසුණ අයවළුන් සාක්ෂියට කැඳවීම තුළින් නිවැරදි තොරතුරු අනාවරණය කර ගත නොහැකි බවට පෙනී ගිය හෙයින්, අනිත් රැඳවියන් තිදෙනාගෙන් සාක්ෂි මෙහෙය වීමක් සිදු නොකරන ලදී.

## d) පීඩාවකට ලක් වූවා යැයි පවසන රැඳවියන් විසින් සිද්ධියට අදාළව පැමිණිල්ලක් ඉදිරිපත් කර නොතිබීම

මෙම සිද්ධියට අදාළ තොරතුරු රැස් කිරීමේ දී, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගෙන් පීඩාවට ලක් වුනා යැයි පවසනු ලබන රැඳවියන් විසින් අනුරාධපුර බන්ධනාගාරයෙහි කිසිදු නිලධාරියෙකු වෙත සිද්ධියට අදාළව පැමිණිල්ලක් ඉදිරිපත් කර නොතිබූ බවටත්, ඔවුන් මුහුණ පෑ සිද්ධිය පලමුවෙන් විස්තර කර තිබුනේ, සිද්ධිය සම්බන්ධව විමසීම් කිරීමට අනුරාධපුර බන්ධනාගාරයට 2021.09.15 වන දිනයේ දී පැමිණි මානව හිමිකම් කොමිසමේ නිලධාරීන් තිදෙනෙකුටත්, අනතුරුව, 2021.09.17 වන දින පැමිණි බන්ධනාගාර කොමසාරිස් කේ.ඒ.එස්.කොඩිතුවක්කු මහතාටත්, බවට කරුණු අනාවරණය විය. (E සහ F ලේඛන)

එසේ වුව ද, ඉහතින් මා විස්තර කර ඇති පරිදි, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ ක්‍රියා කළාපයන් නිසා හිංසනයට සහ පීඩාවට පත් වූවා යැයි දක්වා සිටි, 'F' වාට්ටුවෙහි සිට එළියට රැගෙන ගිය රැඳවියන් නැවතත් 'F' අංශයට පැමිණි අවස්ථාවේ දී ම, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ ක්‍රියා කළාපය සම්බන්ධව එකී රැඳවියන් තුළ නොසන්සුන්තාවයක් නිරීක්ෂණය කළ බවටත්, ඇමතිවරයා ඔවුන්ට පිස්තෝලයක් එල්ල කොට තර්ජනය කළ බවට කියනු ඇසුනු බවටත්, 'F' අංශයෙහි රාත්‍රී රාජකාරි කළ බන්ධනාගාර නියාමක හේමපාලගේ ප්‍රියන්ත කුමාර දිසානායක නැමැති බන්ධනාගාර නියාමකවරයාගේ සාක්ෂි මගින් අනාවරණය වන මුත් (2021.10.25 වන දින සාක්ෂි - ප.ව.1.30 – 1 සහ 4 පිටු) එකී නිළධාරියා විසින් එම නිරීක්ෂණයන් සහ නොසන්සුන්තාවයන්, විනය අංශයට හෝ ඉහළ නිලධාරියෙකුට පැමිණිලි කර නැත. මෙම නිලධාරියාගෙන් ඊට හේතු විමසූ විට දී පවසා සිටියේ, එසේ පැමිණිලි නොකලේ පසු දින උසාවි රාජකාරි සඳහා ගිය නිසා බවට ය. (2021.10.25 වන දින සාක්ෂි - ප.ව.1.30 - 5 පිටුව)

මේ අනුව හෙළිවන්නේ, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාත් සමග සාකච්ඡාවකට ගිය රැඳවියන් පිරිසක් පීඩාවට ලක් වූ බවට ඒ ආසන්නතම අවස්ථාවේ දී එහි සිටි බන්ධනාගාර නියාමකවරයාට පවා දැන ගන්නට ලැබුන ද, කිසිදු පියවරක් නොගෙන නිහඬව සිටි බවටයි.

එපමණක් ද නොව, විනය අංශයෙහි රාජකාරි කරනු ලබන ජේලර් 'ධනසේකර මුදියන්සේලාගේ අළුත්ගම ගෙදර ජයන්ත ඉඳුනිල් කුමාර ධනසේකර' විසින් සාක්ෂි දී කියා සිටියේ, රැඳවියන්ගේ පැමිණිලි, විනය අංශය හරහා ඉදිරිපත් කරන මුත්, බන්ධනාගාර නිලධාරීන් ඉදිරිපිට කිසියම් රැඳවියෙකුට හෝ රැඳවියන්ට බරපතල ගණයේ අපරාධයක් සිදු කළ විට ප්‍රධාන ජේලර්වරයා හෝ බන්ධනාගාර අධිකාරිවරයා මැදිහත් වී විසඳන බවත්, එදිනෙදා සුළු පැමිණිලි විනය අංශය හරහා යන බවටත් ය. (2021.10.25 වන දින සාක්ෂි - ප.ව.12.45 - 1 සහ 2 පිටු)

'F' අංශයෙහි සිටි රැඳවියන් සමගින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ හමුවීම සිදු වී තිබුනේ, අනුරාධපුර බන්ධනාගාරයෙහි ප්‍රධානීයාත් සහ දෙවෙනියට සිටි ප්‍රධානියාත් වූ පිළිවෙළින් සහකාර බන්ධනාගාර අධිකාරිවරයාත්, ප්‍රධාන ජේලර්වරයාත් ඉදිරිපිටදීය. මෙම නිලධාරීන් විසින් ඔවුනට සිදු වූ හැම සිද්ධියක් ම නිරීක්ෂණය කිරීමට හැකියාවක් නොලැබුණා යැයි පැවසුව ද, මෙම නිලධාරීන් ඒ ආසන්නයෙහි ගැවසීම සිදු කර ඇත. මෙකී නිලධාරීන් දෙදෙනා එම ස්ථානයෙහි රැඳී සිටි බවට මෙකී රැඳවියන් දුටු බවට ද රැඳවියන් සාක්ෂියක් ලබා දී ඇති අතර, එම කරුණ මෙම නිලධාරීන් සහ/හෝ හිටපු රාජ්‍ය අමාත්‍ය රත්වත්ත මහතා ද ප්‍රතික්ෂේප නොකරයි.

මෙකී රැඳවියන් බන්ධනාගාරයෙහි රඳවා සිටින අයවළුන් වන බැවින්, පැමිණිලි ඉදිරිපත් කිරීමට පොලිසියට යාමට ද ඔවුන්ට හැකියාවක් නොමැති බවට සහකාර බන්ධනාගාර අධිකාරීවරයා ද පිළි ගෙන ඇති අතර, පැමිණිලි ලැබෙන්නේ ඔවුන් ඉදිරියෙහි සිදු වූ ඒවා නොවන බවටද, ඔවුන්

ඉදිරියෙහි සිදු වූ ඒවා ගැන ඔවුන් සොයා බලන බවටද වැඩිදුරටත් පිළි ගෙන ඇත. (2021.10.24 වන දින සාක්ෂි - ප.ව.11.00 - 9 පිටුව)

තවද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් 'F' වාට්ටුවේ සිට එළියට කැඳ වූ රැඳවියන් දෙදෙනෙකුව දණ ගස්වා පිස්තෝලයක් එල්ල කළ බවට කට කථාවක් පවතින බවට පත්තරවලිනුත් දැක්ක ද, එහි සත්‍යතාවය සොයා බැලීමට පියවරක් නොගත් බවට අනුරාධපුර සහකාර බන්ධනාගාර අධිකාරිවරයාත්, ප්‍රධාන ජේලර්වරයා පිළි ගෙන ඇත. එසේ පියවර නොගැනීම සම්බන්ධව ප්‍රධාන ජේලර්වරයාගෙන් ප්‍රශ්න කිරීමේ දී ඔහු පවසා සිටියේ, 2021.09.12 වන දින වූවා යැයි පවසන සිද්ධිය දිනකට, දෙකකට පසුව වගේ මාධ්‍යයෙන් දැන ගත් වහාම රැඳවියන්ගෙන් විමසූ විට, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් දණ ගස්වා රැඳවියන් බය කළ බවට දැන ගත්ත ද, 2021.09.15 වන දින සවස 2.00ට මානව හිමිකම් කොමිසමේ නිලධාරීන් ද, 2021.09.17 වන දින බන්ධනාගාර කොමසාරිස් ද පැමිණ පරීක්ෂණයක් කළ හෙයින්, ඒ ගැන සොයා බැලීමට උනන්දු නොවූ බවයි. (2021.10.25 වන දින සාක්ෂි - පෙ.ව.9.30 - 12 පිටුව)

එනමුදු, ඉහතකී කරුණු සලකා බලන කල, අනුරාධපුර බන්ධනාගාරයෙහි ප්‍රධානියා වූ සහකාර බන්ධනාගාර අධිකාරිවරයාත්, දෙවැනියට ප්‍රධානියා වූ ප්‍රධාන ජේලර්වරයාත් ඇතුළුව තවත් බන්ධනාගාර නිලධාරීන් කිහිපදෙනෙකුම සහභාගිවී සිටියදී ඇතිවී තිබූ මෙම සිද්ධිය, තවදුරටත් බන්ධනාගාර අධිකාරිවරයාට සහ/හෝ ප්‍රධාන ජේලර්වරයාට යම් ආකාරයක පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් රැඳවියන්ට පැන නොනැගුන බවත්, ඊට අදාලව නොපමාව නිසි පියවර ගැනීමේ සම්පූර්ණ වගකීම සහකාර බන්ධනාගාර අධිකාරිවරයාටත්, ප්‍රධාන ජේලර්වරයාටත් තිබූ මුත්, 'ස්වාධීන පරීක්ෂණය' ඉදිරියට තබා නිහඬ වී ඇති බවටත් තොරතුරු අනාවරණය වෙයි.

e) රැඳවියන්ගේ චෝදනාවන්ට අදාලව හිටපු රාජ්‍ය අමාත්‍යවරයා දැක්වූ කරුණු

අනුරාධපුර බන්ධනාගාරය සංචාරය කිරීමට ගිය අවස්ථාවේ දී 'F' වාට්ටුව අසලදී, ත්‍රස්තවාදී පනත යටතේ සිර සහ සැකකරුවන් රඳවා සිටින බවට අනාවරණය වූයෙන්, සහ ත්‍රස්තවාදී පනත යටතේ රඳවා සිටින රැඳවියන් හැකි තාක් ප්‍රමාණයක් නිදහස් කිරීමට ද තීරණයක් ගෙන තිබූ නිසාත්, F' වාට්ටුව අසල වූ මිදුලට ඔවුන්ව ඉදිරිපත් කරන ලෙසට දැනුම් දුන් බව ද, එසේ රැඳවියන් ඉදිරිපත් වූ පසුව, එක් එක්කෙනාගේ නඩු සම්බන්ධව විමසමින් "කොච්චර කාලයක් සිරගතව සිටියාද" යන්න මෙන් ම 'කරපු වරදවල්' විමසීම සිදු කළ බවට ද පවසමින් සාක්ෂියක් ලබා දී ඇත. (2021.10.18 වන දින සාක්ෂි - 10 සහ 11 පිටු)

එසේ වුව ද, රැඳවියන්ව දණ ගැස්වීමක් හෝ වාඩි කරවීමක් සිදු නොකළ බවටත්, ගිනි අවියක් බන්ධනාගාරය තුළට රැගෙන යාම හෝ රැඳවියන් වෙත ගිනි අවියක් එල්ල කිරීම සිදු නොකළ බවටත්, 'ඇත්ත කියන්න' කියා බලපෑමක් සිදු නොකළ බවටත් පවසමින් එබඳු චෝදනාවක් රැඳවියන් විසින් තමන්ට එරෙහිව එල්ල කරනු ලබන්නේ වෙනත් ස්ථානවලට මාරු කර ගැනීම සඳහා යැයි තමා විශ්වාස කරන බවත්, ඒ සඳහා රැඳවියන් විශාල උත්සාහයක් සහ කාලයක් තිස්සේ දරා තිබූ බවටත් පවසා ඇත.

මේ හැරෙන්නට රැඳවියන්ට නිදහස ලබා දීම සොයා බැලීම චේතනාව වුවත්, එය රැඳවියන්ට නොපැවසූ බවට ද, ජනාධිපති තුමා ගැන කිසිදු වචනයක් නොකී බවට ද සඳහන් කර ඇත. (2021.10.18 වන දින සාක්ෂි - 14 සහ 15 පිටු)

හිටපු රාජ්‍ය අමාත්‍යවරයා සඳහන් කරන පරිදි , රැඳවියන්ව මිදුලට රැගෙන ඒමට දන්වා, එක් එක්කෙනාගෙන් නඩු සහ වරදවල් ගැන විමසීම සිදු කළ බවට මෙම කමිටුව ඉදිරියෙහි මෙහෙය වූ සාක්ෂි මගින් තොරතුරු

අනාවරණය වුව ද, සෙසු කිසිදු කරුණක් කිසිදු සාක්ෂියක් මගින් තහවුරු වී නැත.

අනුරාධපුර සහ වැලිකඩ බන්ධනාගාරවල සිදු වූ සිද්ධීන්වලට අදාළව යම් සාක්ෂියක් හෝ ලේඛනයක් ඇත්නම් මෙම කමිටුව වෙත ඉදිරිපත් කිරීමට මා විසින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට නිකුත් කරන ලද 'L' දරණ ලේඛණයෙහි දැක්වෙන පරිදි දැනුම් දී තිබුනද, හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ වාචික සාක්ෂිවලට අමතරව කිසිදු වාචික සාක්ෂියක් සහ/හෝ ලේඛනමය සාක්ෂියක් ඉදිරිපත් කර නැත.

'F' වාට්ටුව අසල වූ මිදුලට රැගෙන ගොස් තිබූ රැඳවියන් පමණක් නොව, 'F' වාට්ටුවෙහි 5 වන සිර මැදිරිය තුළ සිටිය දී හිටපු රාජ්‍ය අමාත්‍යවරයා මුණ ගැසී තිබූ ඉහත කී 'රසික නුවන් සංජීව' පවා අමාත්‍යවරයා තමන් සමගින් සුහදව කථා කරමින් ඔහුගේ නඩුව ගැන විමසා, සොරකම් නඩුවක් තිබෙන බවට පැවසුව විට දී "ඇයි හොරකම් කළේ" යැයි ද විමසමින්, සහන කාලයක් හම්බ වෙන බවටත්, ඉස්සරහට සමාව ලැබෙන බවටත් දැනුම් දුන් බවට සාක්ෂියක් ලබා දී ඇත. (2021.10.06 වන දින සාක්ෂි - ප.ව.12.00 - 2 පිටුව) මේ අනුව රැඳවියන් සිදු කර තිබූ වරදවල් දැනගැනීමේ උනන්දුවක් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට මෙදින තිබුන බව අනාවරණය වෙයි.

විවිධ හේතු මත හිටපු රාජ්‍ය අමාත්‍යවරයාගේ අතේ ගිනි අවියක් තිබෙන බව නිරීක්ෂණය කිරීමට අපහසු වූවා යැයි සාක්ෂි ලබා දී ඇති 'ප්‍රධාන ජේලර්වරයා' පවා 'ජනාධිපතිවරයාට පවසා නඩු කටයුතු ඉක්මණින් අවසන් කර දෙන්න' කටයුතු කරන බවට හිටපු රාජ්‍ය අමාත්‍යවරයා රැඳවියන්ට මුලින් ම කියනු ඇසුනු බවට පැහැදිලි සාක්ෂියක් ලබා දී ඇත. (2021.10.25 වන දින සාක්ෂි - 11 පිටුව)

මීට අදාළව සහකාර බන්ධනාගාර අධිකාරිවරයා ද සාක්ෂි දෙමින් ප්‍රධාන ජේලර් විසින් “රාජ්‍ය අමාත්‍යවරයා ඇවිල්ලා තිබෙන්නේ රැඳවියන්ගේ සමාව සම්බන්ධව කටයුතු කරන්නත්, රැඳවියන්ගේ ගැටළු සම්බන්ධව සොයා බලා ජනාධිපති තුමාට දන්වා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමටත්” කියා කියනවා මතකයක් ඇති බවට පවසා ඇත. (2021.10.24 වන දින සාක්ෂි - 5 පිටුව) . ඒ අනුව, එබදු දැන්වීමක් රැඳවියන්ට සිදු කිරීමට , ප්‍රධාන ජේලර්ට හිටපු රාජ්‍ය අමාත්‍යවරයා විසින් එබන්දක් පවසා තිබිය යුතු බවට පෙනී යයි.

ඉහත සාක්ෂිත්, රැඳවියන් ලබා දී ඇති සාක්ෂිත් සළකා බැලීමේ දී, රැඳවියන්ට නිදහස ලබා දීම සම්බන්ධව හෝ ජනාධිපති තුමා ගැන හෝ කිසිවක් පැවසුවේ නැතැයි හිටපු රාජ්‍ය අමාත්‍යවරයා ලබා දී ඇති සාක්ෂි, සත්‍යයක් බවට හෝ ‘විය හැක්කක්’ නොවේ.

එසේම, ‘F’ වාට්ටුව අසල වූ මිදුලට රැගෙන ගොස් තිබූ රැඳවියන් වෙත ‘නිදහසේ සහනය’ රැගෙන පැමිණි බවට පෙන්වා දුන් ‘හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට’ එරෙහිව, වෙනත් බන්ධනාගාරයකට යාමේ අරමුණ සහිතව රැඳවියන් කුමන්ත්‍රණයක් දියත් කිරීමට පෙළඹී තිබූ බවටද නිරීක්ෂණය නොවේ.

රැඳවියන්ගේ නඩු කටයුතුවලට 'සහනයක් ලැබෙයි කියා සිතුව නිසා රැඳවියන් සතුටු වූ බවත්, අසත්‍ය චෝදනාවක් ගෙතීමට තරම් හේතුවක් රැඳවියන්ට තිබුණ බවට නිරීක්ෂණය කළ නොහැකි වූ බවටත්, සහකාර බන්ධනාගාර අධිකාරිවරයා මෙන්ම ප්‍රධාන ජේලර්වරයා ද පැහැදිලි සාක්ෂියක් ලබා දී ඇත. (පිළිවෙලින් 2021.10.24 වන දින සාක්ෂි - පෙ.ව.11.00 - 11 පිටුව) සහ (2021.10.25 වන දින සාක්ෂි - පෙ.ව.9.30 - 13 පිටුව)

තවද, අවම වශයෙන් අනුරාධපුර බන්ධනාගාරයෙහි රාජකාරි කරන කිසිදු නිලධාරියෙකුට එරෙහිව හෝ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් අනුරාධපුර බන්ධනාගාරයෙහි රැඳී සිටීමට නොහැකි බවට මෙම රැඳවියන් විසින් කටයුතු කර නොතිබූ බවට ද සාක්ෂියක් ලබා දී ඇත. (2021.10.25 වන දින සාක්ෂි - පෙ.ව.9.30 - 13 පිටුව)

ඉහතින් දක්වා ඇති සියළු ම සාක්ෂි සහ ලේඛන සළකා බැලීමේ දී, වෙනත් බන්ධනාගාරයකට යාමේ අරමුණ සහිතව , රැඳවියන් විසින් හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට' එරෙහිව, කුමන්ත්‍රණයක් දියත් කිරීමට පෙළෙඹී තිබූ බවට කිසිදු තොරතුරක් නිරීක්ෂණය නොවේ. මේ අනුව, හිටපු රාජ්‍ය අමාත්‍යවරයා පවසන අන්දමට, ත්‍රස්තවාදී පනත යටතේ රඳවා සිටි රැඳවියන්ගේ කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් වශයෙන්, සිදු නොවූ කරුණක් සිදු වූ ලෙසට අසත්‍යයක් ගොතා චෝදනා එල්ල කරන බවට ලබා දුන් සාක්ෂිය සත්‍යයක් බවට නිගමනයකට එළඹීමට කිසිදු තොරතුරක් අනාවරණය නොවන බවට තීරණය කරමි.

(සරෝජනී කුසලා වීරවර්ධන),

විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු,

ඒකපුද්ගල විමර්ශන කමිටුව.

**2021.11.24**